I think the whole world, not only Ceylon, will be grateful to him for his plan of free education in this country. We are now beginning to reap the real fruits of Dr. Kannangara's work as Minister of Education. When you see the thousands of boys and girls going to school early in the morning and returning after their lessons later in the day—wherever you go, whether it is to the big cities of Ceylon, the smaller cities of Ceylon or the villages, you see them going in their thousands—that is a thing that gives tremendous pleasure and joy, thanks to Dr. Kannangara's work, thanks to the solid fundations laid by him during the 16 years he was Minister of Education.

I can say that from the point of view of education we are one of the leading countries in the world. Our population is today about 85 per cent literate, and I do not think there are very many people under fifty years of age who are illiterate. When you go to the universities, when you go to the maha vidyalayas, when you go to the central schools which are a superior type of maha vidyalayas, when you go to the junior universities, you see that we are beginning to reap the fruits of his far-sighted vision and plan.

I do not want to make a long speech, but tribute must be paid to whom tribute is due. I attended the funeral last evening and I think it was one of the most largely attended funerals of any person who died in Ceylon, one of Ceylon's sons. Representatives of every community, of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන]

every religion, of every political party, were present to pay tribute, and what was most impressive was the presence of the youth—not the older people like ourselves, but the young boys and girls—who were there in their thousands. That was sufficient tribute to one of Lanka's greatest sons.

I support the Motion of Condolence moved by the Hon. Prime Minister and I wish that a copy of these proceedings be sent to his daughter, son and other relatives.

පූ. භා. 10.55

**ආර්. ජී. සේනානායක මයා.** (දඹදෙණිය)
(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)
(Mr. R. G. Senanayake—Dambadeniya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිරිපත් කර ඇති ශෝක ප්‍රකාශ යෝජනාව යටතේ මටත් වචන ස්වල්පයක් කථා කරන්නට ඉඩ දීම ගැන තමුන්නාන්සේට මගේ ස්තුතිය හිමි වෙනවා.

ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා දේශපාලනයට බැස්සේ යටත් විජිත තත්ත්වයේ ඇති භයානකකම හොඳින් අවබෝධ වූ යුගයකයි. 1915 දී අපේ රටේ ජනතාවට විඳින්නට සිදු වූ දුක් ගැහැට දුටු, ඒ වාගේම යටත් විජිතභාවයේ භයානක කම අවබෝධ කර ගත්, තරුණයන් කීප දෙනෙකු රටේ නිදහස උදෙසා කළ සටනේ ප්‍රතිඵල අප අද භුක්ති විඳිනවා. ඇත්තෙන්ම එදා පැවති ඒ භයානක තත්ත්වයෙන් රට ගළවා ගන්නට ඉදිරිපත් වූයේ ස්වල්ප දෙනයි. මගේ පියා සහ කන්නන්ගර මැතිතුමා ඉන් දෙදෙනකු බව මතක් කරන්නට කැමතියි. ඒ දෙදෙනා නිතර ඔවුනොවුන් ආශ්‍රය කළා. එකට කටයුතු කළා. ඒ දෙදෙනා සහයෝගයෙන් වැඩ කළ බව ඒ කාලයේ ළමයෙකු වශයෙන් සිටි මට හොඳට මතකයි. එදා ඒ උදවිය ගෙන ගිය සටනේ ප්‍රතිඵල වශයෙන් ව්‍යවස්ථාදායක මණ්ඩලයක අයිතිවාසිකම ලංකාවට ලැබුණා. මහජන නියෝජිතයන්ට මහජනයාගේ කැක්කුම භාර දෙන්නැයි කියමින් සටන් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් එදා ලංකාවට ව්‍යවස්ථාදායක මණ්ඩලයක් ලැබුණා.

එහෙත් ඒ ව්‍යවස්ථාදායක මණ්ඩලයට තේරුණු අයගෙන් වැඩි දෙනා සුද්දන් හා කළු සුද්දන් බව කිව යුතුයි. ඒ මණ්ඩලය තුළ ගැමි සිංහල හඬක් නඟන්නට කන්නන්ගර මැතිතුමා ක්‍රියා කළා. කන්නන්ගර මැතිතුමා තුළ සිංහල භාෂාව කෙරෙහි විශාල ලැදියාවක් තිබුණා. එපමණක් නොව, එතුමා මුළු ලංකාවම පිළිගත් කවියෙක්. ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ තිබුණු සුදු පරිසරය තුළ එතුමා දක්ෂ අන්දමින් සිංහල ගැමියන්ගේ අදහස් උදහස් මතු කළ බව අප හිතේ තබා ගන්නට ඕනෑ. එතුමා භාර ගත් අමාත්‍යාංශ දෙකක වැඩ කටයුතු කළ ආකාරයෙන් එතුමා දේශපාලනයට පිවිසුණේ යම් පරමාර්ථයක්, යම් අරමුණක් ඇතිව බව පෙනී ගියා. යම් යුක්තියක් ඉෂ්ට කිරීමේ අරමුණක් එතුමා තුළ තිබුණු බව පෙනී ගියා. ගැමි කැක්කුම විදහා පා සහනයක් ලබා ගන්නට එතුමාට වුවමනා කළා. ඒ පරමාර්ථය ඇතිව අධ්‍යාපන අංශයෙනුත් පළාත් පාලන අංශයෙනුත් ඉතාම වැදගත් සේවයක් එතුමා කළා.

අධ්‍යාපන අංශයෙන් එතුමා කළ සේවය ඉතිහාස ගත වන බවට කිසිම සැකයක් නැහැ. එතුමා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේදී දඹදෙනිය වැනි කොට්ඨාශවල තත්ත්වය ගැන මට මතකයි. ඒ කාලයේ දඹදෙනිය කොට්ඨාශයේ පාඨශාලා පහකට වඩා තිබුණේ නැහැ. ඒවාත් ආණ්ඩුවේ පාඨශාලා නොවෙයි; සමාගම්වලින් පාලනය වූ පාඨශාලායි. මුළු කොට්ඨාශයටම තිබුණේ ඒ සමාගම් පාඨශාලා පහ පමණයි. ඔය පාඨශාලා කීපයට ගිය උදවිය හැර ඉතිරි සියල්ලන්ටම අකුරක් ඉගෙන ගන්නට මගක් තිබුනේ නැහැ. එදා එවැනි තත්ත්වයක් තිබුණත් ආචාර්ය කන්නන්ගර මැතිතුමාගේ ප්‍රතිපත්තිත් ගෙන ගිය ව්‍යාපාරයත් හේතු කොට ගෙන අද මා නියෝජනය කරන කොට්ඨාශයේ පාඨශාලා හැට ගණනක් තිබෙනවා. බලන්න, ඇති වූ වෙනස. කන්නන්ගර මැතිතුමාගේ සේවයේ මහඟුකම පෙනෙන්නේ එක්තරා තත්ත්වයකින් නැත්නම් ක්‍රමයකින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මනින විටයි. ඒ කාලයේ උපාධියක් ලබා ගැනීම බොහොම අමාරු වැඩක්. මේ රටෙන් අපට උපාධියක් ලබා ගැනීමට මාර්ගයක් තිබුණේ නැහැ. උපාධියක් ලබා ගන්නට නම් රටින් පිටවිය යුතුව තිබුණා. නමුත්, සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා එදා තැබූ මුල් ගල නිසා අද මේ රටේ ඕනෑම පාඨශාලාවක, ඕනෑම දුප්පත් පැල්පතක සිටින ගැමි දරුවකුට වුවත් විශ්ව විද්‍යාලය දක්වා නොමිලයේ ඉගෙන උපාධියක් ලබා ගන්නට අවස්ථාව ලැබී තිබෙනවා.

කන්නන්ගර මැතිතුමාගේ අධ්‍යාපන සටන ගැන කල්පනා කර බලන විට අපට තවත් කාරණයක් පෙනෙනවා. සුද්දාගේ යුගයේදී, සුදු පරිසරයක් පැවති යුගයේදී දේශීය සංස්කෘතියට අනුකූලව සිංහලෙන් කල්පනා කර එවැනි වැදගත් සේවයක් කළ හැකි බව එතුමා පෙන්වා දුන්නා. කන්නන්ගර මැතිතුමාට අප විශේෂයෙන්ම හිස නැමිය යුත්තේ අන්න ඒ කාරණය නිසයි. සුද්දන්ට හැර වෙන කෙනෙකුට අධ්‍යාපනය වැනි බැරෑරුම් විෂයයක් භාර ගෙන වැඩ කරන්නට නුපුළුවන්ය යන හැඟීමක් ඒ කාලයේ තිබුණා. මෑතක්වන තෙක්ම ලංකාවේ අධ්‍යාපනය භාරව කටයුතු කළේ සුදු අධ්‍යක්ෂවරුන් බව තමුන්නාන්සේලා දන්නවා. එයින් පෙනෙන්නේ සුද්දන්ට හැර වෙනත් කෙනෙකුට අධ්‍යාපනය සකස් කරන්නට බැරිය යන හැඟීමක් තිබුණු බවයි. නමුත් කන්නන්ගර මැතිතුමා, "ගැමි මට අපේ ගැමි ජනතාවට අධ්‍යාපන ක්‍රමයක් සකස් කරන්නට පුළුවන්" ය කියන හඬ පාර්ලිමේන්තුවේදී නංවා මේ පරිවර්තනය කළා. එතුමාගේ වැඩ පිළිවෙළ නිසා මුළු ලෝකයේම නැති අධ්‍යාපන ක්‍රමයක් අද ලංකාවේ තිබෙනවා. බාලාංශයේ සිට විශ්ව විද්‍යාලය දක්වා නොමිලයේ අධ්‍යාපනය දෙන තව එක රටක් වත් නැහැ. සමාජවාදය ගැන කොයි තරම් කථා කළත් ලංකාව හැර එවැනි අධ්‍යාපනයක් දෙන තවත් රටක් ලෝකයේම නැහැ. සමහර රටවල්, රටේ ජනතාව භාර ගන්නවාය කිව්වාට, ජනතාවට සෑම දෙයක්ම සලසා දෙනවාය කිව්වාට, බාලාංශයේ සිට විශ්ව විද්‍යාලය දක්වා නොමිලයේ අධ්‍යාපනය දෙනවාය කියා ආදර්ශයකට පෙන්වන්නට තිබෙන්නේ ලංකාව පමණයි. මේ ආකාරයට අධ්‍යාපනය දෙන වෙනත් රටක් ලෝකයේ තිබෙනවාද ? ලංකාවට එම තත්ත්වය ලබා දුන්නේ කන්නන්ගර මැතිතුමා බව මා සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා. අද ලෝකයේ ඕනෑම රටකට ගිය පසු ලංකා දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය මේයයි කැපී පෙනෙනවා. සියයට 80ක් පමණම සාර්ථක වූ අධ්‍යාපනයක් ඔවුන් ලබා තිබෙන බව පෙනෙනවා. එවැනි තත්ත්වයක් ඇති වී තිබෙන්නේ කන්නන්ගර මැතිතුමාට පිංසිද්ද වන්නට බව කිව යුතුයි. මීට වඩා දීර්ඝ ලෙස කථා කළ යුතු යයි මා සිතන්නේ නැහැ. යම් යම් අය එතුමාගේ සේවය කුඩා කොට තැකීම් වස් එතුමාගේ නිදහස් අධ්‍යාපන ක්‍රමය සීමා වූයේ පොහොසතුන්ට පමණය යන අදහසක් ඉදිරිපත් කර තිබුණා නම් එය සම්පූර්ණයෙන්ම මකා දැමීම සඳහා දැන් හැම කටකින්ම කරුණු ඉදිරිපත් කර තිබෙන බව මා සන්තෝෂයෙන් ප්‍රකාශ කර සිටිනවා. ධනපතියන්ගේ දරුවන්ට පමණක් නොමිලයේ අධ්‍යාපනය දෙන්නට නොවෙයි එතුමා එම සේවාව සකස් කළේ. දුප්පත් ගැමි ජනතාවගේ හැම දරුවකුටම නාගරික දරුවන්ට ලැබෙන අධ්‍යාපන පහසුකම් හැමෙකක්ම ලැබිය යුතුය යන අදහස ඇතුවයි එතුමා ක්‍රියා කළේ. එවැනි උසස් අධ්‍යාපන ක්‍රමයක් ලෝකයට ඉදිරිපත් කළ මෙම වීරයාට සෑම කාලයක දීම ගරු කළ යුතුයයි මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

පූ. භා. 11.5

**ගරු ආචාර්ය දහනායක**

*(கௌரவ கலாநிதி தகநாயக்க)*

(The Hon. Dr. Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම කනගාටුදායක අවස්ථාවේදී වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට මට අවස්ථාව ලබා දීම ගැන මා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ගරු කන්නන්ගර මැතිතුමාගේ ජීවිතයේ හැම අංශයක් ගැනම කල්පනා කර බලන විට එතුමා රුහුණේ ඉතාමත් ශ්‍රේෂ්ඨ පුත්‍රයකු හැටියට හඳුන්වා දෙන්නට පුළුවනි. එතුමා තම අධ්‍යාපනය ආරම්භ කළේ ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලයෙනුයි. ඊට පසු එම විද්‍යාලයේ ගුරුවර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආචාර්ය දහනායක]

යකු හැටියට අවුරුදු 7ක් එතුමා සේවය කළා. අනතුරුව ගාල්ල උසාවියේ නීතිඥයකු හැටියට වැඩ කළා. ඊළඟට මන්ත්‍රීවරයකු වශයෙන්—ගාලු ආසනයට, ගාලු දිස්ත්‍රික්කයට පමණක් නොවෙයි මුළු දකුණු පළාතටම—අවුරුදු 16ක පමණ කාලයක් තුළ ඉමහත් සේවයක් කළා. ඒ නිසා මෙම අවස්ථාවේදී එතුමාට වචන ස්වල්පයකින් සංග්‍රහ කිරීම මගේ යුතුකමක් හැටියට මා සලකනවා.

අපේ රටේ සිටින ශ්‍රේෂ්ඨ දේශපාලනඥයන් අතුරින් කැපී පෙනෙන ඉතා උසස් සමාජවාදියකු හැටියට ගරු කන්නන්ගර මැතිතුමා හඳුන්වා දෙන්නට පුළුවනි. කන්නන්ගර මැතිතුමා මුළු හදවතින්ම සමාජවාදියෙක්. එතුමා මන්ත්‍රණ සභාවෙහි සහ පාර්ලිමේන්තුවේ සිටි කාලයේදී රටට උසස් සේවාවක් කිරීම සඳහා ඇති කළ නිදහස් අධ්‍යාපනය පිළිබඳව මන්ත්‍රීවරුන් රාශියක් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. නිදහස් අධ්‍යාපනයෙහිදී පමණක් නොව වෙනත් වැදගත් ප්‍රගතිශීලී කටයුතුවලදීත් එතුමා නායකයකු හැටියට විශාල සටන්වල යෙදෙමින් ක්‍රියා කළ බව අප දන්නවා. එතුමා, තමන්ගේ සහජ උරුමය අනුව පොඩි දරුවාට නිදහස් අධ්‍යාපනය ලබා ගන්නට යම්කිසි අවස්ථාවක් සලසා දුන්නා පමණක් නොව ඒ යුගයේදී ගුරුවරුන්ගේ නිදහස වෙනුවෙනුත් එතුමා සටන් කළ බව අප දන්නවා. ඒ කාලයේ ගුරුවරුන්ට පඩි ක්‍රමයක් තිබුණේ නැහැ. මුලින්ම ගුරුවරුන් සඳහා නියම පඩි ක්‍රමයක් ඇති කළේ කන්නන්ගර මැතිතුමායි. ඒ කාලයේදී ගුරුවරුන් පෞද්ගලික කළමනාකාරවරුන්ට ගොදුරු වී සිටියා. ඒ කලම්නාකාර වරුන්ගෙන් ගුරුවරුන් නිදහස් කර ගත්තේ ගරු කන්නන්ගර මැතිතුමායි. 1931 වන තෙක් ගරු කන්නන්ගර මැතිතුමා කළ වැඩ අනුව කියන්නට පුළුවන් ඒ කාලය වන විට ගුරුවරුන්ට සිටි ඉතාම හොඳ මිත්‍රයා කන්නන්ගර මැතිතුමා බව. ඒ නිසා ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය ඇති වූ පසු 1931 දී එතුමාට අධ්‍යාපන ඇමති පදවිය පිරිනමන්නට යෙදුණා. අධ්‍යාපනය සම්බන්ධයෙන් පමණක් නොව ඒ කාලයේදී ඇතිවූ සෑම වැදගත් මහජන ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කන්නන්ගර මැතිතුමා නායකත්වය ගත් බව මට මතකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාලයේදී තිබුණු ඉතාමත්ම වැරදි ක්‍රමයක් තමයි, මුලාදෑනි ක්‍රමය. ඒ කාලයේදී තිබුණු ක්‍රමය අනුව තමන්ගේ උත්පත්තිය අනුවම, පවුල් බලය අනුවම පත් වුණු, පඩි ලබන්නෙ නැති මුදලිවරුන්, රටේමහත්වරුන් වැනි මුලාදෑනිවරුන් සිටියා. ඩී. ආර්. ඕ. ක්‍රමය ඇති කිරීම සම්බන්ධයෙන් මුල් ස්ථානය ගෙන වැඩ කළේ ගරු කන්නන්ගර මැතිතුමායි. එසේම මුලාදෑනින්ට පඩි ගෙවන්න ඕනෑය කියා මුලින්ම කීවේත් ගරු කන්නන්ගර මැතිතුමායි. එතුමා මුලාදෑනින්ගේ අයිතිවාසිකම් සඳහා සටන් කළා. මුලාදෑනින්ට පඩි ගෙවන්නට තීරණය කළේ ගරු කන්නන්ගර මැතිතුමාගේ යෝජනාවක් අනුවයි. වෙනත් සෑම ප්‍රශ්නවලදීත් ගරු කන්නන්ගර මැතිතුමා සමාජවාදී අදහස් දැරුවා. 1931 ට පෙර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට වැටුපක් හෝ අතිරේක දීමනාවක් හෝ ගෙව්වෙ නැහැ. මන්ත්‍රීවරුන්ට පඩි ගෙවිය යුතුය කියා ගරු කන්නන්ගර මැතිතුමා ඇති කළ උද්ඝෝෂණයට සමහරුන් විරුද්ධ වුණා. පඩියක් ලැබෙන්නේ නත්නම් මන්ත්‍රීවරයෙකුට තමන්ගේ සම්පූර්ණ කාලය මන්ත්‍රී ධුරයේ වැඩ කටයුතු සඳහා යොදවන්නට බැරි බව එතුමා පෙන්වා දුන්නා. පොහොසත් අයට පමණක් නොව ආදායමක් නැති අයටත් පාර්ලිමේන්තුවට එන්නට ඉඩ තිබිය යුතු බව එතුමා පෙන්වා දුන්නා. ඒ විධියට උද්ඝෝෂණයක් ඇති කර තමයි, කන්නන්ගර මැතිතුමා 1931 දී මන්ත්‍රීවරුන්ට පඩි ගෙවීම සඳහා යෝජනාව ඉදිරිපත් කළේ. උත්පත්තියෙන්ම එතුමාට සමාජවාදී අදහස් තිබුණු බව එතුමාගේ මේ වැඩවලින් ඔප්පු වෙනවා.

අප මේ අවස්ථාවේදී ඒ මැතිතුමා ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරන අතර ඒ මැතිතුමාට මරණයෙන් පසු පමණක් නොව ඊට පෙරත් කරන්නට පුළුවන් සෑම විධියකම ගරු බුහුමන් කළ බව මතක් කරන්නට කැමතියි. මේ ආණ්ඩුවට පෙර තිබුණු ආණ්ඩුව 1963 මාර්තු මාසයේදී පාර්ලිමේන්තුවේදී සම්මත කර ගත් යෝජනාවක් අනුව ඒ මැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුමාට පාරිතෝෂික මුදලක් පුද කළා. ඊට පසු මේ රජය, 1965 නොවැම්බර් මාසයේදී සම්මත කළ යෝජනාවක් අනුව එතුමාට මාස්පතා විශ්‍රාම වැටුපක් ගෙවන්නට පටන් ගත්තා. දැනට පවත්නා නීතිරීති අනුව මන්ත්‍රීවරයකු වශයෙන් සිට අස්ව ගිය කෙනෙකුට විශ්‍රාම වැටුප් ලබා දෙන්න ක්‍රමයක් නැහැ. එසේ වුණත් ආචාර්ය කන්නන්ගර මැතිතුමාට දෙවතාවක්ම—මේ රජයත්, කලින් තිබුණු රජයත්—පුළුවන් ප්‍රමාණයෙන් සංග්‍රහ කළ බව මතක් කර දෙන්න කැමතියි. ඒ වාගේම ඉදිරියටත් මෙම වීරයාගේ නාමය සදාකාලිකව පවතින පිළිවෙළට නිසි අන්දමට මෙම ගරු සභාව ක්‍රියා කරාවිය කියා බලාපොරොත්තු වෙමින්, තමුන්නාන්සේටත් ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

පූ. භා. 11.14

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
(Mr. T. B. Tennekoon—Dambulla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1932 දී මහනුවර කටුකැලේ ධම්ම යුත්තිකාරාම විහාරස්ථානයේ ත්‍යාග ප්‍රදානෝත්සවයක මුලසුන දැරුවේ අපේ ආචාර්ය කන්නන්ගර මැතිතුමායි. එතුමා මුලසුනේ කථාව කරමින් මෙන්න මේ කවිය ඉතාමත්ම රසවත් අන්දමට මිහිරි හඬින් ගායනා කළා.

“ තකට තක මිසක් නොතකට
තකන එකා
එකට එක නොකර පස්සට දුවන එකා
දුකට පිහිට වුන අය නොතකනා එකා
මොකට වැදුවාද උගෙ මව් නො
සිඳ නිකා ”

එතුමාට බොහොම ලස්සනට මිහිරි ලෙස කවි ගායනා කරන්න පුළුවනි. එතුමා කථාවක් කළත් අමුතු ශබ්දයක්, මිහිරක් ඒ කථාවෙහි තිබුණා. මා දන්නා හැටියට එවකට ඇමති මණ්ඩලයෙහි සිටි අයගෙන් කවි කීමට දක්ෂයකු හැටියට එතුමා ප්‍රසිද්ධව සිටියා. මට අවස්ථාව ලැබුණා, එතුමා මුලසුන හෙබවූ එම සභාවේ, එතුමාට ස්තුති යෝජනාව ඉදිරිපත් කරන්න. මා එතුමාට ස්තුති කථාව කළේ කවි පන්තියකින්. මට ඒ කවි සියල්ලක්ම දැන් මතක නැහැ. මට මතක ඇති එයින් එක් කවියක් පමණක් දැන් කියන්නම් :

“ පානි තලය මේ මැතිඳුගෙ—සුරබි දෙනෙක නිසගයෙන්ම
එ නිසා අපි පිළිගන්නෙමු මේ මල් කළඹින් ”

ආචාර්ය කන්නන්ගර මැතිතුමා, අද මෙම ගරු සභාවේ ප්‍රකාශ වුණු අන්දමට ජාතික ඌරුවට අනුව ජීවත්වන්නට වෑයම් කළ උත්තමයකු බව අපට නිර්භයවම කියන්න පුළුවන්. එතුමා, එදත් අප වාගේ රෙද්ද බැනියම ඇඳගෙනයි මෙම මන්ත්‍රී මණ්ඩලයේ වැඩ කටයුතු කළේ. ශ්‍රීමත් ජයතිලක ප්‍රධාන ඇමතිතුමා සිංහල භාෂාව පිළිබඳව සෑහෙන දැනුමක් ඇතුව සිටියත්, එතුමාටත් වඩා කැපී පෙනෙන අන්දමින්, සිංහල භාෂාව ගැන, සිංහල සිරිත් විරිත් ගැන උනන්දුවක් දක්වූ උදවිය අතරින් කන්නන්ගර මැතිතුමාට ලැබෙන්නේ විශිෂ්ට ස්ථානයක් බව සඳහන් කරන්න කැමතියි. ඇත්ත වශයෙන්ම ඒ අන්දමේ උසස් කෙනෙකු නිසා තමයි එතුමාට විශ්‍රාම වැටුපක් ගෙවීමට සිද්ධ වුණේ. එතුමා, දේශපාලනයට ගොස් තමන්ගේ නෑදෑයින් තර කිරීමට කල්පනා කළේ නැහැ ; තමන් ජීවත්වන මාර්ගය ගැන කල්පනා කළේ නැහැ. එම නිසා, ඉතාමත් උසස් අන්දමින් ක්‍රියා කොට අවසානයේදී විශ්‍රාම වැටුප් හෝ ආධාර මුදල් හෝ ත්‍යාග මුදල් හෝ ලබා ගෙන ජීවිතය ගත කරන්නට එතුමාට පුළුවන් වීම ගැන, මෙම ගරු සභාවේ සිටින අප වැනි උදවියට හිතට ලොකු ධෛර්යයක්, සැනසිල්ලක් ලැබෙනවා. අපටත් මේ ගරු සභාවේ දීර්ඝ කාලයක් කටයුතු කිරීමෙන් පසුව, ආණ්ඩුවකින් පරිත්‍යාගයක් නැතත් පොල් කටුව අර ගෙන වීදිවල ඇවිදිමින්, හිඟමනේ යමින් ජීවත් වෙන්න ලැබුණත් අවංකව සේවයක් කරන්න ලැබුණාය, අයුතු දේවල් කිරීමෙන් වැළකී සිටියාය, කියා ප්‍රීතිමත්ව මැරෙන්නට පුළුවන්ය යන අදහස කන්නන්ගර ඇමතිතුමා අපට පෙන්නුම් කළ බව අපි කවුරුත් පිළිගන්න ඕනෑ. ඒ නිසා ඒ මැතිතුමාගේ අභාවය ගැන මේ ගරු සභාවේදී මේ අන්දමට ශෝකය පළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. බී. තෙන්නකෝන් මයා.]

කිරීම ඉතාමත් වැදගත් කොට සලකන අතර එතුමාගේ අභාවය ගැන අපි සියලු දෙනාම කනගාටු වේන බව ප්‍රකාශ කරන්නට ඕනෑ. රාජ්‍ය මන්ත්‍රණ සභා කාලයේ දී ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභා කාලයේ දී—අධිරාජ්‍යවාදීන්ට හොඳට ගැතිකම් දක්වන උදවිය සිටි කාලයේදී—එම අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව සටන් කරමින් ආදශී මත් ජීවිතයක් ගත කළ එතුමාට අපි කවදත් ගරු කරන බව කියමින් එතුමාගේ මරණය ගැන නැවතත් ශෝකය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

පූ. භා. 11.19

**ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදුව)
(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபறாதுவ)
(Mr. Prins Gunasekera—Habaraduwa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දුක්බර හදවතකින් යුතුව මා නැගී සිටියේ නිදහස් අධ්‍යාපනයේ නිර්මාතෘවරයාගේ අභාවය ගැන මේ රටේ දුප්පත් දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ නිර්ව්‍යාජ ශෝකය පළ කිරීමටයි. එතුමා—මිය ගිය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා අධ්‍යාපනයේ නිදහස හා මේ රටේ දේශපාලන නිදහස සඳහා තමන් ගත් උත්සාහයේ, තමන් ඇරඹූ ව්‍යාපාරයේ, නියම මල් ඵල හටගන්නට පෙර අභාවයට යාම ගැන ඇත්ත වශයෙන්ම අප ශෝක විය යුතුයි.

කන්නන්ගර මහතාගේ ගුණ ගායනා කිරීම සඳහා විරුද්ධ පක්ෂයේ හා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක්ම මේ මන්ත්‍රී මණ්ඩලය හමුවේ කතා රාශියක්ම පැවැත්වූවා. මගේ කතාවේදී—එතුමාගේ ගුණ ගායනා කිරීම සඳහා මා කරන කතාවේදී—සඳහන් කරන ඇතැම් කරුණු නිසා සමහර විට සමහර පුද්ගලයන්ගේ හෝ සමහර ආයතනවල හෝ සිත් වේදනාවක් ඇති වෙනවා නම් මට ඒ ගැන කරන්න දෙයක් නැහැ. සත්‍යය ඇති සැටි සඳහන් කිරීමට මා බොහෝ විට උත්සාහ ගන්න නිසා මේ ශෝචනීය අවස්ථාවේදී වුවත් ඒ අම්හිරි සත්‍යය සඳහන් කළ යුතුව තිබෙනවා. මියගිය ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර මහත්මයා මේ රටේ දේශපාලන නිදහස සඳහා 1930 ගණන්වල සිටම සටන් කළ නායකයෙක් බව ගරු අගමැතිතුමාත්, ගරු කර්මාන්ත ඇමතිතුමාත්, ගරු ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාත් වෙනත් නායකයනුත් සඳහන් කරන්න යෙදුනා. නමුත් දැන් එම නිදහස ලබාගෙන අවුරුදු 21 ක් ගත වුණත්, එම දේශපාලන නිදහස භුක්ති විඳ විසි එක් වසරක් ගත වී ඇතත් ඒ පුද්ගලයාගේ අභාවය ගැන මේ ජාතික මන්ත්‍රී මණ්ඩලයේදී ජාතික භාෂාවෙන් සඳහන් කරන්නට නුපුළුවන් වීම ගැන පළමුකොටම අපි කනගාටු වෙන්න ඕනෑ.

ජාතික නිදහස සඳහා සටන් කළාය කියන්නේ දේශපාලන වශයෙන් එක් පාලකයන් පිරිසක් අතේ තිබුණ යන්ත්‍රය තවත් පාලකයන් පිරිසක් අතට ගැනීම සඳහා කරන ව්‍යාපාරයක් නොවෙයි. ජාතික නිදහසය කියන්නෙ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික භාෂාවන්ගේ නිදහස, ජාතික සංස්කෘතියේ නිදහස, ජාතික ආර්ථිකත්වයේ නිදහස යනාදියටයි. මේ අංග නැත්නම් ජාතික නිදහස නමැති වචනය නිකම්ම හිස් වැදගැම්මකට නැති වචනයක් පමණයි. එම නිසා අර්ථාන්විත අංග සම්පූර්ණ නිදහස සඳහා සටන් කළ කන්නන්ගර මැතිතුමාගේ අභාවය පිළිබඳව මෙම ජාතික මන්ත්‍රී මණ්ඩලයේදී එතුමාට නිගරු නොවන අයුරින් ජාතික භාෂාවන්ගෙන් ඒ ගැන සඳහන් කරන්නට නොලැබීම ගැන මම පෞද්ගලිකව කනගාටු වෙනවා.

ජාතික නිදහස සඳහා සටන් කළ මේ ජාතික වීරයාට, හිටපු අධ්‍යාපන ඇමතිවරයකුට, දිය හැකි උසස්ම ගෞරවය පිරිනමා අත්‍යාලංකාරයෙන් ඒ අවසන් බුහුමන් දැක්වීමට පියවර ගැනීම ගැන වර්තමාන රජයේ අධ්‍යාපන ඇමතිතුමාට අපේ ස්තුතිය හිමිවෙනවා. එහෙත් නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මිය ගියේ හිටපු අධ්‍යාපන ඇමතිවරයකු පමණක් නොවේ. ඒ මිය ගියේ මේ රටේ ජාතික නිදහස සඳහා සටන් කළ ජාතික වීරවරයෙකු බවත්, මේ රටේ සමාජවාදය ගොඩ නැංවීම උදෙසා දුප්පත් ජනතාවට අර්ථාන්විත පරිදි නිදහස් අධ්‍යාපනය ලබා ගැනීමට ඉඩක් ඇති කළ නිදහස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යාපනයේ නිර්මාතෘවරයකු බවත්, මේ රටේ බලවත් විප්ලවයක් ඇති කළ විශිෂ්ට චින්තකයෙකු බවත් අපේ සිහියට නංවා ගත යුතුයි. එම නිසා ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ කර පිටට පමණක් ඒ මිය ගිය ජාතික වීරවරයාගේ දේහය පැටවීම ගැන මා ඇත්ත වශයෙන්ම කනගාටු වෙනවා. ජාතික නිදහස සඳහා සටන් කළ වීරවරයකුගේ දේහය මේ ජාතික මන්ත්‍රී මණ්ඩලයේ තබා මහජන ගෞරවය සැලැස්වීමට තීරණය කර ගැනීමට තරම් ජාතික හැඟීම්වලින් පිබිදුණු ජාතික නායකත්වයක් මේ රටේ නැති වීම ගැනත් මා කනගාටු වෙනවා. එපමණක් නොවෙයි, ජාතික නිදහස සඳහා සටන් කළ, මේ රටේ තිබෙන උසස්ම නීති සම්පාදක මණ්ඩල තුනක සාමාජිකත්වය දැරූ ඒ පැරණි ජන නායකයාණන්ට මෙම මන්ත්‍රී මණ්ඩලයේ තබා බුහුමන් කළ නොහැකි නම් යටත් පිරිසෙයින් ජාතික නිදහස සිහිපත් කිරීම සඳහා මේ රටේ එක්තරා තැනක පිහිටා තිබෙන ජාතික නිදහස් මන්දිරය තුළවත් ඒ ජාතික වීරවරයාණන්ගේ දේහය තබා මහජන ගෞරව දැක්වීමට සැලැස්විය යුතුව තිබුණා. එවැන්නක් සිදු වුණෙත් නැහැ. එපමණක් නොවෙයි, එයත් කළ නොහැකි නම් නිදහස් අධ්‍යාපනයේ නිර්මාතෘවරයා හැටියට සැලකෙන ඒ හිටපු අධ්‍යාපන ඇමතිතුමාගේ දේහය අධ්‍යාපනයේ උසස්ම ආයතන හැටියට සැලකෙන විශ්ව විද්‍යාල භූමියක තබාවත් මහජන ගෞරව දැක්වීමට සැලැස්විය යුතුව තිබුණා. ඒ කිසිවක් සිදු වුණේ නැහැ. අන්න ඒ නිසයි මගේ කනගාටුව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිදහස් අධ්‍යාපනයේ ආශීර්වාදයක් ලෙස මේ රටේ බිහි වී තිබෙන විශ්ව විද්‍යාල හතරෙන් තුනක්ම කොළඹ ආසන්න ප්‍රදේශයේ තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. මේ දිනවල විවේක කාලය නිසා වසා දමන ලද විශ්ව විද්‍යාලයක් කොළඹ රීඩ් මාවතේ සෑහෙන මහජන සන්නිපාතයකට මධ්‍යස්ථානයක් හැටියට පිළිගත හැකි ස්ථානයක තිබෙනවා. ඔබතුමාත් විශ්ව විද්‍යාලයට ගිය ශිෂ්‍යයකු හැටියට දන්නවා ඇති ජෝජ් ශාස්ත්‍ර ශාලාව ගැන. එනිසා ඒ හිටපු අධ්‍යාපන ඇමතිතුමාගේ දේහය, නිදහස් අධ්‍යාපනයේ නිර්මාතෘවරයාගේ දේහය, අඩු ගණනේ ඒ ජෝජ් ශාස්ත්‍ර ශාලාවේවත් තබා ගෞරව දැක්වීමට යුතුකමක් තිබුණා. ඒකවත් නොකිරීම ගැනයි අපේ කනගාටුව.

එපමණක්ද නොවෙයි, නිදහස් අධ්‍යාපනයේ නාමයෙන් ගෞරව දැක්විය හැකි තවත් උසස් විද්‍යායතන කීපයක් මේ රටේ තිබෙනවා. රාජකීය විද්‍යාලය, ආනන්ද මහා විද්‍යාලය වැනි ආයතන කීපයක්ම මේ සඳහා උපයෝගී කර ගත හැකිව තිබුණා. එතුමා තම කාලය, ශ්‍රමය හා ධනය වැය කළ බෞද්ධ මන්දිරය වැනි ආයතන කිහිපයක් තිබුණා. එබඳු තැනකවත් මේ විශිෂ්ට පුද්ගලයාගේ මළ සිරුර තැන්පත් කර මහජන ගෞරව දක්වන්නට අපට පුළුවන් කමක් තිබුණේ නැහැ. යටත් පිරිසෙයින් මේ විද්‍යායතන එකකවත් ඒ වීරපුරුෂයාගේ මෘත දේහය තබා මහජන ගෞරව පැවැත්වූවා නම්, ජාතියක් වශයෙන් අප ඒ විශිෂ්ට පුද්ගලයාට දැක්විය යුතු ගෞරවය, පිරිනැමිය යුතු සැලකිල්ල දැක්කුවා නම්, ජාතිය එතුමාට ගෙවිය යුතු ණයෙන් එක්තරා කොටසක්වත් ගෙව්වා හා සමාන වෙනවා. අවසාන වශයෙන් සිදු වූයේ කුමක්ද ? සාමාන්‍ය අධ්‍යාපන ඇමතිවරයකු හැටියට පමණක් සලකා හිටපු ආණ්ඩුවක අධ්‍යාපන ඇමතිවරයෙකුගේ මෘත ශරීරය වර්තමාන ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිවරයාගේ කාර්යාලයේ තබා ප්‍රදර්ශනය කළා. ඒ තීරණය ගැනීමට අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා මූලිකව ක්‍රියා කිරීම ගැන, එපමණකින්වත් හිටපු අධ්‍යාපන ඇමතිතුමෙකුට අවසාන ගෞරවය දැක්වීමට පියවර ගැනීම ගැන වර්තමාන අධ්‍යාපන ඇමතිතුමාට අපි කෘතඥ වෙනවා. අපි ඒ ගැන එතුමාට ස්තුති කරන්නට ඕනෑ. මගේ කනගාටුව මීට වඩා ඉහළින් සම්මාන දැක්විය යුතු පුද්ගලයෙකුට මෙබඳු ආකාරයකට අවසාන ගෞරවය පිරිනැමීම ගැනයි. ඊට හේතුව නම්, මේ රටේ සමාජයේ එක්තරා කොටසක එක්තරා තත්ත්වයක විප්ලවයක් ඇති වී තිබුණත් මේ රටේ සමාජයේ ඉහළ තැන්වල වැජඹෙනවා කියන ඇතැම් පුද්ගලයන්ගේ සිත් සතන් තුළ මේ සමාජ විප්ලවය තවම සිදු නොවීමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු අධ්‍යාපන ඇමති කන්නන්ගර මහත්මයාගේ ජීවිත කාලය තුළදී එතුමා සමග පෞද්ගලිකව ආශ්‍රය කිරීමේ භාග්‍යය මට ලැබුණේ නැහැ. මා මෙතැනදී උත්සාහ කරන්නේ, මේ රටේ පිළිගත් විශිෂ්ට ජන නායකයකු දෙස ඈත සිට බලන ගම්බද දුප්පත් දරුවකු තුළ ඇතිවන හැඟීම් ටිකක් මේ මන්ත්‍රී මණ්ඩලයේදී වාර්තා ගත කොට එබඳු අදහස් දරන ලක්ෂ සංඛ්‍යාත ගම්බද දරුවන් වෙනුවෙන් මගේ කනගාටුව පළ කිරීමටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආචාර්ය කන්නන්ගර මහත්මයා මේ රටේ දේශපාලන ජීවිතයේ ගත කළ කාලය තුළදී අත්පත් කර ගන්නා ලද විශිෂ්ටතම ජයග්‍රහණය තමයි, නිදහස් අධ්‍යාපන ක්‍රමය. ඒ නිදහස් අධ්‍යාපන ක්‍රමයෙන් අංග සම්පූර්ණ ප්‍රයෝජනයක් ලැබුණු පුද්ගලයෙකු හැටියට මට කථා කරන්නට බැරි වීම ගැන මා කනගාටු වෙනවා. මක්නිසාද, නිදහස් අධ්‍යාපන ක්‍රමය ආරම්භ කළ යුගයේදීම තමයි, මාත් එවකට මේ රටේ තිබුණු එකම විශ්ව විද්‍යාලය වන ලංකා විශ්ව විද්‍යාලයට ඇතුළත් වුණේ. එදා තිබුණු නිදහස් අධ්‍යාපන ක්‍රමයේ තත්ත්වය නිසා විශ්ව විද්‍යාලයට ඇතුළු වෙද්දී මුදලක් ගෙවීම අනවශ්‍ය වුණත් බොහෝ දෙමාපියන්ගේ, පොහොසත් නෑදැයින්ගේ ආධාර උපකාර නැතිව විශ්ව විද්‍යාල අධ්‍යාපනයක් ලැබීම එදා කාලයේ අමාරු කරුණක් නිසා, අද මෙන් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට ශිෂ්‍යත්ව හා බැංකු ණය පහසුකම් ආධාර ලැබීමේ ක්‍රමයක් එදා නොතිබුණු නිසා, නිදහස් අධ්‍යාපන ක්‍රමයෙන් විශ්ව විද්‍යාලයේ සිව් වසරක අංග සම්පූර්ණ අධ්‍යාපනයක් ලබා ගැනීමට භාග්‍යයක් මට නැතුව ගියා. එහෙත් අද—කන්නන්ගර මහත්මයා අභාවයට ගිය යුගයේ —එතුමා නිදහස් අධ්‍යාපන ක්‍රමය ඇති කළ කාලයේදී තිබුණු තත්ත්වයට වඩා යහපත් තත්ත්වයකට මුහුණ දෙන්නට දුප්පත් ගැමි දරුවන්ට පුළුවනි. ගරු ආචාර්ය කන්නන්ගර මහත්මයාගේ නිදහස් අධ්‍යාපන ක්‍රමයේ පහන් ආලෝකය නිසා මේ රටේ පිටිසරබද දුප්පත් ගෙවල අන්ධකාරයේ ජීවත් වුණු බුද්ධිමත් දරු පරපුරකට සමාජයේ ආලෝකවත් ස්ථානවලට එන්නට ඉඩකඩ ලැබුණා. මෙන්න මේ කාරණය නිසාම මේ රටේ පොදු මහජනයා කන්නන්ගර නාමයට සදාකාලිකවම ගරු කරනවා ඇති. කන්නන්ගර මහත්මයාගේ ඒ අමරණීය පියවර නිසා—එතුමා එදා ඒ ආකාරයට ඇරඹූ ඒ සමාජවාදී ඉදිරි ගමන නිසා—විද්‍යාවේ භාග්‍යය, විද්‍යාවේ ආලෝකය, ආලෝකයේ ප්‍රයෝජනය ලැබ අද සමාජයේ උසස් තැන්වල වැජඹෙන සිය ගණනක් ජන නායකයන් එතුමා කෙරෙහි සැදී පැහැදී එතුමා කෙරෙහි ගෞරවය සහ කෘතඥතාව පළ කිරීමට ඊයේ සවස සුසාන භූමියට පැමිණ සිටියා. ඒ අවස්ථාවේ ගුණ කථනායක යෙදුණු ගරු අගමැතිතුමාත්, විරුද්ධ පාර්ශ්වයේ ගරු නායකතුමියත්, ගරුතර මහා සංඝ රත්නය වෙනුවෙන් කථා කළ ගරුතර නායක ස්වාමීන් වහන්සේත් කළ කථාවලට මාත් සවන් දුන්නා. ඒ කථාවලදී හැම තැනකදීම සඳහන් වුණේ කන්නන්ගර මහත්මයාගේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය නිසා රටට සිදු වූ යහපත ගැනයි. එය ඉතාමත් වැදගත් දෙයක් හැටියට මා සලකනවා. ඒ නිසා අප විසින් කොයි හැටියකින්වත් අමතක නොකළ යුතු දෙයක් ගැන සඳහන් කරන්නට කැමතියි. එදා මේ රටේ පැගුණු සමාජයට කන්නන්ගර මහත්මා දුන් ඇවැද්ද හෙවත් දායාදය, නැත්නම් පරිත්‍යාගය, නැතිවන අයුරු එහි ගෙළ මිරිකා විනාශ කර දැමීමට අදත් පියවර ගන්නා පිරිසක් සිටින බව මා මේ අවස්ථාවේ මතක් කරන්නට ඕනෑ. එවැනි සතුරු පිරිසක් එදත් සිටියා; අදත් සිටිනවා. කන්නන්ගර මහත්මා ගැන සඳහන් කරන මේ අවස්ථාවේ—එතුමාගේ අභාවය ගැන කථා කරන මේ වැදගත් අවස්ථාවේ—එතුමාගේ ගුණ වර්ණනා කරන අතරම, එතුමා අපට දුන් ඒ දායාදය ආරක්ෂා කර ගැනීම සඳහා, එය විනාශ මුඛයට ගෙන යාමට හැම අවස්ථාවකම උත්සාහ කරන සතුරන්ගෙන් එය ආරක්ෂා කර ගැනීම සඳහා, ගතයුතු පියවර ගැන සමාජයේ අවධානය මැනැවින් යොමු කිරීම යුතුකමක් හැටියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා කල්පනා කරනවා. කන්නන්ගර මැතිතුමාගේ ගුණ ගායනය කරන මේ අවසථා වේදී මාත් කථා කරන්නට නැගී සිටියේ විශේෂයෙන්ම අන්න ඒ කාරණය මතක් කරන්නටයි.

මේ රටට නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීම සඳහා කලින්ම යෝජනාවක් ඉදිරිපත් කළ අවස්ථාව මට මතකයි. ඒ අවස්ථාවේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) "A Case for Free Education" "නිදහස් අධ්‍යාපනය සඳහා" යන නමින් යුත් ග්‍රන්ථයක් නිකුත් කළා. එදා අධිරාජ්‍යවාදී යුගයේ අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව මහජන විමුක්ති ව්‍යාපාරය වෙනුවෙන් ඉදිරියේ ගමන් කළ ජන නායකයකු වූ ආචාර්ය එන්. එම්. පෙරේරා මහත්මයා බන්ධනාගාරගතව සිටින අතර ලියූ ග්‍රන්ථයේ නම තමයි මා ඒ සඳහන් කෙළේ. මේ රටේ අවුරුදු පතා බුද්ධිමත් දුප්පත් ළමයින් ලක්ෂ ගණනක් ඉපදී විද්‍යාවේ හෝ අධ්‍යාපනයේ ආලෝකය ලැබීමේ භාග්‍යය නොලැබ නැති වී යනවා. ඒ නිසා අධිරාජ්‍යවාදී යකඩ සපත්තුවට පෑගී තිබුණු මේ රට නිදහස් කර ගෙන මේ රටේ තිබෙන ලොකුම නැත්නම් වටිනාම වස්තුව වන මේ රටේ ජනතාව සංවර්ධනය කර ගැනීමට හා ඔවුන්ගේ බුද්ධි වර්ධනය සඳහා ගත යුතු මූලික පියවර නම් නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීමයි කියන එක ඒ ග්‍රන්ථයේ කියා තිබෙනවා. ඒ ග්‍රන්ථය පළවුණු කාලයේ මා සාමාන්‍ය ශිෂ්‍යයෙක්. ඒ කාලයේ මේ රටේ තිබුණු ප්‍රබල ප්‍රවෘත්ති පත්‍රත්, බලයේ සිටි කළු සුද්දනුත්, මේ රටේ ප්‍රවෘත්ති පත්‍ර හා අත්වැල් බැඳගෙන සිටි අනිකුත් දේශපාලන ජන නායකයිනුත් එම අදහසට එරෙහිව ඒ අදහස් උපන් ගෙයිම මරා දැමීමට ක්‍රියා කළ හැටි මට මතකයි. ගරු කන්නන්ගර මැතිතුමාගේ අභාවය ගැන සඳහන් කරන විට නිදහස් අධ්‍යාපනයේ උත්පත්තිය ගැන අපට මතක් වන්නේ ඒ විධියටයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please: I have to remind the hon. Member that there are a number of hon. Members who wish to speak on this Vote of Condolence. The hon. Member has already taken twenty minutes.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

එහෙත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යළිත් වරක් නිදහස් අධ්‍යාපනයේ නිර්මාතෘවරයා ගැන සඳහන් කරන්නට අපට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. සමහරවිට එතුමාගේ අතින් බිහි වූ නිදහස් අධ්‍යාපන ක්‍රමය මරන්නට උත්සාහ කරන අය සමග සටනක යෙදෙන්නට නම් අපට සිදු වේවි. ඒ නිසා මේ අවස්ථාවේදී මා උත්සාහ කරන්නේ ඒ ගැන යන්තමින් වත් සඳහන් කරන්නයි. එදා ඒ නිදහස් අධ්‍යාපන මතය යන්තමින් බිහි වූ අවස්ථාවේ මේ රටේ තිබුණු ප්‍රබල පුවත් පත් හා ප්‍රබල නායකයින් යන දෙගොල්ල අත්වැල් බැඳ ගෙන ක්‍රියා කළ හැටිත්, දුර්දාන්ත මිෂනාරි බලවේගයන් අධ්‍යාපනයෙන් ධනය උපයන්නට උත්සාහ කළ පෞද්ගලික පාසැල් හිමියන් සමග අත්වැල් බැඳගෙන ක්‍රියා කළ හැටිත් සිහිපත් වන විට ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ අභාවය නිසා අප හද පත්ලෙන් පැන නගින දුක හා වේදනාව නිවී අර පිරිස කෙරෙහි එක්තරා වෛරයක් හා වේගයක් හිතට පැන නගිනවා.

මේ පෞද්ගලික පාසැල් අධ්‍යාපනයෙන් බිහි වූ පෞද්ගලික පාසැල්වල ආදි ශිෂ්‍ය සංගම්කාරයින් මේ රටේ ජන නායකත්වය දරන තාක් කල්, මීට අවුරුදු 25 කට පමණ පෙර ගරු කන්නන්ගර මැතිතුමා යෝජනා කළ ඒ නිදහස් අධ්‍යාපන ක්‍රමයේ නියම ඵල ලබා ගන්නට බැහැ. මේ ආදි ශිෂ්‍ය සංගම්කාරයන්ගේ විජාතික සංස්කෘතිය පවතින තාක් කල් ඒ ජාතික ඇඳුම ඇන්ද ගරු කන්නන්ගර මැතිතුමාගේ නිදහස් අධ්‍යාපනයේ නියම මල් ඵල ලබා ගන්නට කවදාවත්ම බැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]
අන්න ඒ සන්දේශය වර්තමාන පරම් පරාවට දීමේ අවස්ථාව තමයි ගරු කන්නන්ගර මහතා අභාවප්‍රාප්ත වූ අවස්ථාව.

මා ශිෂ්‍යයකුව සිටි කාලයේ කන්නන්ගර මැතිතුමා එක්තරා රැස්වීමකදී කී කවියක් මට මතකයි. එතුමා සිංහල කවි මෙන්ම ඉංග්‍රීසි කවිත් කිව්වා.

Gray's "Elegy Written In a Country Church Yard" තමුන්නාන්සේත් කියවා ඇති.

"Full many a flower is born to blush unseen.
And waste its sweetness on the desert air."

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! There are a number of hon. Members who desire to speak. The hon. Member should finish his speech to enable other hon. Members also to speak. Most of the things that the hon. Member is saying are irrelevant to the Motion.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මම කථාව කෙළවර කරන්නම්.

විකසිත පුෂ්පයන් රැසක් කාන්තාරයේ වියලි වාතයෙන් මැළ වී සුගන්ධය නැති වී යන බව කන්නන්ගර මහතා ඉංග්‍රීසියෙන් කී ඒ කවි දෙපදයේ සිංහල අදහසයි. ඇත්තෙන්ම විකසිත පුෂ්පයන් රැසක් කාන්තාරයේ වියලි වාතයෙන් මැළ වී නැති වී යන සුගන්ධය මෙන් ඈත පිටිසර දුප්පත් ගොවිපලක පොල් අතු වහල යට ඉපදී බුද්ධියේ හා භාග්‍යයේ ආලෝකය නොලැබ නිවී නැති වී යන බුද්ධිමත් දරු පරපුර වෙනුවෙන් තමා නිදහස් අධ්‍යාපන යක් බිහි කළ බව කන්නන්ගර මහතා කියනවා මට මතකයි. එතුමා බිහි කළ ඒ ආලෝකය නිවී යා නොදී රැක ගැනීමයි, එතුමා වෙනුවෙන් අපට කළ හැකි ලොකුම සේවය. ඒ නිසා ඊයේ ආදාහනය කරන ලද, අද සිහි කරනු ලබන කන්නන්ගර මහතා වෙනුවෙන් මා මෙන්න මේ ප්‍රාර්ථනය කරනවා.

මේ රටේ මෙතෙක් නූපන් බුද්ධිමත් දරු පරපුර නමැති නුපුබුදු පුෂ්ප රාශිය කන්නන්ගර නාමයට පූජා වේවා! මතු අනාගතයෙහි මේ රටේ දේශපාලන කරලි යෙහි ඉදිරි අසුන් ගන්නා සදාචාර සම් පන්න දුප්පත් බුද්ධිමත් ගැමි දරුවනට නිදහස් අධ්‍යාපනය මගින් සමානාත්ම තාවයේ සුචරිත මාර්ගය හෙළි කර දුන් කන්නන්ගර නාමයට අපේ අවංක උප හාරය පිරිනැමේවා!

පූ. භා. 11.48

**පී. ජී. බී. කෙනමන් මයා.** (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)
*(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)*
(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

Mr. Deputy Speaker, on behalf of the Communist Party and myself, I should like to associate with the other hon. Members of Parliament in the expression of condolences and appreciation that have already been made on the death of Dr. C. W. W. Kannangara.

It is only natural that on this occasion the main emphasis in tribute paid should be on the most outstanding achievement of his career, namely, his introduction of the system of Free Education in this country. But I think that even if he had not been associated with so momentous a step in Ceylon's affairs, he would still be remembered with appreciation as a veteran politician and parliamentarian of this country—one who held high public office and one who discharged the duties of his office in a way that won appreciation both from political supporters and political opponents.

He had a long and distinguished record of service to the public and to public causes. Of course, Sir, all this really pales into insignificance when compared with the great contribution which he made in piloting the Free Education Scheme on to the Statute Book of this country. At that time free education was an extremely controversial measure and vested interests of various hues, including

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

those within his own party and his own Government, opposed this scheme either totally or partially, openly or surreptitiously because they realized then what everybody realizes now : that the implementation of the Free Education Scheme, whatever defects it may have had, would bring about profound social changes in this country, would bring into existence a new social stratum, namely, the Swabasha educated intelligentsia who would play an important role in the destinies of this country, a role which would definitely not be favourable to the vested interests. At that time the late Dr. Kannangara fought—I would not say a single-handed battle—a very brave and courageous battle to get free education accepted.

Even today, we, several generations later, have got to continue that struggle, first, to improve the system of free education and to make it something more than free tuition, and secondly, to block all the attempts, all the rearguard actions, to undermine, limit or withdraw the free education scheme. We have got even the World Bank advising us that such schemes are too expensive and that they should be curtailed. There are various people who still have the effrontery to suggest that this was a big mistake, but nevertheless, the elected Members of this House were, irrespective of on which side of the House they sit, all agreed that this was a very great contribution which earned for the late Dr. Kannangara the respect, the ever-lasting respect, shall I say, of the people of this country, as well as their gratitude.

And it is in that light that I would associate the Communist Party and myself with the expressions of appreciation and condolence that have already been made, with the request that a copy of these proceedings be sent to his grieving relations.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 11.51

**දයා ටී. පස්කුවල් මයා.** (මතුගම)
(*திரு. தயா ரீ. பஸ்குவல்—மத்துகம*)
(Mr. Daya T. Pasqual—Matugama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ අභාවය ගැන ශෝකය පළ කරන මේ අවස්ථාවේදී එතුමා අවුරුදු එකොළහක් තිස්සේ නියෝජනය කළ මතුගම කොට්ඨාශයේ වර්තමාන නියෝජිතයා වශයෙන් මමත් වචන කිහිපයක් ප්‍රකාශ කරන්නට අදහස් කරනවා. එතුමා හා සිටි සම කාලීනයන් වශයෙන් අගමැතිතුමාත්, කම්කරු හා ධීවර ඇමතිතුමාත්, ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාත්, වැඩි හිටි මන්ත්‍රීවරුත්, වෙනත් මන්ත්‍රීවරුත්, දිවංගත ආචාර්ය කන්නන්ගර මැතිතුමාණන්ගේ දේශපාලන ජීවිතය ගැනත්, සමාජ ජීවිතය ගැනත්, විශේෂයෙන්ම එතුමාගෙන් වූ අධ්‍යාපන සේවාව ගැනත්, පැහැදිලි විස්තරයක් කළා. එමනිසා මා දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. සාමාන්‍යයෙන් දිවංගත කන්නන්ගර මැතිතුමාණන් ගැමි ඇසට පෙනෙන, පෙණුනු ආකාරයට වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නටයි මා අදහස් කරන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආචාර්ය කන්නන්ගර මැතිතුමා මහේශාක්‍ය පරම්පරාවකට අයිති වූ කෙනෙකු නොවෙයි ; අසුවලා මගේ පියාය, අසුවලා මගේ මුත්තාය, අසුවලා මගේ මී මුත්තාය ආදී වශයෙන් ආඩම්බරයෙන් නම් සඳහන් කළ හැකි මහේශාක්‍ය පරම්පරාවකට අයිති පුද්ගලයකු නොවෙයි. ඒවාගේම කන්නන්ගර මැතිතුමා විශාල ධන සම්භාරයකට හිමිකමක් තිබුණු පුද්ගලයකුත් නොවෙයි. පස්දුන් කෝරළේ ලුල්බද්දුව නමැති පිටිසර ගමෙහි උපත ලබා, ගාලු පුරවරයට ගොස් අධ්‍යාපනය ලබා, ගුරුවරයකු වී නීතිඥ වෘත්තියටත් ඇතුළත් වී, සමාජ සේවය උදෙසා දේශපාලන ජීවිතයට පිවිසුණු එතුමා සාමාන්‍ය ගොවි පවුලක කෙනෙක්. උපන් කාලයත් එතුමා අභාවයට පත් වුන කාලයත් අතර තිබෙන්නේ එකම වෙනසයි. එනම් අභාවයට පත් වන විට එතුමා මේ රටේ මහජන සේවකයකු

[පස්කුවල් මයා.]

වශයෙන් විශාල තත්ත්වයක් ලබා ගෙන තිබීමයි. එය හැර ධනය අතින්වත් දේශ පාලන බලය අතින්වත් එතුමාට තැනක් තිබුණේ නැහැ. විශේෂයෙන්ම ගැමියන් වශයෙන් අප සතුටු වන්නේ ධනය එකතු කිරීමේ ආශාවක්වත්, දේශපාලන බලය තහවුරු කර ගැනීමේ ආශාවක්වත් නැතිව පොදු සේවයම පරමාර්ථය කරගෙන එතුමාණන් මුල සිට අග දක්වාම කළ සේවය ගැනයි.

කන්නන්ගර මැති තුමාණන් ගැන මෙහි දී ගුණ කථනය කළ සියලු දෙනාම එතුමාගෙන් වූ විශාලතම සේවය ගැන, එනම් නිදහස් අධ්‍යාපනය ගැන, වර්ණනා මුඛයෙන් කථා කළා. නමුත් මුල් අවස්ථා වේදී, නිදහස් අධ්‍යාපනය දීම ගැන එතුමාගේම කඳවුරේ බලවතුන්ගෙන් පවා විරුද්ධත්වය තිබුණාලු. පිටිසරබද ගැමි පවුලක කෙනෙකු හැටියට ධනවත් පසුබිමක් නැතිව, බලවත් දේශපාලන පසුබිමක් නැතිව, එඩිතරව සෘජුව අවංකව එතුමා ක්‍රියා කළ ආකාරය ගැන අප ආඩම්බර වෙනවා. කටුක ජීවිතයක් ගත කරමින් එතුමා හැදුණේ වැඩුණේ ඉගෙන ගත්තේ බොහොම අමාරුවෙන්. තමන් විඳි කටුක ජීවිතය වැන්නක් තවත් කෙනෙකුට විඳින්නට ඉඩක් නොතබනවාය යන අධිෂ්ඨානයෙන් එතුමා කටයුතු කළා. මා අසා තිබෙන හැටියට කන්නන්ගර මැතිතුමා අධ්‍යාපනය ලැබුවේ බාහිර උපකාර ඇතිවයි. පවුලේ ශක්තිය ප්‍රමාණවත් වූයේ නැහැ. ඒ කාලයේ කේම්බ්‍රිජ් සීනියර් විභාගයෙන් සමර්ථවීම ලොකු දෙයක්. ලංකාවෙන් පමණක් නොවෙයි පොදු රාජ්‍ය මණ්ඩලයෙන්ම පළමුවැන්නා ලෙස එතුමා සමර්ථ වූවාය කියා දැන් කියන්නට යෙදුණා. එතුමා ධනවත් පවුලකට අයත් වූවා නම් විශ්ව විද්‍යාලයකට ඇතුළු වී ඉතා උසස් තත්ත්වයක් ලබා ගන්නට තිබුණා. නමුත් එතුමා ඒ ගැන කණගාටු වූයේ නැහැ. තමා උපන් පරිසරය අනුව, තමාගේ දිළිඳුකම අනුව අධ්‍යාපනයක් ලත් එතුමා තමාට වඩා අවාසනාවන්ත ජනතාවට සහනයක් ලබා දීමේ අධිෂ්ඨානයෙන් කටයුතු කළා. ධනවාදීන්ගේත් තමන්ගේම කඳවුරේ බලවතුන්ගේත් අධ්‍යාපනයේ නාමයෙන් මුදල් ගරා ගත් උදවියගේත් විරුද්ධත්වය මධ්‍යයේ නිදහස් අධ්‍යාපනය දීම සඳහා එතුමා දැඩි අධිෂ්ඨානයෙන් ක්‍රියා කළා. අප කවුරුනුත් එහි අගය දන්නවා. නිදහස් අධ්‍යාපනයෙන් රටේ පිබිදීම ඇති වුණා. ඒ ඇරුණු ඇස් පියවෙන්නට ඉඩ නොතැබීමට අප ක්‍රියා කළයුතුයි.

මතුගම මන්ත්‍රීවරයා වශයෙන් කන්නන්ගර මහතා අවුරුදු 11 ක් සේවය කළා. ඒ කාලයේ එතුමා අධ්‍යාපන ඇමති වරයා වශයෙන්ද සිටියා. ඇත්තෙන්ම එතුමා පෘථග්ජන ගතියට ඇබ්බැහි නොවී ක්‍රියා කර තිබෙන ආකාරය ගැන මට පුදුමයි. තමා පොදු පළල් සේවයක් සඳහා කැප වී සිටින පුද්ගලයකු බව තේරුම් ගෙන එතුමා වැඩ කළා. පළමුවෙන් පටන් ගත් මතුගම මධ්‍ය මහා විද්‍යාලය කැපී පෙනෙන තත්ත්වයකට පත් කරන්නට එතුමා ක්‍රියා කළේ නැහැ. තමා අධ්‍යාපන ඇමතිවරයා වුණත් තමා නියෝජනය කරන කොට්ඨාශයේ මධ්‍ය මහා විද්‍යාලය කැපී පෙනෙන තත්ත්වයකට පත් කරන්නට එතුමා ක්‍රියා කළේ නැහැ. සමහරුන් නම් අධ්‍යාපන ඇමති පදවියට පත් වූ විට තමා නියෝජනය කරන කොට්ඨාශයේ විශ්ව විද්‍යාලයක් හෝ ගුරු අභ්‍යාස විද්‍යාලයක් හෝ පිහිටුවන්නට ක්‍රියා කරනවා. එසේ නැත්නම් පාඨශාලා සඳහා තට්ටු දෙකේ තුනේ ගොඩනැගිලි ගහනවා. එහෙත් මේ උත්තමයා තුළ එවැනි පටු හැඟීම් තිබුණේ නැහැ.

නිදහස් අධ්‍යාපනය ඇති කිරීම සඳහා එතුමා දේශ දේශාන්තරවලට ගොස් කරුණු සොයා බැලුවේ නැහැ. බටහිරෙන් ගොස් නැගෙනහිරෙන් ආවේ නැහැ. උපන් ගමේ සිට, උපන් රටේ සිට නිදහස් අධ්‍යාපනය ඇති කිරීම සඳහා එතුමා ක්‍රියා කළා. එතුමා එක් වරක් ඉන්දියාවට ගියා යයි මා හිතනවා. 1947 මහා මැතිවරණයෙන් පැරදුණාට පසුව ඉන්දුනීසියාවටත් ගිහින් ආවා. ඒ හැර නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීම සඳහා නොයෙක් නොයෙක් වාර්තා බලන්නට ඕනෑයයි කියමින් එතුමා පිටරට ගියේ නැහැ. ගමේ ඉපදී, ගමේ හැදී ගමේ භාෂාවෙන් කථා කළ එතුමාට රටට ගැළපෙන නිදහස් අධ්‍යාපනයක් සකස් කරන්නට පුළුවන් වුණා. තවමත් එහි අඩුපාඩුකම් සකස් කර ගන්නට අපට පුළුවන් වී නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කන්නන්ගර මහතාගේ අභාවය ගැන අප බෙහෙවින් කණගාටු වෙනවා. මහේශාක්‍ය පසුබිමක් නැති පුද්ගලයකුට ගමේ ඉපදී ගමේ හැදී වැඩුණු පුද්ගලයකුට ධනපතියන්ට ගැති නොවී, තමාගේ උරහිස මත තමාගේ හිස තබාගෙන, එඩිතරව ඉන්නට පුළුවන් වීම ගැන නම් අප සතුටු වෙනවා. ඇත්තෙන්ම එතුමා ධනපතියන්ට අතපෑවේ නැහැ. අවසාන කාලයේදී දිළින්දකු වශයෙන් සිටියත් එතුමා ධනපතියන්ට අත පෑවේ නැහැ. එතුමාගේ ජීවිතය අප කාටත් ආදර්ශයක්. එතුමා වෙනුවෙන් මුළු රටම ශෝක වන අතර බටහිර හා නැගෙනහිර පස් යොදුන් කෝරළ එතුමා වෙනුවෙන් විශේෂයෙන් ශෝක වෙනවා. නිදහස් අධ්‍යාපනය නමැති අගනා තෑග්ග රටට දීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1947 මහා මැතිවරණයේ දී එතුමා පරාජයට පත් වුණා. නොයෙක් බල වේග එතුමාට විරුද්ධව ක්‍රියාත්මක වීම නිසා එසේ සිදු වුණා. නිදහස් අධ්‍යාපනයට විරුද්ධව පැවති බල වේග 1947 මහා මැතිවරණයේදී එතුමාගෙන් පලිගත්තා. මේ ජාතියේ පිබිදීම ඇති කළ මෙම පුද්ගලයා එම පළිගැනීම උඩ දේශපාලන වශයෙන් 1947 දී අභාවයට පත් වුණා. සමාජවාදයේ මුහුණුවරින් එසේ කළාය යන්නයි අපට දැන ගන්නට ලැබුණේ. එම සමාජවාදී මුහුණුවර කුමක්ද යන්න අද එළිදරව් වී තිබෙනවා. කෙසේ වෙතත්, පස්දුන් කෝරළේ ජනතාව නැවත 1952 දී එතුමා ඉන්දුනීසියාවෙහි සිට ආපසු ගෙන්වා ගෙන අගල වත්ත මන්ත්‍රීවරයා වශයෙන් පත් කර ගත්තා. පස්දුන් කෝරළ වාසීන් තමන්ගේ යුතුකම ඒ අයුරින් ඉටු කළා. එතුමාගේ අභාවය ගැන ප්‍රදේශ වාසීන් අද බලවත් සේ ශොකයට පත් වෙනවා.

තමන්ගේ කොට්ඨාශය හදන්නට හෝ තමන්ගේ ඥාතීන් හදන්නට හෝ තමා බලය යොදවන්නේ නැතුව තමන් පොදු පුද්ගලයකු වශයෙන් සලකා ගෙන එතුමා සේවයෙහි යෙදුණා. එය මුළු රටටම ආදර්ශයක්. එතුමාගේ අභාවය පිළිබඳව මෙනෙහිකොට ශොක වන හැම දෙනා සමගම අපත් ශොක වන බව කියයුතුයි. එසේ ශොක වන අතරම එතුමාට නිවන් සම්පත් ලැබේවායි ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

While I associate myself with the sentiments expressed by both sides of the House on the death of Dr. C. W. W. Kannangara, ex-Member of Parliament, I wish to add that many men have appeared on the political scene since the dawn of this century, but few have left their indelible mark in the history of this country, Dr. Kannangara is one of those illustrious few. His services to the country were many and varied but it may be said of him that he was the father of the educational revolution in this country which made it possible for the poorest boy or girl from the humblest home to climb up to the highest rung of the educational ladder in this country.

I shall request the Acting Clerk of the House to make a minute of the Proceedings of the Meeting today and send a copy thereof to the members of the bereaved family.

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

සවස 2න් පසු කන්නන්ගර මැතිතුමාගේ අභාවය ගැන කතා කරන්නට ඉඩ දෙනවාද ?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I must tell the hon. Member that all parties have spoken sufficiently on this Motion.

**එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)
*(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர—எல்பிற்றிய)*
(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

විශෙෂයෙන් මා නැගී සිටියේ ශ්‍රෙෂ්ඨ ජනනායකයෙකුගේ අභාවය සිදු වී තිබෙන මෙම අවස්ථාවේදී—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

If hon. Members do not co-operate by making their speeches short, then it is not my fault that some hon. Members have not been able to speak on this Motion.

## කෙටුම්පත් පනත් පිළිගැන්වීම

*சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்*

## BILLS PRESENTED

### කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතන (සංශෝධන) පනත් කෙටුම්පත

கமத்தொழில் கைத்தொழில், கடன் கூட்டுத்தாபன (திருத்தம்) மசோதா

AGRICULTURAL AND INDUSTRIAL CREDIT CORPORATION (AMENDMENT) BILL

"to amend the Agricultural and Industrial Credit Corporation Ordinance".

පිළිගන්වන ලද්දේ මුදල් ඇමති ගරු එන්. විමලසේන විසිනි. 1969 සැප්තැම්බර් 29 වන සඳුද දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

பதில் நிதி அமைச்சர் கௌரவ என். விமலசேன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1969 செப்ரெம்பர் 29, திங்கட்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. N. Wimalasena, Acting Minister of Finance; to be read a Second time upon Monday, 29th September 1969 and to be printed.*

### ලංකා රජයේ උකස් බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත

இலங்கை அரச ஈட்டு வங்கி (திருத்தம்) மசோதா

CEYLON STATE MORTGAGE BANK (AMENDMENT) BILL

"to amend the Ceylon State Mortgage Bank Ordinance."

පිළිගන්වන ලද්දේ මුදල් ඇමති ගරු එන්. විමලසේන විසිනි. 1969 සැප්තැම්බර් 29 වන සඳුද දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

பதில் நிதி அமைச்சர் கௌரவ விமலசேன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1969 செப்ரெம்பர் 29, திங்கட்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்படவேண்டுமெனவும் ஆணையிடப்பட்டது.



*Presented by the Hon. N. Wimalasena, Acting Minister of Finance; to be read a Second time upon Monday, 29th September 1969 and to be printed.*

### පරිපාලන දිස්ත්‍රික්ක (සංශෝධන) පනත් කෙටුම්පත

நிர்வாக மாவட்டங்கள் (திருத்தம்) மசோதா

ADMINISTRATIVE DISTRICTS (AMENDMENT) BILL

"to amend the Administrative Districts Act."

පිළිගන්වන ලද්දේ ස්වදේශ කටයුතු ඇමති වෙනුවට කර්මාන්ත හා ධීවර ඇමති ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන විසිනි. 1969 සැප්තැම්බර් 29 වන සඳුද දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

உள்நாட்டு விவகார அமைச்சர் சார்பாக கைத்தொழில், கடற்றொழில் அமைச்சர் கௌரவ டி. பீ. ஆர். குணவர்தன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1969 செப்ரெம்பர் 29, திங்கட்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது

*Presented by the Hon. D. P. R. Gunawardena, Minister of Industries and Fisheries on behalf of the Minister of Home Affairs; to be read a Second time upon Monday, 29th September 1969 and to be printed.*

### තේ සහ රබර් ආධාර මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත

தேயிலை, இறப்பர் மானியம் (திருத்தம்) மசோதா

TEA AND RUBBER SUBSIDY (AMENDMENT) BILL

"to amend the Rubber Replanting Subsidy Act (Chapter 437) and the Tea Subsidy Act, No. 12 of 1968."

පිළිගන්වන ලද්දේ කෘෂිකර්ම හා ආහාර ඇමති ගරු. එම්. ඩී. බණ්ඩා විසිනි. 1969 සැප්තැම්බර් 29 වන සඳුද දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, නියෝග කරන ලදී.

விவசாய, உணவு அமைச்சர் கௌரவ எம். டி. பண்டா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1969 செப்ரெம்பர் 29, திங்கட்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. M. D. Banda, Minister of Agriculture and Food; to be read a Second time upon Monday, 29th September 1969 and to be printed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

### சபை அலுவல்

### BUSINESS OF THE HOUSE

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That notwithstanding the provisions of Standing Order No. 24, the motions appearing as items 2, 6 to 12, 22, 23, 27 and 31 on the Paper be proceeded with this day."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayake)

Sir, we are objecting to that. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන අප විරුද්ධයි. මෙහි සඳහන් වන කරුණු පිළිබඳව අපට කල් දී තිබෙන්නේ අද උදේ බව තමුන්නාන්සේට පෙනී යනවා ඇති. මාසයකට වැඩි කලක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය රැස්වුණා. එම නිසා මේවා කලින් ඉදිරිපත් කර තිබුණා නම් අපට සාකච්ඡා කරන්නට අවස්ථාව ලැබෙනවා. එහෙත් හදිසියේම මෙසේ ඉදිරිපත් වීම නිසා අපට මේවා ගැන සම්පූර්ණ සාකච්ඡාවක යෙදෙන්නට බැහැ. එම නිසා මෙම යෝජනාවට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරන අතරම මෙය අස් කර ගන්නා හැටියට මතක් කරනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

අප නිතරම වාගේ රජයේ කටයුතුවලට සහයෝගය දුන් බව තමුන්නාන්සේ දන්නවා ඇති. එහෙත් එම සහාය දීම පිළිබඳව එක්තරා විධියකට හෝ සැළකිල්ලක් නොදැක්වීම ගැන අප කනගාටු වෙනවා. අපි හැමදාම වාගේ රැස් වුණා. මේවා ඉදිරිපත් කරන්නට ඒ අවස්ථාවලදී පුළුවන්කම තිබුණා. සම්ප්‍රදාය කෙසේ වෙතත්, න්‍යාය පත්‍රය ඉදිරිපත් කරන විට එක්තරා විධියක දැනුම්දීමක් වත් කරන්නට තිබුණා. දැන් හදිසියේම ඉදිරිපත් කරනවා. එම නිසා වගකීමක් ඇතුව අපට මේවා ගැන සාකච්ඡා කරන්නට බැහැ. අපේ අදහස් සමහරවිට ආණ්ඩුවට බොහොම ප්‍රයෝජනවත් වන්නට පුළුවනි. විපක්ෂයේ අදහස් නිෂ්ප්‍රයෝජන වන්නේ නැහැ. එසේ හෙයින්, මෙම වැඩ පිළිවෙල කෙරෙහි අපේ විරුද්ධතාව අප ප්‍රකාශ කරනවා. මේවා ඉල්ලා අස් කර ගන්නා ලෙසයි මා කියා සිටින්නේ.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Can we get a statement from the Government as to exactly what is intended ? It has been pointed out that certain matters are being sprung on us. If the Government intends only disposing of non-controversial or, shall I say, slightly controversial items, that is another matter, and certainly we can co-operate. But if entirely new matters, some of them of some importance, are to come up, this will be an endless debate. So I hope only non-controversial matters will be taken up.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Items 2, 6 to 12, 22, 23 27 and 31 have not been given notice of earlier, I admit.

What happens if the House does not pass these Votes now is that, where money has been spent, they become Excess Votes, and without any Debate in the House, when we bring the Excess Votes Resolutions, they become legalized. Now we are giving the House an opportunity of discussing those matters before passing them. If they agree with us that the items which the Hon. Leader of the House has moved should be dropped, in regard to which money has been spent, they will not even know why the money has been spent. I know that the Excess Votes Resolutions are not

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

discussed by anybody. We are giving them an opportunity of getting some knowledge about monies that are being spent or monies that are to be spent.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

The Public Accounts Committee will report to the House on them.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Nobody reads that Report.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Some people do.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்஭ா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

We can meet tomorrow.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

We cannot meet tomorrow. We want to pass this Motion, and once it is passed let us take up the items mentioned in the Motion. If there are any matters which are controversial or which, according to you, should not be discussed today, we shall drop them.—[*Interruption*]. When the Minister explains you will know what the items are. For example, item No. 2 deals with " Sravasti ". If you want to know something about it, we shall explain it. If you say, " No, we do not want any explanation, we are opposing it ", then it will become an Excess Vote. Without anybody knowing the money will be spent and the matter will come up as an Excess Vote. Now we are giving you the chance of discussing something about it. If you are going to look a gift horse in the mouth, well and good. We are prepared to accept what you say, but to give you a chance of finding out what these items are let us first pass this Motion. Then we can take up the items mentioned in the Motion. If you say you do not want a particular item taken up we shall not move it, or we shall take it up and after the explanation adjourn the Debate. Then it will become an Excess Vote. That is what the Deputy Leader of the Opposition suggested and we are agreeing to that proposal. But if you want any matter discussed to some extent then you must first pass the Motion. If you do not want any discussion at all, if you do not want to know what any particular item is all about, we are all with you.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

මේවා මේ අන්දමට ඉදිරිපත් කළාම මේවා ගැන පරීක්ෂා කර බැලීම සඳහා අපට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. මුදල් ඇමතිවරයා වේවා වෙනත් ඇමතිවරයෙක් වේවා කරුණු විස්තර කළ පමණින්ම අපට විවාදයක් සඳහා සූදානම් වන්නට බැහැ. කුමක් හෝ අවස්ථාවක් ලබා දෙන්නට උත්සාහ දැරීම ගැන අප සන්තෝෂ වෙනවා. එහෙත් ඒක හරියට කොකාට අඩගහලා පිඟානකට සුප් දුන්නා වැනි වැඩක්. හොඳට කරුණු සොයා බලා මෙම විවාදයට සහභාගි වන්නට අවස්ථාවක් දෙනවා නම් හොඳයි. හෙට රැස් වුණොත් අපට ඒක කරන්නට පුළුවනි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

We cannot sit tomorrow—[*Interruption*]. කැමට පස්සේ අපි වාඩි වෙමු. කාල කවුද නිදා ගන්නෙ.

If the Motion is passed any matter that you do not want taken up will be put off. The Minister will move, it, and if you think that you are not satisfied by his moving it, we shall put it off.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

Let us put off all the items presented today.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

If the money has already been spent it will become an Excess Vote. If it has still to be spent we shall put it off and bring it up in the new financial year.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

Why not allow hon. Members to discuss these matters, adjourn at 8 p.m., then go for the dinner, and start again tomorrow ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Let us see as we go on, but I am confident that that situation will not arise.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

ගරු. සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I move,

"That the proceedings on items 1 to 32 of Public Business appearing on the Paper be exempted at this day's sitting from the provisions of Standing Order No. 8."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

சபை அமர்வு

SITTINGS OF THE HOUSE

ගරු. සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I move,

"That this House at its rising this day do adjourn until 2 P.M. on Tuesday, 21st October 1969".

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

පෞද්ගලික මන්ත්‍රිවරුන්ගේ යෝජනා න්‍යාය පත්‍රයේ ගොඩගැසී තිබෙනවා. මී ළඟ රැස්වීම ලබන මස 6 වැනිදා පැවැත්වෙන බව කලින් දැනුම් දී තිබුනා. දැන් 21 වැනිදා තෙක් කල් දමනවා නම් පෞද්ගලික මන්ත්‍රිවරුන්ගේ යෝජනාවලට කිසිම ඉඩක් ලැබෙන්නෙ නැහැ. අය-වැය විවාදයේ කාරක සභා අවස්ථාවේදී කළා වගේ ගණපූරණය නැති වුණත් දෙපක්ෂයේම සහයෝගය ඇතිව පෞද්ගලික මන්ත්‍රිවරුන්ගේ යෝජනා දිනයේදී රැස්වීම පවත්වාගෙන යාමට තීරණය කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

There are two matters I would like to refer to. The first is that the Hon. Minister of State has conceded that the question whether we sit tomorrow or not can be finally decided later on.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

No.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

As I understood him, what he said was that he is confident that the situation will not arise but nevertheless we can examine the position at 8 o'clock, probably before dinner. That is my understanding of what he said. Probably other hon. Members also think so.

If that is so, should we not accept this Motion with the proviso that unless the House decides otherwise we adjourn till the 21st October, thereby giving the House the opportunity to review the situation at the end of the day's proceedings today. Otherwise, this Motion if accepted will preclude any other arrangement.

Therefore, Sir, I move formally the inclusion of the words, "unless the House decides otherwise."

I also want to point out that there is still a state of Emergency which has to be reported to the House.

ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)
*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*
(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

It has been revoked.

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Has it already been revoked? I do not know. Or are you asking me to revoke the state of Emergency?

ගරු එම්. ඩී. බණ්ඩා
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

Revoked.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

What is your amendment?

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

My amendment is to add the words, "unless the House decides otherwise".

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

By a majority?

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Obviously.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

We accept that amendment.

ප්‍රින්ස් ගුණසේකර මයා.
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඔක්තෝබර් 21 වැනිදා ඊ ළඟ රැස්වීම පවත්වන්නට තීරණය කරනවා නම් පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා පිළිබඳ දිනයට සිදු වන්නෙ මොකක්ද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Party leaders discussed this matter and agreed on 21st October.

ප්‍රින්ස් ගුණසේකර මයා.
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

එසේ වුණාම සිදු වන්නේ ඔක්තෝබර් මාසයට පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා පිළිබඳ දිනයක් නැතිව යාමයි. දෙපක්ෂය සහයෝගයෙන් වැඩ කරන වාය කියන්නේ මේකද? මේ පාර්ලිමේන්තු වාරයට පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා සඳහා තිබුණු පළමු වැනි දිනය ඔක්තෝබර් 6 වැනිදයි. එදවවත් අප රැස්වන්නෙ නැත්තෙ මක් නිසාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Is the hon. Member opposing the Motion as amended as well?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேகர)*
(Mr. Prins Gunasekera)

ඒ දිනයත් ඇතුළු කරන්නය කියායි මා කියන්නේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

No.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேகர)*
(Mr. Prins Gunasekera)

න්‍යාය පත්‍රයේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා ගොඩගැසී තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Would the Government consider giving this day for Private Members' motions?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

No.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேகர)*
(Mr. Prins Gunasekera)

ඔක්තෝබර් 21 වැනිදායින් පස්සෙ දවසක්වත් දෙන්න බැරිද? [බාධා කිරීමක්] එසේ නම් විරුද්ධ පාර්ශ්වයෙන් සහයෝගයක් බලාපොරොත්තු වෙන්න එපා.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

I move,

"In line 1, after 'That' insert "unless this House decides otherwise today,' "

**එම වචන එතැනට එකතු කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

அந்தச் சொற்கள் இங்கே சேர்க்கப்பட வேண்டும் எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question, that those words be there inserted, put, and agreed to.*

**මුල් ප්‍රශ්නය, සංශෝධිතාකාරයෙන් එනම්:**

திருத்தப்பட்டவாறு பிரதான வினா அதாவது :

*Main Question, as amended, viz:*

"That, unless this House decides otherwise today, this House at its rising this day do adjourn until 2 P.M. on Tuesday, 21st October, 1969."

**විමසන ලදින්, සභාසම්මත විය.**

விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පණත් කෙටුම්පත්

*தனி அங்கத்தவர் மசோதா*

## PRIVATE MEMBERS' BILLS

### YOUNG MEN'S BUDDHIST ASSOCIATION, MATARA (INCORPORATION) BILL

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාතර තරුණ බෞද්ධ සමිතිය ව්‍යවස්ථා ගත කිරීම සඳහා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුයයි මා යෝජනා කරනවා.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

**විසින් සථිර කරන ලදී.**

அனுவதித்தார்.

*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙටුම්පත් පනත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ කෙටුම්පත් පනත අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு அச்சிடப்படப் பணிக்கப்பட்டது.

மசோதா, நிலையற்கட்டளை இல. 51 (4) இன்படி கல்வி, கலாசார விவகார அமைச்சருக்கு, அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 51 (4), to the Minister of Education and Cultural Affairs, for report.*

## YOUNG MEN'S BUDDHIST ASSOCIATION, WADDUWA (INCORPORATION) BILL

**එඩ්මන් විජේසූරිය මයා.** (මස්කෙළිය)
*(திரு. எட்மண்ட் விஜேசூரிய—மஸ்கெலிய)*
(Mr. Edmund Wijesuriya—Maskeliya)

I move,

"That leave be granted to introduce a Bill to incorporate the Young Men's Buddhist Association, Wadduwa'."

**එස්. බී. ලේනව මයා.** (කැකිරාව)
*(திரு. எஸ். பி. லேனவ—கக்கிராவ)*
(Mr. S. B. Lenawa—Kekirawa)

විසින් ස්ථිර කරන ලදී.

அனுவதித்தார்.

*seconded.*

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

කෙටුම්පත් පනත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ කෙටුම්පත් පනත අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு அச்சிடப்படப் பணிக்கப்பட்டது.

மசோதா நிலையற்கட்டளை இல. 51 (4) இன்படி கல்வி, கலாசார விவகார அமைச்சருக்கு, அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.



*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 51 (4), to the Minister of Education and Cultural Affairs, for report.*

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order please! The Sitting is suspended till 2 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

*Sitting accordingly suspended till 2 P.M. and then resumed.*

## පරිපූරක මුදල: පොදුරාජ්‍ය මණ්ඩලයේ පාර්ලිමේන්තු සංගමයේ ලංකා ශාඛාවට ආධාර මුදල්

*குறை நிரப்புத் தொகை: பொதுநலக் குடியரசு பாராளுமன்றச் சங்கத்தின் இலங்கைக் கிளைக்கு நன்கொடை*

## SUPPLEMENTARY SUPPLY: GRANT TO CEYLON BRANCH OF COMMONWEALTH PARLIAMENTARY ASSOCIATION

**ගරු විමලසේන**
*(கௌரவ விமலசேன)*
(The Hon. Wimalasena)

I move,

"That a supplementary sum not exceeding Rupees Ten (Rs. 10) (Token provision) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto:

*Schedule*

| | *Rs.* |
|---|---|
| Head 6—House of Representatives. | |
| Vote No. 2—Administration Charges—Recurrent expenditure .. | 10" |
| | (Token provision) |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

**ප්‍රින්ස් ගුණසේකර මයා.**

*(திரு. பிறின்ஸ் குணசேக்கர)*

(Mr. Prins Gunasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන කථා කරන්ට ඕනෑ.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

I have already put the Question to the Vote and the item has been passed.

## පරිපූරක මුදල: "ශ්‍රාවස්ති" වියදම් සඳහා දීමනා

*குறைநிரப்புத் தொகை : 'சிராவஸ்தி' யை நடாத்துவதற்கான கொடை*

## SUPPLEMENTARY SUPPLY: GRANT TOWARDS RUNNING EXPENSES OF 'SRAVASTI'

**ගරු විමලසේන**

*(கௌரவ விமலசேன)*

(The Hon. Wimalasena)

I move,

"That a supplementary sum not exceeding Rupees Seventy-nine thousand (Rs. 79,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the services of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto:

*Schedule*

| | *Rs.* |
|---|---|
| Head 6—House of Representatives. | |
| Vote No. 2—Administration Charges—Recurrent Expenditure .. | 79,000" |

Of the grant of Rs. 125,000 provided in the current year's Estimates, a sum of Rs. 112,000 is solely required for the payment of salaries, overtime, interim allowances, etc. to staff. The balance left is only Rs. 13,000. To this when you add the anticipated revenue, it totals up to Rs. 98,000. This sum goes to meet the expenditure on food, electricity, gas, uniforms, and so on. The amount required for these items of expenditure is Rs. 777,000. This includes an unpaid bill of Rs. 43,883 which has been carried forward from the previous year.

The Supplementary Supply will be used for paying up unpaid bills and also provide for expenditure for the rest of the financial year. During the course of the year ten additional employees had to be recruited to introduce an eight-hour duty shift. That is the reason why the expenditure on staff has gone up.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

අ. භා. 2.05

**ප්‍රින්ස් ගුණසේකර මයා.**

*(திரு. பிறின்ஸ் குணசேக்கர)*

(Mr. Prins Gunasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද්ද නියමිත පරිපූරක ඇස්තමේන්තු රාශිය කින් දෙවැන්න ගැනයි මේ විවාද වෙන්නේ. පළමුවෙනි එක විවාදය පටන් ගන්නටත් පෙර සම්මත වූ බව ඔබතුමා දැනුම් දුන් නිසා ඒ ගැන වචනයක්වත් කියන්නට අවස්ථාවක් ලැබුණේ නැහැ. මෙතරම් ඉක්මණින් මේ මුදල් සම්මත කර ගැනීමට ආණ්ඩුවට තිබෙන ඕනෑකම ගැන විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරන්නට ඕනෑ. පළමුවෙනි පරිපූරක ඇස්තමේන්තුවෙන් යෝජනා කර තිබෙන්නේ රු. 10 ක බොහොම සුළු මුදලක්. අපි පටන් ගන්නෙ සුළුවෙන් වුණත්, කෙළවර වෙන්නේ කෝටි ගණනක් ඉවර කරලයි.

**ගරු විමලසේන**

*(கௌரவ விமலசேன)*

(The Hon. Wimalasena)

නැහැ. රු. 1,400 යි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

දෙවෙනි යෝජනාවේ රු. 79,000 ක් ඇතුළත් වී තිබෙනවා. පළමුවෙනි එකේ රු. 10 යි. අදට සාකච්ඡාවට ගන්නට නියමිත ඇස්තමේන්තු දෙස බැලුවොත්, 23 වෙනි යෝජනාව හරියට එන විට ඔබතුමාට පෙනී යනවා ඇති, කෝටි කියක් වෙන් කරන්නටද කියා අද මේ පාර්ලිමේන්තුව රැස් කර තිබෙන්නේ. 23 වෙනි යෝජනාව අනුව රු. 18,13,72,694 ක් වෙන් කරන්නට බලාපොරොත්තු වෙනවා. මේවා කජු ඇට නොවෙයි, කොස් ඇට නොවෙයි, දොඹ ඇට නොවෙයි. ස්ථාවර අනපනත් තාවකාලිකව අත් සිටුවා කොහොම හරි අද සම්මත කර ගන්නට ඕනෑ කියන මුදල් ප්‍රමාණය රුපියල් විසිකෝටියකට ඉතා ආසන්නයි. අපේ වාර්ෂික අයවැය ලේඛනය රුපියල් 200 කෝටියයි. අද මේ පාර්ලිමේන්තුව රැස්වන පැය 5 ඇතුළත සම්මත කර ගන්නට උත්සාහ කරනවා, රුපියල් විසි කෝටියක්. පැය 5 කුත් නැහැ. මියගිය කන්නන්ගර හිටපු අධ්‍යාපන ඇමති තුමාගේ ගුණ කථනයට මුළු උදය වරුවම ගත වුණා. පැය 2 ක් එතනින් ඉවරයි. දැනට පැය 3 ක් පමණයි ඉතිරිව තිබෙන්නේ. පැය 3 කින් කෝටි 20 ක් සම්මත කර ගන්නටයි උත්සාහ දරන්නේ.

අපේ රාජ්‍ය ඇමතිතුමා පසුගිය දවස්වල වටිනා අදහසක් ඉදිරිපත් කළා. මේ මන්ත්‍රී මණ්ඩලය මහජන මුදල් වැය කිරීමේ ආරක්ෂකයා හැටියට ක්‍රියා කළ යුතුයයි එතුමා ප්‍රකාශ කළා. "Custodian of Public Funds" මට මතක හැටියට එතුමා සඳහන් කළේ එහෙමයි. එහෙත් අද මේ ස්ථාවර නියෝග හදිසියේ අත්හිටුවා රුපියල් 20 කෝටියක් පැය 3 කින් සම්මත කර ගන්නට උත්සාහ කිරීමෙන් අදහස් වෙන්නේ, පෙනී යන්නේ, පැහැදිලි වෙන්නේ, මහජන මුදල් වියයහිදම් කිරීම පිළිබඳව මහජන මන්ත්‍රී මණ්ඩලයේ කොයිතරම් පාලනයක් තිබෙනවාද, නැද්ද යන්නයි. රුපියල් 200 කෝටියක වාර්ෂික අයවැය ලේඛනය සම්මත කර ගැනීම සඳහා සුමාන තුන-හතරක් විවාද කරනවා. එයින් දහ පංගුවක් වන රුපියල් කෝටි 20 ක් අනුමත කර ගන්නට පැය 3 ක් වෙන් කර තිබෙනවා. මේක සාධාරණද? හැමවිටම පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන සඳහන් කරමින් තමුන්නාන්සේලා විරුද්ධ පාර්ශ්වයේ සහයෝගය බලාපොරොත්තු වෙනවා. විරුඬ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, පාර්ලිමේන්තු ක්‍රමය තවදුවරටත් පවත්වා ගෙන යාමට සහයෝගය දෙන්නය කියා. එහෙත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගේ මූලික පරම අයිතිවාසිකමක් වන පෞද්ගලික මන්ත්‍රීන්ගේ දිනය වෙනුවට පවා වෙන දිනයක් මේ ආණ්ඩු පක්ෂයෙන් ඉල්ලා ගන්නට පුළුවන් කමක් නැහැ.

මේ වාරයේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා සඳහා වෙන් කළ දිනය කපා හැර වෙන දවස් තුනක රැස්වීම් පවත්වන්නට යනවා. පාර්ලිමේන්තු ක්‍රමය ආරක්ෂා කරන්නට ඕනෑය, මෙතරම් හොඳ ජනසම්මතවාදී පාලන ක්‍රමයක් ලෝකයේ වෙන කොහේවත් නැත කියා උදන් අණන මේ ආණ්ඩුව පාර්ලිමේන්තු ක්‍රමයට . සලකන්නේ මෙහෙමයි. මේ මුදල් සම්මත කරන්නට ඕනෑ, මේ පාර්ලිමේන්තුවෙන් නේද? රුපියල් 20 කෝටියක් පැය 3 කින් සම්මත කර ගන්නට ඕනෑය කිව්වාම කොයිතරම් වේගයෙන් සම්මත කර ගන්නට ඕනෑද?

ගණන් හදා බලන්න. රුපියල් කෝටි විස්සක් සම්මත කර ගැනීමට ගත කරන්නට බලාපොරොත්තු වන කාලය පැය තුනයි. එතකොට, පැයකදී මේ ආණ්ඩුව සම්මත කර ගන්නට යන්නේ කෝටි හය හමාරයි. පැයකට කෝටි හයහමාරක් වුණාම විනාඩියකට කොපමණද? පැයකට විනාඩි හැටක් තිබෙනවා. එහෙම නම්, විනාඩි හැටක් ඇතුළත සම්මත කර ගන්නට යන්නේ රුපියල් කෝටි හයහමාරයි. කෝටි හයහමාරක් කියන්නේ ලක්ෂ වලින් නම් හයසිය පණහයි. හොඳයි, ඒ ගණන ලක්ෂ හයසියයක් හැටියට අපි ගණන් ගනිමු. පැයකට ලක්ෂ හයසියයක් වුණාම විනාඩියකට ලක්ෂ දහයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනවා. ඒ අනුව තත්පරයකට කොප මණ මුදලක් සම්මත කර ගන්නට මේ ආණ්ඩුව බලාපොරොත්තු වෙනවාද? මා කථා කරන්නට පටන් ගත් වෙලාවේ සිට මෙතෙක් ගත වූ කාලය ඇතුළත ලක්ෂ කියක් සම්මත කරවා ගන්නටද මේ ආණ්ඩුව බලාපොරොත්තු වුණේ? මේ විවාදය කෙළවර වන විට කොපමණ මුදලක් සම්මත කර ගන්නට බලාපොරොත්තු වෙනවා දැයි කල්පනා කර බැලිය යුතුයි. පාර්ලිමේන්තුවෙන් මහජන මුදල් පාලනය වෙනවාය කියන්නේ මෙවැන්නක් කරන්නටද? අද දින න්‍යාය පත්‍රයේ තිබෙන 23 වැනි යෝජනාව දෙස බලන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

May I remind the hon. Member that under the Standing Orders when a Member is discussing a Supplementary Estimate he must confine his observations strictly to the subject under discussion. I have allowed the hon. Member five minutes to deal with general matters. But we must follow Standing Orders.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

සථාවර අනපනත් තාවකාලිකව අත් සිටුවායි කථා කරන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The House has passed that Motion.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
Mr. Prins Gunasekera)

ගරු රාජ්‍ය ඇමතිතුමාට වුවමනා විධියටයි එය කර තිබෙන්නේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මට නොවෙයි, වැඩි දෙනාට.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඔව්, කරුමෙට වැඩි දෙනා වෙලා ඉන්නවා තමයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඒක මහජනයාගෙන් අහන්න ඕනෑ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මේ ඔක්කොම ළඟදී කෙළවර වෙලා යනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ගරු මන්ත්‍රීතුමා කොහොමද ආවෙ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මොකක්ද මේ දෙවැනි යෝජනාවෙන් කියවෙන්නේ? තුන්වැනි යෝජනාවට ආවාම මන්ත්‍රීවරුන්ට දී තිබෙන වරප්‍රසාද ගැන අපි දිගින් දිගටම කථා කරමු. ශ්‍රාවස්තිය වෙනුවෙන් මූලික පහසුකම් වගයක් ගැන මේ යෝජනාවේ සඳහන් වෙනවා. එහෙත්, ඒ හැම දෙයකටම වඩා මූලික වරප්‍රසාදයක් තමයි නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේදී කථා කිරීමේ අයිතිය. පරිපූරක ඇස්තමේන්තුවක් මගින් මේ තරම් මුදලක් වෙන් කරන අවස්ථාවක මහජන මන්ත්‍රී මණ්ඩලයේ දී තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට—නිරවුල්ව සහ නිදහස්ව අදහස් ප්‍රකාශ කිරීමට—අයිතියක් අපට තිබෙන්නට ඕනෑ. මේ අයිතිය අහිමි වන තත්ත්වයක් ඇති වූ නිසා පසුගිය අයවැය විවාදයේදී මන්ත්‍රීවරුන් කී දෙනෙක් තමන්ගේ විරුද්ධත්වය පළ කර සිටියාද යන්න තමුන්නාන්සේ දන්නවා. ඇතැම් මන්ත්‍රීවරුන්ට කථා කරන්නට ඉඩ ලැබුණේ නැතැයි විරුද්ධත්වය පළ කර සිටියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

මේ යෝජනාවෙන් කියවෙන්නේ කුමක්දැයි ඒ සමග ඇති විස්තරය අපි දැන් බලමු.

"........අතිරේක සේවකයන් 10 දෙනකු පත් කිරීමට සිදු වුණු අතර, අතිකාල දීමනා ගෙවීම සඳහා වැඩිපුර මුදලක් වැය කිරීමටද සිදු විය. වැටුප් හා අතිකාල දීමනා සඳහා ප්‍රවර්තන වර්ෂයේ මුළු වියදම රු. 1,12,000 ක් වන අතරය ............"

මේ අතිකාල දීමනා ගෙවන්නට සිදු වුණේ මොන හේතුවක් නිසාදැයි අපි කල්පනා කර බලමු. පසුගිය අයවැය විවාදයේදී වැඩිපුර වේලාවක් විවාද කරන්නට සිද්ධ වුණු නිසයි අතිකාල දීමනා ආදිය ගෙවන්නට සිදු වුණේ. ලිපිකාර මහත්වරුන්ටත්, වෙනත් සේවක මහතුන්ටත් අතිකාල දීමනා ආදිය වෙනුවෙන් වැඩිපුර යමක් ගෙවන්නට සිදු වුණා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

This is in respect of the employees at "Sravasti". This has nothing to do with the House of Representatives. Ten additional employees had to be engaged because the eight-hour rule had to be observed.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

පසුගිය අයවැය විවාදය පැවති කාලයේ දී වැඩිපුර වෙලාවක් මෙහි වැඩ කරන්නට සිදු වුණා. ඒ නිසාම ශ්‍රාවස්තියේ කෙරෙන වැඩ කටයුතුත් වෙනදාට වඩා ටිකක් අත පසු වුණා. ගරු මන්ත්‍රීවරුන් ශ්‍රාවස්තියට යන්නේ විනෝදය සඳහා කොළඹට පැමිණ නොවෙයි; මන්ත්‍රී මණ්ඩලයේ වැඩ කට යුතු සඳහා කොළඹට පැමිණියාමයි. ශ්‍රාවස්තියට වැඩි පුර මුදලක් වැය කරන්නට සිදු වුණේ මන්ත්‍රී මණ්ඩලයේ අතිරේක කාල සීමාවක් වැඩ කරන්නට සිදු වූ නිසයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Not necessarily.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මේ නිසාම නොවන බව මාත් පිළිගන්නවා. එහෙත්, ඒකත් එක හේතුවක් වෙලා තිබෙන බවයි මා කියන්නේ. මන්ත්‍රී මණ්ඩලයේ දීර්ඝ විවාදය අවසානයේදී එක්තරා මතයක් පළ වුණා. ආණ්ඩු පක්ෂයේත් විරුද්ධ පාර්ශ්වයේත් යන දෙ පැත්තේම ගරු මන්ත්‍රීවරුන් බොහෝම සහයෝගයෙන් සහ සහෝදරත්වයෙන් මේ විවාදයට සහභාගි වුණාය, ඒ ආකාරයට විවාදය කෙළවර කළාය යනුවෙන් මතයක් ඇති වුණා. එම විවාදයේ මූලස්ථානයක් ගෙන කටයුතු කළ ඔබතුමාත් ගරු කථානායකතුමාත් කෙරෙහි මල් කලඹක් පිළිගැන්නුවා. එයට මගේ විරුද්ධත්වයක් නැහැ. විවාදයක් මෙහෙයවීම බරපතළ කාර්යයක්. එය සතුටුදායක ලෙස තමන්ට පැවරී ඇති බලතල අනුව යහතින් පැවැත්වීම ඔබතුමන්ලාගේ කාර්යයක්. එහෙත් මේ ගරු සභාවේ විවාදවලට වෙන් වන කාල සීමාව සීමාසහිත නිසා මන්ත්‍රීවරුන් රාශියකටම තම අයිතිවාසිකම නැතිව ගියා. විවාදයේ අවසාන දිනයේදීත් අවසාන පූර්ව දිනයේදීත් මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම නැගිට ඒ ගැන තම විරුද්ධත්වය ප්‍රකාශ කළා. ඒ නිසා ආණ්ඩු පක්ෂය විසින් කථානායකතුමාටත්, විරුද්ධ පාර්ශ්වය මගින් කථානායකතුමාටත්, කථානායකතුමා විසින් දෙපක්ෂයටමත් පිරිනමාගත් ඒ අන්‍යෝන්‍ය ස්තුතියට පළුදු වන කිසිවක් ඒ අවස්ථාවේදී සඳහන් කිරීමට මා අදහස් නොකළත්, පසුපස ආසනවල සිටින මන්ත්‍රීවරුන්ට එය සියයට සියයක් අනුමත කරන්ට බැරි බව මේ අවස්ථාවේදි මා කියන්නට ඕනෑ. මක්නිසාද කියනවා නම්, මේ මන්ත්‍රී මණ්ඩලයේ විරුද්ධ පාර්ශ්වයේ ආසනවලත් ආණ්ඩු පක්ෂයේ ආසනවලත් මන්ත්‍රීවරුන් විශාල සංඛ්‍යාවකට තමන්ගේ යුතුකම හරි යාකාර ඉටු කරන්නට බැරිව ඔවුන් සිත් වේදනාවෙන් පසු වෙනවා. සත්‍යය එයයි. එසේ තිබියදී, නොපවත්නා තත්ත්වයක් රටට හැඟවීමට හා වාර්තාගත වීමට එබඳු කථා පැවැත්වීම ගැන මා කණගාටුව ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාවේ පැවැත්වෙන විවාදවලට සහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

භාගි වීමට පැමිණෙන මන්ත්‍රීවරුන්ට ලැබෙන එක වරප්‍රසාදයක් තමයි ශ්‍රාවස්තියේ ලැගුම් ගැනීම. මන්ත්‍රීවරුන්ගේ ඒ වරප්‍රසාදය ගැන සඳහන් කරන විට අපට අමතක කරන්න පුළුවන්ද ඒ මන්ත්‍රීවරුන් මේ ගරු සභාවට එන්නේ කොහොමද කියන එක? පසුගිය අයවැය විවාදයේ දී මේ කරුණ ගැනත් මන්ත්‍රීවරුන් නොයෙක් අදහස් පළ කළා. ශ්‍රාවස්තිය සපයා තිබෙන්නේ කොළඹ තමන්ගේ වාසස්ථාන නැති, නැත්නම් තමන්ගේ පෞද්ගලික ගෙවල් නැති, මන්ත්‍රීවරුන්ට කුඩා කාමරයකට ගොස් යන්තම් ඔළුව සඟවා ගෙන නිදා සිට නැවතත් පාර්ලිමේන්තුවට එන්නටයි. ඇයි මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ශ්‍රාවස්තියේ අඩි 10× 12 කාමරයකට සීමා කරන්නේ? මන්ත්‍රීවරුන්ට ඊට වඩා අයිතිවාසිකම් රාශියක් තිබෙනවා නේද? මහජනයා වෙනුවෙන් කාලය කැප කිරීමට, මහජනයා වෙනුවෙන් තම ශ්‍රමය කැප කිරීමට ඉදිරිපත් වී සිටින මන්ත්‍රීවරුන්ට ශ්‍රාවස්තියේ පොඩි කාමරයක් බාර දී එහි ඇඳකට සුදු රෙද්දක් දමා එයට ගාස්තුව ගෙවන්නට ඕනෑය කියා බේරෙන්නට හදන්නේ ඇයි? මා මෙම අදහස පළ කරන විට නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ නොවෙයි කථානායකතුමා ඔය ආසනයේ සිටියා නම් මා කැමැතියි. මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම්වල ආරක්ෂකයා කථානායකතුමායි. එතුමා නැති නිසා මෙය ඔබතුමාට වත් කියන්නට සිදු වී තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I will convey them to the Hon. Speaker.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேகரா)*
(Mr. Prins Gunasekera)

බොහොම හොඳයි. කරුණා කර මේ දුක් ගැනවිල්ල කියන්න.

මන්ත්‍රීවරුන්ගේ අපහසුකම් අඩුපාඩුකම් ගැන ශ්‍රාවස්තියට ගොස් පමණක් බලන්න එපා. ඒවා තිබෙන්නේ එහි පමණක් නොවෙයි. තම තමන්ගේ ආසනවල එදිනෙදා අවශ්‍යතාවන්ට මුහුණ දීමට හා ඒ යුතුකම් ඉටු කිරීමට මන්ත්‍රීවරුන්ට කිසිම පහසුකමක් සලසා දී නැහැ. ගරු කථානායකතුමා මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද පිළිබඳ ආරක්ෂකයා හැටියට මන්ත්‍රීවරුන්ට කර තිබෙන්නේ මොනවාද? තව මාස 6 කින් මහ මැතිවරණයක් එනවා. ජනසම්මතය උරගා බලන අවස්ථාවක් ලු. ජනසම්මතය උරගා බලන්නට තබා ජනසම්මතය ළඟට කිට්ටු වන්නටවත් අවස්ථාවක් සලසා දී නැහැ. සමහර පොහොසත් අයට, කර්මාන්තකාරයින්ට හා වතු හිමියන්ට නම් වාහන ලබා ගන්නට අවස්ථාව සලසා දී තිබෙනවා. එහෙත් විරුද්ධ පාර්ශ්වයේ සිටින මන්ත්‍රීවරුන්ට වාහනයක් ලබා ගැනීමට එවැනි අවස්ථාවක් සලසා දී තිබෙනවාද? මා අද දැක්කා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් පිරිසක් ලිපි යන අත්සන් කරගෙන යනවා. තමන්ගේ මූලික අයිතියක්වන ශ්‍රාවස්තියේ නිදා ගැනීමට පමණක් නොවෙයි, මෙහි සිට ශ්‍රාවස්තියට යන්නටත් ක්‍රමයක් සලසා දෙන්නය කියා. අප ලොකු සුඛෝපභෝගි මෝටර් රථ ඉල්ලන්නේ නැහැ. මොරිස් මයිනර්, වෝක්ස්වාගන් වැනි පුංචි මෝටර් රථ ලැබුණාම ඇති. ඒ රථ ගැනීම සඳහා වෙන් කරන්නට සිදු වන්නේ ලොකු මුදලක් නොවෙයි. මේ ගරු සභාවේ ඉන්නේ මන්ත්‍රීවරුන් එක සිය පණස් හත් දෙනයි. උත්තර මන්ත්‍රී මණ්ඩලයේ උත්තර මන්ත්‍රීවරුන් තිස් ගණනක් ඉන්නවා. එතකොට එකතුව එකසිය අසූ ගණනක් වෙනවා. එයින් හැත්තෑ පස් දෙනකුට නැත්නම් සියයකට පමණ 5 ශ්‍රී මෝටර් රථ තිබෙනවා. මෝටර් රථ ගෙන්විය යුත්තේ තව හැත්තෑ පස් දෙනකු නැත්නම් සිය දෙනකු සඳහායි. ඒ පිරිසට තම ඡන්දදායකයන් මුණගැසී ඔවුන්ට ඇහුම්කන් දීමට පහසුකම් සැලැස්වීම යුතුකමයි. සුඛෝපභෝගී මෝටර් රථ වුවමනාවක් නැහැ. මොරිස් මයිනර්, වෝක්ස්වාගන් වැනි රථ හොඳටම ප්‍රමාණවත් වෙනවා. වොක්ස්වාගන් රථයක් සඳහා රුපියල් 6,500 ක විදේශ විනිමය වුවමනා කරනවා. එතකොට මෝටර් රථ සීයක් සඳහා වුවමනා කරන්නේ රුපියල් 6,50,000ක් පමණයි. ඔය විදේශ විනිමය මුදල සොයා ගන්නට බැරිකමක් නැහැ. පත්තරකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

යන් කෝටි ගණන් විදේශ විනිමය හොරකම් කරනවා. මන්ත්‍රීවරුන්ට මෝටර් රථ දෙන්නට එපායයි කීවේත් ඒ පත්තරකාරයන්මයි. අප මෝටර් රථයක් ඉල්ලූ විට විදේශ විනිමය නැතැයි කියනවා. එහෙත් ඒ පත්තරකාරයන් විදේශ විනිමයවලට කළ දේවල් අයවැය ලේඛන විවාදයේදී හෙළි කරන්නට විරුද්ධ පාර්ශ්වයට පුළුවන් වුණා. මන්ත්‍රීවරුන්ට මෝටර් රථ සීයක් ගැනීම සඳහා වුවමනා කරන්නේ රුපියල් 6,50,000 ක් වුවත් අනවශ්‍ය දේවල් සඳහා ඊට වඩා මුදල් වියදම් කර තිබෙනවා. පොඩි දෙපාතීමේන්තුවක අයථා ක්‍රියාවක් ගැන සොයා බැලීමට පත් කරන ලද කමිටුව සඳහා ලක්ෂ හයක් හතක් වියදම් කළා. එක පුද්ගලයකු වෙනුවෙන් රුපියල් ලක්ෂ දෙකක් තුනක් වියදම් කළා. එහෙත් මහජනයා නියෝජනය කරන මන්ත්‍රීවරුන් සිය දෙනකු සඳහා කාර් සියයක් මිළ දී ගැනීම පිණිස රුපියල් 6,50,000 ක් වියදම් කරන්නට බැහැ.

ඇමතිවරුන්ට සහ පාර්ලිමේන්තු ලේකම්වරුන්ට 5 ශ්‍රී මෝටර් රථ තිබෙනවා. සමහර මන්ත්‍රීවරුන් නොයෙක් මාර්ගයෙන් ජීප් රථ ආදිය ලබාගෙන තිබෙනවා. එහෙත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් වැඩි දෙනා අවුරුදු දහය, පහළොව පරණ මෝටර් රථයි, පාවිච්චි කරන්නේ. මහා මැතිවරණයකට මුහුණ දෙන්නට ඒ මෝටර් රථ සුදුසු නැහැ. තරගයකදී සමානාත්මතාවක් තිබෙන්නට ඕනෑ. මැතිවරණ දිනයේදී රථවාහන පාවිච්චි කිරීම තහනම් කර තිබෙන්නේ සමානාත්මතාවක් තිබිය යුතු නිසයි. මැතිවරණ දවසේ සල්ලි තියෙන අයට රථවාහන යොදා ඡන්දදායකයන් ගෙන යෑම තහනම් කර තිබෙනවා. එසේ නොකළා නම් සල්ලි තියෙන අයට ඒ මගින් විශේෂ වාසියක් සලස්වා ගන්නට පුළුවන් වන්නට ඉඩ තිබෙනවා. මැතිවරණය පැවැත්වෙන දවසේ පැය 12 තුළදීවත් සමානාත්මතාව තිබිය යුතු නිසා ඒ විධියේ නීතියක් ඇති කර තිබෙනවා. ඒ නිසා මැතිවරණ කාලයේදී හැම දෙනාටම ගැළපෙන ආකාරයට විධිවිධාන සලස්වා දීම යුතුකමයි. ආණ්ඩුවේ ඇමතිවරුන්ට, පාර්ලිමේන්තු ලේකම්වරුන්ට සහ ව්‍යාපාරික මන්ත්‍රීවරුන්ට 5 ශ්‍රී මෝටර් රථ සහ 4 ශ්‍රී මෝටර් රථ තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ට තිබෙන්නේ කසි කබල් මෝටර් රථයි. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හොඳ අලුත් කාර්වල ගමන් කරන අතර විරුද්ධ පාර්ශවයේ මන්ත්‍රීවරුන්ට පරණ කබල් කාර්වල ගමන් කරන්නට සැලැස්වීම සාධාරණද? තත්ත්වය මෙසේ නම් මන්ත්‍රීවරුන්ට තිබෙන වරප්‍රසාද මොනවාද? ඇයි මේ ප්‍රශ්නය දෙස වපර ඇසින් බලන්නේ? ශ්‍රාවස්තියේ ඇති කර තිබෙන සීමිත පහසුකම් ගැන සඳහන් කර රුපියල් හත්තෑපන් දාහක් නැත්නම් ලක්ෂයක් ඒ වෙනුවෙන් දී මන්ත්‍රීවරුන් සනසන්නට හදන්ට එපා. ජනසම්මත වාදය අනුව අපට මීට වඩා මූලික අයිතිවාසිකම් ලැබිය යුතුයි. මන්ත්‍රී ධුරය දරන අයට ශ්‍රාවස්තියේ පහසුකම් සලස්වන්නා වාගේම මන්ත්‍රීවරුන්ට ගමන් බිමන් කර ගැනීම සඳහා වාහන සපයා ගැනීමට උදව් කළ යුතුයි. ඒ වාගේම මන්ත්‍රී ධුරය නැති කාලයේදී ඒ අයට එක්තරා පහසුකමක් සලස්වන්නට වටිනවා. මේ අවුරුදු පහ ඇතුළත පෞද්ගලික වශයෙන් ධනය උපයන්නේ නැතිව මුළු කාලයම පොදු ජන සේවය උදෙසා කැප කරන ගරු මන්ත්‍රීවරුන් ඕනෑ තරම් සිටිනවා. අවුරුදු පහක් දහයක් දොළහක් ඒ ආකාරයට සේවය කර වයසට ගියාම, නැවතත් තරඟ කරන්නට බැරි අවස්ථාව පැමිණියාම එවැනි මන්ත්‍රීවරුන්ට මොකක්ද සිද්ධ වෙන්නෙ? එම නිසා මේ අවස්ථාවෙන් අප ප්‍රයෝජන ගතයුතුයි නේද? අඩු වශයෙන් ලබන පාර්ලිමේන්තු වාරයේදීවත් අපට මේ ගැන පියවරක් ගන්නට පුළුවන් වේවියයි මා විශ්වාස කරනවා. මේ පාර්ලිමේන්තුවට පැමිණෙන ගරු මන්ත්‍රී වරුන්ටත් පාර්ලිමේන්තුවේ සේවය කර දේශපාලනයෙන් විශ්‍රාම ගන්නා මන්ත්‍රී වරුන්ටත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කිරීම ගැන අප මේ අවසථාවේදී පියවරක් ගතයුතුයි නේද?

ශ්‍රාවස්තියේ සේවකයන් කිහිප දෙනෙකුට වැටුප් ගෙවන්නට මේ රුපියල් 79,000 අනුමත කර මේ ප්‍රශ්නය ගැන අමතක කිරීම හරිද? රක්ෂාවක් තිබෙනවා නම් ඒකත් අත්හැර ස්වල්ප වශයෙන් තිබෙන දේපොළත් විකුණා මහජන මන්ත්‍රී මණ්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ඩලයට ඇවිත් අවුරුදු පහක් දහයක් සේවය කරනවා. මාසයකට රුපියල් 600 ක් ලැබෙනවා. නමුත් අවසානයේදී කලින් තිබුණු රක්ෂාවත් නැහැ; උපයා ගත් දේකුත් නැහැ. තත්ත්වය එසේ නම් මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද අයිතිවාසිකම් පිළිබඳ ආරක්ෂකයා හැටියට ඔබතුමාවත් ඉදිරිපත් වී ගරු කථානායකතුමා මාර්ගයෙන් මේ ගැන වහාම යම් අර්ථාන්විත වැඩ පිළිවෙළක් සකස් කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. පසුගිය අවුරුදු දෙක තුන තිස්සේ මේ කාරණය ගැන සාකච්ඡා ඇතිවුණා. නමුත් එය සාකච්ඡාවලටම සීමා වී අත්හැර දමා තිබෙනවා. සාකච්ඡා කළා ඇති. එම නිසා මේ අවස්ථාවේදීවත් ජන සම්මත වාදයේ නාමයෙන් විශාල දේපොල හිමිකම් නොමැති සාමාන්‍ය තත්ත්වයේ උදවියටත් මේ මහජන මන්ත්‍රී මණ්ඩලයට අවුත් නිදහස්ව ජීවත්වීමටත් නිදහස්ව කථා කිරීමටත් තිබෙන අයිතිය ආරක්ෂා කර දීම සඳහා වහාම ඒ පියවර ගන්නා මෙන් මා නැවතත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 2.28

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මටත් මේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට තිබෙනවා. දැනට අවුරුදු කීපයකට ප්‍රථමයෙන් ශ්‍රාවස්ති මන්දිරයේ සුඛෝපභෝගී ජීවිත ගත කරන මන්ත්‍රීවරුන් පිළිබඳව ප්‍රවෘත්ති පත්‍රවල බොහොම ඉහළින් වාර්තා පළ කළ බව තමුන්නාන්සේට මතක ඇති. එකල සිටි කථානායකතුමා අද ගරු ඇමතිවරයෙක්. ඒ කාලයේ ඔය ශ්‍රාවස්තිය පිළිබඳව මේ ගරු සභාව තුළදීත් නොයෙක් විවේචන සහ උද්ඝෝෂණ ඇති වූ බවත් අපට මතකයි. ඒවා ගැන සඳහන් කරන්නට ප්‍රථමයෙන් මේ ශ්‍රාවස්ති මන්දිරයේ නැවතී සිටින මන්ත්‍රීවරුන්ට තමන්ගේ ආත්ම ගෞරවය රැක ගැනීමට හැකි වන බවට යම්කිසි සහතිකයක් තිබෙනවාද යන ප්‍රශ්නය මා ඉදිරිපත් කරන්නට සතුටුයි. මා ඒ ප්‍රශ්නය මතු කරන්නේ හේතුවක් ඇතිවයි. මා අධිකරණයට—අළුත්කඩේ මැතිවරණ උසාවියට—ගිය අවස්ථාවේදී මට විරුද්ධව මගේ චරිතයට මඩ ගසන්නට එකල සිටි මන්ත්‍රීවරයකු—එකල ශ්‍රාවස්තියේ කළමනාකාර ධුරය ඉසිලූ පුද්ගලයා උපයෝගී කරගෙන—කළ උත්සාහය ගැන මට තවම මතකයි. එකල සිටි කථානායකතුමාටත් සිතාසි යවා තිබුණා. ඇත්ත වශයෙන්ම ශ්‍රාවස්තියේ සිටින මන්ත්‍රීවරයෙකුගේ ආත්ම ගෞරවය රැක ගැනීමට පුළුවන් වේයයි ගරු කථානායකතුමාට සහතිකයක් දීමට බැරි තත්ත්වයක් තිබෙන බව මා පෙන්වා දෙන්නට සතුටුයි. ශ්‍රාවස්තිය ඒ තරමට භයානක තැනක් හැටියටයි මට පෙනෙන්නේ.

මා මැතිවරණ උසාවියේ සාක්ෂි දෙන අවස්ථාවේදීත් මගේ චරිතයට මඩ ගැසීමේ චේතනාවෙන් යම් පුද්ගලයෙක් කටයුතු කළා. කථානායකතුමාගේ නමත් ඒ සඳහා උපයෝගී කරගෙන තිබෙන බව මා දුටුවා. සාක්ෂිකරුවකු වශයෙන් කථානායකතුමාගේ නමත් තිබුණා. නමුත් එතුමා ආවේ නැහැ. එතුමා එතුමාගේ ආත්ම ගෞරවය රැකගෙන නොපැමිණ සිටියා. එකල ශ්‍රාවස්තියේ කළමනාකාර ධුරය ඉසිලූ තැනැත්තා පැමිණියා. පැමිණ සාක්ෂි දුන්නා. ඒ සාක්ෂිය දුන්නේ මගේ චරිතයට මඩ වදින අන්දමටයි. නීතිඥවරයා ප්‍රශ්නය ඇසුවේ කෙලින්ම එල්ල කර නොවෙයි. මන්ත්‍රීවරුන්ගේ කාමරවලට ගැහැණුන්ට—ස්ත්‍රී පක්ෂයට—යන්නට පුළුවන්ද කියා නීතිඥවරයා ඇසුවා. "එන්න එපාය කියා තිබෙන්නේ දහනායක ඇමතිතුමාත් රොබට් ගුණවර්ධන මැතිතුමාත් පමණයි" යනුවෙන් එම මැනේජර් කිව්වා. ඒ මැනේජර් මහතා එසේ කියා එක්තරා ඉඟියක්ද කළා. අනික් හැම කාමරවලටම ඕනෑ නැති උදවියට—ඒ කියන්නේ වේශ්‍යා ස්ත්‍රීන්ට ගණිකාවන්ට—පවා යන්නට අවස්ථාව තිබෙනවා යයි ඔහු එම ඉඟියෙන් පෙන්නුවා. ශ්‍රාවස්තිය එවැනි ගණිකා තිප්පලක්දැයි මා ප්‍රශ්න කරන්නට කැමතියි. මන්ත්‍රීවරුන්ගේ චරිත ඝාතනය කිරීම සඳහා ශ්‍රාවස්තිය යොදා ගැනීමට තරම් මේ රටේ ඉඩකඩ සලසා තිබීම ගැන මා ඉතාමත් කනගාටු වෙනවා. එදා ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් ශ්‍රාවස්තියේ නැවතී සිටි මේ රටේ මන්ත්‍රීවරුන්ට ඉතා තදින් මඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

ගැසුවා. අද ඒ උදවිය නිහඬ ඇයි? එදා කෙරුණු දේවල් අදත් එහි ඇති වෙනවා. එහෙත් අද එහි තිබෙන එකම වෙනස මෙයයි: එදා මන්ත්‍රීවරුන්ට යම් කිසි සහනයක් තිබුණා නම් අද ඉන් අඩක් වත් ලැබෙන්නේ නැහැ. ආහාර අතින් බැලුවත්, සේවක පහසුකම් අතින් බැලු වත්, අඩුපාඩුකම් තමයි පෙනෙන්නේ. මන්ත්‍රීවරුන්ට ලැබී තිබෙන කාමරවල තත්ත්වය කෙසේද? ඒවායේ මන්ත්‍රීවර යෙකුට තබා සාමාන්‍ය කම්කරුවෙකුටවත් ඉන්නට සුදුසු තත්ත්වයක සැප පහසු කම් ඇත්තේ නැහැ.

බොහෝ මන්ත්‍රීවරුන් සවස ශ්‍රාවස්තිය බලා යන්නේ ඉතා මහන්සි වූවායින් පසුවයි. ඇතැම්විට ඒ උදවියට කරන් නට තිබෙන්නේ මන්ත්‍රී මණ්ඩලය තුළ කෙරෙන කටයුතුවලට සහභාගි වන එක පමණක් නොවෙයි. දවස පුරාම නොයෙ කුත් දෙපාර්තමේන්තුවල ඇවිදින්නට ඒ අයට සිදු වෙනවා. මේ අන්දමට බොහොම වෙහෙස මහන්සි වෙලා සමහර විට රාත්‍රී හත අට වූවායින් පසුවයි එහි යන්නට සිදු වන්නේ. මෙසේ වෙහෙස වී එහි යන ඇතැම් මන්ත්‍රීවරුන් ඔළුව කරකැ වෙන තත්ත්වයකට පත්වී එන බවත් අපි දන්නවා. එහෙත් වැඩි දෙනා සිටින් නේ ඒ අන්දමට කටයුතු නොකරන උද වියයි. එවැනි උදවියට විශේෂයෙන්ම මෙමශ්‍රාවස්තිය අපායක් වගෙයි. මෙම ශ්‍රාවස්ති මන්දිරයේ ඉතාම දූෂිත චරිත යක් ගත කළ මන්ත්‍රීවරයෙක් තමයි තවත් මන්ත්‍රීවරයෙකුට විරුද්ධව මෙතන කැරලිවුව කියන්නට ගියේ. එදා ඔහු මන්ත්‍රීවරයෙක් වශයෙන් සිටියත්, ඊට පසු සමාජයට මුහුණ දෙන්නට බැරිකම නිසාදෝ නැවත මන්ත්‍රී ධුරයක් සඳහා ඉදිරිපත් වූයේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙ වැනි තත්ත්වයකින් තොරව මෙම ශ්‍රාවස්ති මන්දිරය පාලනය කිරීම කථා නායකතුමාගේ ගෞරවයට හේතුවක් වන බව කිව යුතුයි. මේ රටේ උත්තරීතර නීති සම්පාදනය කරන මෙම මණ්ඩල යෙන් පාලනය වන මෙහිම කොටසක් වන ශ්‍රාවස්ති මන්දිරය මේ රටේ උත් කෘෂ්ට තැනක් වශයෙන් පැවතිය යුතුයි. එය එසේ පවත්වාගෙන යාමට හැකි වන පරිදි වැඩ පිළිවෙළ යෙදිය යුතුයි. මෙහෙ කරුවන්ගේ ගණන වැඩි කිරීම කෙසේ වෙතත්, කෑම බීමවල තත්ත්වය සතුටු දායක කිරීම කෙසේ වෙතත්, ශ්‍රාවස්තියේ ගෞරවය ආරක්ෂා වන පරිදි කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. එසේ ක්‍රියා කිරීම අන් සියල්ලටම වඩා මේ රටේ ඉදිරි අනාගතයට වැදගත් වන බව කිව යුතුයි. එසේ හෙයින් මීට වඩා මන්ත්‍රී වරුන්ගේ ගෞරවය රැකෙන පරිදි, මීට වඩා මන්ත්‍රීවරුන්ගේ තත්ත්වය රැකෙන පරිදි මෙම ශ්‍රාවස්ති මන්දිරය පාලනය කරන ලෙස විශේෂයෙන් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 2.34

**රාජා වෙලේගම මයා.** (මොනරාගල)
*(திரு. ராஜா வெலேகம—மொனருகலை)*
(Mr. Raja Welegama—Monaragala)

ශ්‍රාවස්තිය පිළිබඳවත් පාර්ලිමේන්තුව පිළිබඳවත් කරුණු ස්වල්පයක් ප්‍රකාශ කරන්නට මා බලාපොරොත්තු වෙනවා. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අයිතිවාසි කම් යටතේ—

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Please confine your remarks to the "Sravasti" only.

**රාජා වෙලේගම මයා.**
*(திரு. ராஜா வெலேகம)*
(Mr. Raja Welegama)

ශ්‍රාවස්තියෙහි වාසය කරන මන්ත්‍රී වරයකු වශයෙන් මා කලින් කථා කළ මන්ත්‍රීවරුන්ගේ අදහස් අනුමත කරන් නට කැමතියි. ඒ සමගම තවත් විශේෂ කරුණු කිපයක් ප්‍රකාශ කරන්නට මා කල්පනා කරනවා. මන්ත්‍රීවරුන් ශ්‍රාවස්ති යේදී ඉතාම සුඛොපභෝගී ජීවිත ගත කරනවායයි අද මේ රටේ බොහෝ දෙනා කල්පනා කරනවා. පුවත්පත්වලින් පෙන් වා දෙන තත්ත්වය අනුවත් ඔවුන් එසේ සිතන බව පෙනෙනවා. එහෙත් එහි වාසය කරන මන්ත්‍රීවරුන් වන අපියි එහි තිබෙන කනගාටුදායක තත්ත්වය ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දන්නේ. මා හිතන හැටියට ආණ්ඩු පක්ෂයේත්, විරුද්ධ පක්ෂයේත් මන්ත්‍රීවරුන් වැඩි දෙනකු නැවතී සිටින්නේ ශ්‍රාවස්ති මන්දිරයේයි. නීතිඥ වෘත්තියේ යෙදී සවසට පාර්ලිමේන්තුවට එන කොළඹ සිටින මන්ත්‍රීවරුන්ට මේ අපහසුකම තේරෙන්නෙ නැහැ. ඈත ප්‍රදේශවල සිට පැමිණ පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට සහභාගි වන මන්ත්‍රීවරුන්ට, අය වැය විවාදය වැනි එක දිගටම පැවැත්වෙන විවාදවලට සහභාගි වී නැවත ගම් ප්‍රදේශවලට යන්නට සිදු වී තිබෙන්නේ සමහර විට රෝගීන් හැටියටයි. එවැනි කණගාටුදායක තත්ත්වයක් අද ශ්‍රාවස්තියේ තිබෙන්නේ. ආහාරවල තත්ත්වය අතින් බැලුවත්, සනීපාරක්ෂාව පිළිබඳව තියෙන පහසුකම් අතින් බැලුවත් එතැන තත්ත්වය ඉතාමත් කණගාටුදායකයි. මන්ත්‍රීවරුන්ට තමන්ගේ විවේක කාලය හොඳින් ගත කිරීම සඳහා එතැන කිසිම පහසුකමක් නැහැ. බැඩ්මින්ටන්, වොලිබෝල්, ටෙනිස්, දම් වැනි ක්‍රීඩාවක යෙදී විනෝද වීමට මන්ත්‍රීවරුන්ට එතැන අවස්ථාවක් නැහැ. පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට සහභාගි වී මහන්සියට පත්ව එතැනට ගියාම කාමර ඇතුළට වී සිටින්නයි, අපට සිදු වී තියෙන්නේ. මත්පැන් 'පාවිච්චි කිරීමට පුරුදුව සිටින අයට නම් අමාරුවක් දැනෙන්නෙ නැතිව ඇති. එවැනි පුරුදු නැති අයට එතැන කණගාටුදායක ස්ථානයක් වී තිබෙනවා.

මන්ත්‍රීවරුන් නේවාසිකව සිටින ස්ථානවල අමුත්තන්ට රැස්වීමට බැරිය කියා එතැන බෝඩ් ලෑලි ගසා තිබෙනවා. කථානායකතුමාගේ අණ පරිදි කියායි, ඒ දැන්වීම් ගසා තිබෙන්නේ. නමුත් ඒ දැන්වීම බෝඩ් ලෑලිවලට පමණක් සීමා වී තිබෙනවා. රාත්‍රී 9න් පසු අමුත්තන් මන්ත්‍රීවරුන් සිටින තැනින් පිට වී යන්න ඕනෑය කියා නියම කර තිබෙනවා. නමුත් නොයෙක් විධියේ ව්‍යාපාරිකයන්, කාර් බ්‍රෝකර්වරුන් එතැන පිරිලා ඉන්නවා. මන්ත්‍රීවරයකුට විනාඩි 5ක් කාමරයක විවේකයෙන් ඉන්න බැහැ. අසවල් මන්ත්‍රීවරයා ඉන්නෙ කොයි කාමරයෙද, ගියේ කොහේද කියා අහනවා.

එතැන ටෙලිපෝන් සම්බන්ධවත් විශේෂයෙන් කියන්න ඕනෑ. ප්‍රධාන ගොඩනැගිල්ලේ නොවෙයි, අතුරු ගොඩනැගිලිවල සිටින අයට ඒක විශාල කරදරයක් වී තිබෙනවා. උඩ මාලයටත්, පහත මාලයටත්, දෙකටම එක ටෙලිපෝන් එකයි, තියෙන්නේ. ටෙලිපෝන් එක ළඟට ගියාම මන්ත්‍රීවරයකුට අවශ්‍ය දෙයක් කථා කර ගන්නට පුළුවන්කමක් නැහැ, අමුත්තන් රාශියක් වටේ සිටින නිසා. ශ්‍රාවස්තිය ඇතුළේ මැණික් වෙන්දේසි වන බව මා හොඳටම දන්නවා. ඒ වගේම කාර් විකිණීම පිළිබඳ වැඩත් ශ්‍රාවස්තිය ඇතුළේ සිදු වෙනවා. කාර් විකිණීම පිළිබඳව පුවත්පත්වල පළ කරන දැන්වීම් අනුව ඔක්කොම කාර් සොයාගෙන ශ්‍රාවස්තියට එනවා. ශ්‍රාවස්තියේ ටෙලිපෝන්වලිනුයි, ඒ කාර් වෙන්දේසි පිළිබඳව කථා බහ කෙරෙන්නේ. අප කවදාවත් දැකපු නැති අය ශ්‍රාවස්තියේ ටෙලිපෝන් එක අරගෙන රාජකාරි ප්‍රමුඛ සේවයේ ටෙලිපෝන් ඇමතීම් ගන්නවා. මේ ගැන සොයා බලන්න ඕනෑ.

ප්‍රධාන නැවතීම් ශාලාවේ දැන්වීමක් තිබෙනවා, අසුන් ගෙන අවශ්‍ය මන්ත්‍රීවරයා කැඳවීමට පියන් අතේ තුණ්ඩුවක් යවන්නය කියා. නමුත් අද කටයුතු කෙරෙන්නේ එහෙම නොවෙයි. කෙළින්ම මන්ත්‍රීවරුන්ගේ කාමරවලට එනවා. ශ්‍රාවස්තිය වටේ පාරේ කාර් යන්නේ ගෝල්ෆේස් පාරේ කාර් යනවටත් වඩා වේගයෙන්. විවේක ගන්නය කියා, අළුත් වාතය ටිකක් ලබා ගන්නය කියා ශ්‍රාවස්තිය මිදුලේ බැහියම ගළවාගෙන ඉන්න පුළුවන්කමක් නැහැ. කාර් පෝලිමේ එනවා. පැයට හැතැප්ම 30 ක, 40 ක වේගයෙන් කාර් එනවා. කිසිම පාලනයක් නැහැ. මේ කරුණු සම්බන්ධව නමුන්නාන්සේගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

අමුත්තන්ට කාමරයක් තියෙනවා. ඒ කාමරයේ ආසන තියෙනවා. මන්ත්‍රීවරයකු එතැනට ගෙන්වා ගන්නට ඕනෑ. නමුත් පෝලිමේ අමුත්තන් එහාට මෙහාට යනවා. මන්ත්‍රීවරුන් තුන් හතර දෙනකුට එක වැසිකිළියයි, එක නාන කාමරයයි තියෙන්නේ. සමහරවිට මන්ත්‍රීවරුන් පාන්දර කෝච්චියේ ඇවිත් පෝලිමේ බලාගෙන ඉන්නට ඕනෑ, නාන කාමරවලට යන්නට. අමුත්තන් මූණ සෝදනවා;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

රවුල කපනවා. මන්ත්‍රීවරුන් ශ්‍රාවස්තියේ බොහොම සුඛෝපභෝගී විධියට ජීවත් වෙනවාය, බොහොම පහසුකම් තිබෙනවාය කියායි. සමහරුන් කියන්නේ. කථානායක තුමා හෝ ලේකම්තුමා හෝ හදිසියේ එතැනට ගොස් පරීක්ෂණයක් කරන්න ඕනෑ. නිකම් බෝඩ් ලෑලි ගහල ඒවායේ හැටියට මේ කටයුතු කෙරෙනවා යයි තමුන්නාන් සේලා හිතාගෙන සිටිනවා නම් ඒක ලොකු වරදක්. ඒ නිසා කරුණා කර මේ කරුණු ගැන සැලකිල්ල යොමු කර මන්ත්‍රීවරුන්ට දැනට විඳින්නට සිදු වී තිබෙන කරදර නැති කර දමන ලෙස මා ඉල්ලා සිටිනවා. ශ්‍රාවස්තියට විශාල මුදලක් වියදම් කරනවා. එහෙත් ඒ මුදලින් මන්ත්‍රීවරුන්ට සැහෙන ප්‍රයෝජනයක් පහසුවක් සැලසී නැහැ. විශාල මුදලක් වැය කරලත් මන්ත්‍රීවරුන්ට කරදරයක් නැතිව, නිදහස්ව සිටින්නට හැකි තත්ත්වයක් සැලසී නැත්නම් මන්ත්‍රීවරුන්ට කැමති තැනක නවතින්නට ඒ සඳහා "එලවන්ස්" එකක් මුදලින් ගෙවන්නට සැලැස්වීම මීට වඩා හොඳ යයි මා යෝජනා කරනවා. විශේෂයෙන් පිට පළාත්වල සිට එන අපි වගේ මන්ත්‍රීවරුන්ට කොළඹ නවතින්නට තැනක් අවශ්‍යම බව අපි දන්නවා. එහෙත් ඒ පහසුකම හරියාකාර සලසා දෙන්නට බැරි නම්, එතැන නිදහසේ ඔවුන්ට ජීවත් වන්නට ක්‍රමයක් නැත්නම්, ඒ වියදම් කරන මුදල ආසන වශයෙන් බෙදා ඒ මන්ත්‍රීවරුන්ගේ "එලවන්ස්" එකට එකතු කර දීම මීට වඩා හොඳයි කියා මා කල්පනා කරනවා. මා මීට වඩා කථා කරන්නට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. තවත් එක කාරණයක් පමණක් කියන්නට ඕන.

හැන්සාඩ් වාර්තාවල පසුගිය කාලයේ තරම් මුද්‍රණ දෝෂ මා කවදාවත් දැක නැහැ. මේ වාර්තාවල බොහෝ දුරට මුද්‍රණ දෝෂ—Printer's Errors—තිබෙනවා. මා හිතන හැටියට හැන්සාඩ් වාර්තාවෙන් අපි බලාපොරොත්තු වන්නේ, පුවත්පත්වල පළ වන වාර්තා වැනි වාර්තා නොවෙයි. එයින් බලාපොරොත්තු වන්නේ සම්පූර්ණ විවාදය පිළිබඳ නියම වාර්තාවක්. එහෙත් බොහෝ අවස්ථාවල මේ විවාද වාර්තාකාර මහත්වරුන් අතින් නියම අන්දමට වාර්තා නොවන බව මා දන්නවා. සමහර බාධා කිරීම් හා අතුරු ප්‍රශ්න ඇසීම් සම්බන්ධයෙන් වාර්තා වෙන්නෙම නැහැ. සමහරවිට මේ වාර්තාකාර මහත්වරුන් මන්ත්‍රීවරුන්ගේ නම් දන්නෙ නැතුව ඇති. සමහර ගරු මන්ත්‍රීවරුන් ඉතා වැදගත් ප්‍රශ්න ඇසූ අවස්ථාවලදී "ගරු මන්ත්‍රීවරයෙක්" කියා එසේ නැත්නම් "බාධාකිරීමක්" කියා යොදනවා. විවාදයට අදාළ වන විධියට, කියවන්නාට රසයක් ඇති වන විධියට, කියවන්නාට තේරුම් ගැනීමට පුළුවන් වන විධියට වාර්තා ගත වන්නෙ නැහැ. ඒ වගේම හැන්සාඩ් නිවැරදි කිරීම සඳහා අපට දී තිබෙන කාලය ප්‍රමාණවත් මදි. සමහර විට මේ හැන්සාඩ් නිල වාර්තා පිටපත් පිට පළාතකට යන විට නිවැරදි කිරීම් ඇතුළත් කර එවන්නට තිබෙන්නේ දවසයි. නැත්නම් සමහරවිට එය ලැබෙන්නේ නිවැරදි කර ආපසු එවන්නට නියමිත දවසෙමයි. ඒ නිසා අපට මේවායේ වැරදි හරිගස්සා එවන්නට අවස්ථාවක් ලැබෙන්නෙ නැහැ. සමහර විට එක ඇල පිල්ලක් නිසා ඒ මන්ත්‍රීවරයා කථා කළ අදහස සම්පූර්ණයෙන්ම නොපිට හැරෙන්නට පුළුවනි. ඒ විධියේ අවස්ථා හැන්සාඩ් වාර්තාවල තිබෙනවා. පසුගිය අයවැය විවාදයේ වාර්තා ගැන කල්පනා කර බැලුවොත් එවැනි තැන් දහසක් පෙන්වන්නට පුළුවනි. මා සඳහන් කරන්නේ එපමණයි. තමුන්නාන්සේගේ හැන්සාඩ් කාර්ය මණ්ඩලයට මේ කරුණු සැළ කර මීට වඩා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළොත් හොඳයි කියා මා විශ්වාස කරනවා. මේ අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තුතියි.

අ. භා. 2.43

**ගරු විමලසේන**
*(கௌரவ விமலசேன)*
(The Hon. Wimalasena)

I do not propose to take much time of the House in replying to the remarks made by hon. Members. In regard to "Sravasti" I am not going to say any thing because I take it that the observations made will be noted by the Hon. Speaker to be gone into by him.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

It is not often that I agree with the hon. Member for Habaraduwa (Mr. Prins Gunasekera), but today I am inclined to agree with him on what he said in regard to the difficulties that are confronting the Members of Parliament for want of proper transport. Certainly it is a very big question that is disturbing the Members of Parliament on both sides of the House, the Opposition as well as the Government. As he rightly pointed out, about two and a half years ago this question was taken up by the Government. The Government was on the point of giving some relief in the matter of transport not only to Members of Parliament but also to those persons engaged in other essential services, but unfortunately some hon. Members of this very House made certain irresponsible utterances, perhaps to take some political advantage, and then some of the newspapers took this matter up and began vilifying Members of Parliament for seeking to get an advantage over other members of the public in securing transport for themselves. This went on and as a result of it, unfortunately, the proposal had to be dropped.

In fact, I know how difficult it is for Members of Parliament to go to their electorates to attend to their parliamentary duties without proper transport. They have to go by bus and it is rather humilating for Members of Parliament to depend on public transport for this reason

ලෙස්ලි ගුණවර්ධන මයා.

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

It is not humilating, but it is a waste of time.

ගරු විමලසේන

*(கௌரவ விமலசேன)*

(The Hon. Wimalasena)

That is what I said. The statement I made should not be understood in a derogatory sense. They cannot attend to their duties and functions in time when they have to depend on public transport, and this can be most embarrassing to Members of Parliament.

The Government is fully aware of the difficulties that the Members of Parliament have to face due to lack of proper transport. I feel that the time has come for both the Opposition and the Government to get together in order to solve this problem. I am also happy to note that there is a change in the attitude and approach to this problem from both sides of the House ; the proper picture can now be placed before the public to show why it is necessary for a Member of Parliament to have a fairly good car to attend to his parliamentary duties.

ලෙස්ලි ගුණවර්ධන මයා.

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

A small car is enough.

ගරු විමලසේන

*(கௌரவ விமலசேன)*

(The Hon. Wimalasena)

I am very happy that both sides have come together on this matter and are looking at the question from the same angle. That is all I have to say on this matter.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

4—ජේ 6792 (69/9)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පරිපූරක මුදල: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව: කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අතිකුත් දීමනා

*குறைநிரப்புத் தொகை: உள்நாட்டு இறை வரித் திணைக்களம்: பணியாளரின் ஆளுக்குரிய வேதனங்களும் பிறபடிகளும்*

## SUPPLEMENTARY SUPPLY: DEPARTMENT OF INLAND REVENUE: PERSONAL EMOLUMENTS AND OTHER ALLOWANCES OF STAFF

අ. භා. 2. 48

**ගරු විමලසේන**

*(கௌரவ விமலசேன)*

(The Hon. Wimalasena)

I move,

"That a supplementary sum not exceeding Rupees Two hundred and fifty thousand (Rs. 250,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto:

*Schedule*

| | Rs. |
|---|---|
| Head 41—Department of Inland Revenue. | |
| Vote No. 1—Personal Emoluments and other allowances of staff .. | 250,000" |

I should like to give a short explanation on this matter.

In order to speed up the accounting of taxes charged and collected, it was decided to purchase accounting machines for use in the Department of Inland Revenue. As provision for the purchase of these machines was not included in the Estimates for 1968-69 a sum of Rs. 250,000 was transferred from Head 41, Vote 1, to Vote 3 under virement procedure to enable the department to purchase the machines immediately on the understanding that this amount would be refunded to Vote 1 subsequently by a Supplementary Estimate, if



found necessary. The balance available under Vote 1 has now been found to be insufficient to meet the salaries and allowances of the staff. Authority is, therefore, sought for supplementary provision in Rs. 250,000.

This is in respect of the purchase of the accounting machines.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මුදල වැය කරන්නට යන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් බදු පනතට විරුද්ධව ක්‍රියා කරන උදවිය අල්ලා ගැනීමට පාවිච්චි කරන රථවාහන ආදිය සඳහා බව අප අතර බෙදා හරින්නට යෙදුණු විස්තර වාර්තාවෙන් දැන ගන්නට ලැබුණා. ඒක බෙදුවේ අද උදෙයි. මට කියවන්නට ලැබුණෙත් අද උදේ විතරයි. ආදායම් දෙපාර්තමේන්තුව බොහොම මෑත කාලයක ලොකු ආදායම් බදු වංචාවක් සොයාගෙන දූන් ඒ ගැන කටයුතු කරගෙන යන බව අපට දැන ගන්නට ලැබුණා. පත්‍රවල පළවුණා විතරක් නොවෙයි—පත්‍රවල පළ වුණේ බොහොම ටිකයි—යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) විසින් මේ ගරු සභාවේදීත් ඒ ගැන සඳහන් කළා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මේ රටේ ප්‍රධාන පත්‍ර සමාගම වන ලේක්හවුස් පත්‍ර සමාගම ආක්‍රමණය කර එහි තිබුණු පොත්පත් කිහිපයකුත් අල්ලාගෙන, ඒ ආයතනය ආදායම් බදු දෙපාර්තමේන්තුවටත්, රජයටත් කර තිබෙන ලොකු වංචාවක් පිළිබඳව කරන ලද පරීක්ෂණ ගැන කරුණු කිහිපයක් මේ ගරු සභාවේදී එළිදරවු කරන්නට යෙදුණා. ලංකාවේ පමණක් නොව අග්නිදිග ආසියාවේම උසස් තැනක් දරණ පත්‍ර සමාගමක් මෙවැනි වංචාවක් කිරීම ගැන ඇසීමෙන් අප කවුරුත් සන්තෝෂ වන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරදීම ගැන පසුගිය මැතිවරණයෙන් පසු ඉතාම ඉහළින් ඒ පත්‍ර සමාගමට ප්‍රශංසා කළ මේ ඊනියා ජාතික ආණ්ඩුවේ ගරු අගමැතිතුමා සන්තෝෂ වන්නේත් නැතැයි මා හිතනවා. තමන් බෙහෙවින් වර්ණනා කළ පත්තර සමාගමක් මෙහෙම දෙයක් කළැයි ඇසීමෙන් එතුමා විශේෂයෙන් කනගාටු වෙනවා ඇති.

මෙවැනි දේවල් හෙළි වන්නේ අහම්බෙනුයි. මක්නිසාද, මෙවැනි දේ පිළිබඳ ආරංචි, විරුද්ධ පාර්ශ්වයේ අපට නම් ලැබෙන්නේ බොහොම අමාරුවෙන්. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මේ ගැන කථා කරන විට කියන්නට යෙදුණු දේ මට මතකයි. මේ වැරදි කළ මිනිසුන්ගෙන් එක් කෙනෙක් ඉතිරි අය සමග තරහ වෙලා ඒ උදවියගෙන් වෙන් වුණා. එහෙම වුණේ නැත්නම් කවදාවත් මේ ජාවාරම හෙළි වන්නේ නැතැයි කියනවා මට අහන්නට ලැබුණා. මෙය හෙළිදරව් කරගන්නට පුළුවන් වුණේ වැරදි කළ අයගෙන් කෙනෙක් අනෙක් පැත්තට එකතු වූ නිසයි. මෙය එළිදරවු කිරීමෙන් පසු මාත් මේ පත්තර කියෙව්වා. එහෙත් ලංකාවේ පත්තර ගැන අපට කියන්නේ මොනවාටද? ඒ ගැන අපි දන්නවා. ලේක්හවුස් පත්‍ර සමාගම පමණක් නොව අනෙකුත් ලංකාවේ දින පතා පළ කරනු ලබන ධනපති පත්තර මේ එළිදරව් කිරීම ගැන හරි හැටි කරුණු පළ කර තිබුණේ නැහැ. දිය යුතු නියම ස්ථානය, ප්‍රචාරය, ප්‍රධාන ස්ථානය ඊට දුන්නේ නැහැ. වාර්තාවත් බොහොම දක්ෂ ලෙස පළ කළා. එහි නියම හරය ඇතුළත් නොකර තමයි එය පළ කෙළේ. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා බොහොම වැදගත් ලියුම් වගයක් මේ ගරු සභාවේදී කියෙව්වා. ඒවායේ පොටෝස්ටැට් කොපිත් එතුමා ගෙනැවිත් තිබුණා. එහෙත් ඒවා එකක්වත් පළ කෙළේ නැහැ. පළ වුණා නම් පළ වුණේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මීළඟට ලියමනක්ද කියවූ බව පමණයි. අන්න ඒ ආකාරයටයි පත්‍රවල මේවා වාර්තා වී තිබුණේ. ඒ නිසා විරුද්ධ පාර්ශ්වයේ සමහර පත්‍රවලට මේ කරුණු අඩංගු විශේෂ කලාප මුද්‍රණය කර බෙදා හරින්නට සිද්ධ වුණා. ඉංගිරිසියෙන් සහ ඒවායේ සිංහල පරිවර්තනයත් සමග මුද්‍රණය කර පිට කරන්නට අපට සිද්ධ වුණා. එහෙත් මේ සිද්ධිය සම්බන්ධයෙන් ඒ තරම් විශාල ප්‍රචාරයක් ඒ මගින් සිදු වුණාය කියන්නට අපට පුළුවන්කමක් නැහැ.

1965 දී අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී යුගය ආරම්භ වුණාට පස්සෙ අපට කොයි තරම් අදෝනාවක් තිබුණාදැයි තමුන්නාන්සේ දන්නවා. අපේ පත්‍ර ලංගමයෙන් යවන්නට පවා අපට ඉඩ දුන්නේ නැහැ. සාමාන්‍යයෙන් ධනපති පත්‍ර පමණයි ලංගමයෙන් අරන් යන්නට ඉඩ දෙන්නේ 1965 මාර්තු මාසයෙන් පස්සෙ. 1965 මාර්තු මාසයේ උදා වූ ප්‍රජාතන්ත්‍රවාදී යුගයෙන් පසු ඒ තත්ත්වයයි ඇති වුණේ. ඒ නිසා අපේ පත්‍ර බොහොම අමාරුවෙන් තමයි අපි යවන්නේ. ඒ නිසා අපට අපේ පත්‍ර රට හැමතැනම බෙදී යන ආකාරයට යවන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ. එහෙත් යම්කිසි සුළු ප්‍රමාණයකට වත් මේ ආරංචිය රට කරා යවන්නට පුළුවන් වුණේ විරුද්ධ පාර්ශ්වයේ පත්‍රවලට පමණයි. එහෙත් මෙහිදී අපට සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්නට පුළුවන් එක් වැදගත් කාරණයක් තිබෙනවා. ලංකාවේ සිට හැතැප්ම හය දාහකට, හත්දාහකට ඈත පිහිටි එංගලන්තයේ ප්‍රධාන දිනපතා පත්‍රයක් වන "ලන්ඩන් ටෛම්ස්" පත්‍රය මේ ආරංචිය ලොකු හෙඩ් ලයින් ඇතිව පළ කළා. එහෙත් මේ සිද්ධිය හැකි තාක් දුරට වසංකරන්නට අපේ රටේ දිනමිණ පත්‍ර සමාගම් පමණක් නොව අනෙකුත් ධනපති පත්‍රත් වෑයම් කර තිබෙන බව කියන්නට සිදු වී තිබෙනවා.

මෙහිදී ප්‍රශ්නයක් ඇති වෙනවා. මේ කර තිබෙන ජාවාරම යම්කිසි සුළු ප්‍රමාණයකින් හෙළිවී තිබෙනවා. කොපමණ හරියක් හෙළි වී නැද්ද කියන ප්‍රශ්නය මෙහිදී පැන නගිනවා. සාමාන්‍යයෙන් රටේ තිබෙන පෞද්ගලික හෝ රජයේ හෝ ප්‍රධාන ආයතනවලින් පිරිසිදු කටයුතු කිරීමක් බලාපොරොත්තු වන කවුරුත් මේ හෙළි වී නැති ඒවා මොනවාද, ඒවා හෙළි කළ යුතු ද, කියන ප්‍රශ්නය මෙහිදී මතු කරනවා. අපේ රටේ නීතියක් තිබෙනවා. එමෙන්ම අපි ඒ නීතියට ගරු කරන්නට ඕනෑ. අවාසනාවකට වගේ ඒ නීතිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

යටතේ ආදායම් බදු දෙපාර්තමේන්තුව මඟින් සොයා ගන්නා දේවල් රහසිගතව තබා ගන්නට සිදු වී තිබෙනවා. එහි යම් කිසි යුක්ති සහගත පැත්තක් තිබෙනවා වෙන්න පුළුවන්. එහෙත් සමහර අවසථා වලදී අවාසි සහගත පැත්තකුත් ඇති වෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් ලේක් හවුස් පත්‍ර සමාගම ආක්‍රමණය කර අල්ලා ගත් ලියකියවිලි රහසිගතව තබා ගැනීමට නීතියෙන් අණ කර තිබෙනවා. ඒ නිසා ඒවා මොනවාද කියා අපට සොයා ගන්නට බැහැ. නීතිය යටතේ එයට ක්‍රමයක් නැහැ. මෙහි දී ප්‍රශ්නයක් පැන නඟිනවා. සමහර විට දේශීය ආදායම් පනත කඩකර ලංකාණ්ඩුවේ භාණ්ඩයට කර තිබෙන වංචාව ගැන ඒ දෙපාතීමේන්තුවට හරියාකාර ක්‍රියා කරනවා ඇත කියා අපට බලාපොරොත්තු වන්නට පුළුවන්. ඒ ගැන නම් තරමක් සෘජුව නීත්‍යානුකූලව ඒ දෙපාර්තමේන්තුව ක්‍රියා කරනවා ඇත කියා විශ්වාස කරන්නට පුළුවන්.

එහෙත් තවත් ප්‍රශ්නයක් පැන නඟිනවා. මේ හෙළි වී ඇති රහස්වල හැටියට ඒ ඩේලිනිව්ස් පත්‍ර සමාගමේ ප්‍රධාන අය කීප දෙනෙක් කඩ කර තිබෙන්නේ ලංකාවේ දේශීය ආදුයම් පනත පමණක් නොවෙයි. විදේශීය විනිමය රෙගුලාසිත් කඩ කර විශාල ධනස්කන්ධයක් මේ රටින් පිටරට යවා තිබෙනවා. දේශීය ආදුයම් දෙපාතීමේන්තුවට වංචාවක් කළාම ඒ මුදල තිබෙන්නේ ලංකාවේමයි. එහෙත් මෙතන කර තිබෙන්නේ ආණ්ඩුවට වංචා කිරීමෙන් පමණක් නොවෙයි; රජයට ලැබිය යුතු මුදලක් වංචා කිරීමක් පමණක් නොවෙයි; මේ රටේ මුදල් වංචා සහගත ලෙස පිටරට යවා මුළු රටටම පහරක් ගසා තිබෙනවා. ඒ කරුණ ගැන නම් දේශීය ආදායම් දෙපාතීමේන්තුව කළ යුතු දේවල් කරාවිය කියා කල්පනා කරන්නට ඉඩක් නැහැ.

දේශීය ආදායම් දෙපාතීමේන්තුව මේ කාරණය දෙස බලන්නේ අපරාධයක් සිදු වී තිබෙනවාද අපරාධකරුවාට නඩු දමා දඬුවම් කරන්නට ඕනෑද කියා නොවෙයි. දේශීය ආදායම් දෙපාතීමේන්තුව ක්‍රියා කරන්නේ රජයේ භාණ්ඩයට යම්



කිසි අඩුපාඩුවක් සිදු වී තිබෙනවාද ඒ පාඩුව සියයට සියයක්ම පිරිමසා ගන්නට බැරි නම් එයින් කොටසක්වත් පිරිමසා ගෙන මුදල් අතින් ඇති වන පාඩුව පුළුවන් තරම් දුරට අඩු කර ගැනීමේ පරමාර්ථය උඩයි. එසේ නැතිව මේ කරුණ හෙළි කරන්න ඕනෑ, ඒ ගැන නඩුවක් දමන්නට ඕනෑ, වැරදි කරුවන්ට දඬුවම් කරන්නට ඕනෑ, කියන අදහස් අනුව නොවෙයි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව කටයුතු කරන්නේ. එය හරි කියා මා කියනවා. ඒ දෙපාතීමේන්තුවට තිබෙන්නේ හැකි තරම් මුදලක් රජයේ භාණ්ඩාගාරයට ලබා ගැනීමේ පරමාර්ථයෙන් ක්‍රියා කිරීමයි. ඒ දෙපාර්තමේන්තුවට භාර කටයුත්ත එයයි.

එහෙත් මෙහිදී මා කියන්නේ දේශීය ආදායම් දෙපාතීමේන්තුව කරන වැඩෙන් මහජන වුවමනාව, රටේ වුවමනාව, යුක්තිය ඉටු වන්නේ නැත කියන එකයි. සිදු වී තිබෙන විශාල වංචාව දෙස බලන විට එය තමයි අදායම් ප්‍රශ්නයට නැත්නම් රජයේ භාණ්ඩයට පාඩු වීමේ ප්‍රශ්නයට වඩා ලොකු ප්‍රශ්නය වී තිබෙන්නේ. ඉදිරි පෙළ ආසනවල වාඩි වී සිටින ඇමතිවරුන් මා කියන කාරණය පිළිගන්නට සූදානම් නැත්නම් වෙන කාගෙන්වත් නොව තම පක්ෂයේම සිටින අනුගාමිකයන්ගෙන් අසා බලන්න. තම පක්ෂයේ කුමන පංක්තියේ අයගෙන් හෝ අසා බැලුවත් කමක් නැහැ. ධනපති කොටස්වලින් හෝ වේවා වේවා, සුළු කොටස්වලින් හෝ වේවා අසා බලන්න. මේ ප්‍රශ්නය ආණ්ඩුවට වැදුණු ලොකුම පහරක් නොවේදැයි අසා බලන්න. මේ මුදල් වංචාව තරම් අප කීර්තියක් ගෙන දෙන ක්‍රියාවක් මෑත කාලයක දී ඇති වුණා ඇයි අසා බලන්න. එදා යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඇන ගන්නට ලැබුණු ආරංචි අනුව ආණ්ඩුවට වංචා කර ස්විට්සර්ලන්තයේ බැංකුවල සහ වෙනත් යුරෝපීය රටවල බැංකුවල රුපියල් කෝටි දෙකක් තැන්පත් කර තිබෙනවා. තවත් මේ වාගේ දේවල් තිබෙනවාදැයි සොයා බැලිය යුතුයි. එහෙත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නම් ඒ වැඩේ කරන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා මේ ආණ්ඩුවෙන් කරුණු දෙකක් ඉල්ලා සිටිනවා. මෙවැනි ප්‍රශ්න මෙම ගරු සභාවේදී මතු කරන විට "මෙය පොලීසියට භාර දී තිබෙනවා" යනුවෙන් හෝ "මෙය ඇටර්නි ජනරාල්තුමාට භාර දී තිබෙනවා" යනුවෙන් හෝ ගරු අගමැතිතුමා කියන්නට පුළුවනි. මේ ගැන ක්‍රියා කිරීම කාට භාර දුන්නත් ඇටර්නි ජනරාල්තුමාට නම් භාර දෙන්නට එපා යයි මා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. ඇටර්නි ජනරාල්තුමාට යම් වැඩක් භාර දුන්නොත් "කැවා" යනුවෙන් මහජනයා කියනවා. ඒ නිසා "මෙය වැදගත් ප්‍රශ්නයක් බව අපත් පිළිගන්නවා. ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව ක්‍රියා කළ යුතුයි. නඩුවක් තිබෙනවා නම් ඒ ගැන ක්‍රියා කරන්නට ඇටර්නි ජනරාල්තුමාට භාර දුන්නා" යනුවෙන් නම් කියන්නට එපා. ඒ එකක්. "මේ අන්දමට සිදුවන වැරදි ගැන, අක්‍රමිකතා ගැන ක්‍රියා කිරීමට අල්ලස් කොමසාරිස්තුමා සිටිනවා. ඒ නිසා එතුමාට මේ ප්‍රශ්නය භාර දුන්නා" යනුවෙනුත් කියන්නට නම් හදන්නට එපා. අල්ලස් කොමසාරිස් නිලයට මා අගෞරව කරන්නේ නැහැ. ඒක බොහොම උසස් නිලයක්. ඒ නිලය දරන තැනැත්තා උසස් කෙනෙකු විය යුතුයි. කොටින්ම මා ඒ නිලයට අගෞරව නොකරන බව කියන්නට කැමතියි. හැබැයි, අල්ලස් කොමසාරිස්තුමාට මේ ප්‍රශ්නය ගැන විභාග කරන්නට භාර දුන්නොත්, එතුමා ඒ කටයුත්ත කරන්නට මත්තෙන්ම එතුමාගේ තීන්දුව ලැබෙන්නට පුළුවනි. සමහර විට නොඉල්ලන ලද සහතිකයකුත් අදාළ පුද්ගලයාට ලැබෙන්නට පුළුවනි. ඒ නිසා මේ ප්‍රශ්නය අල්ලස් කොමසාරිස් තුමාට ඉදිරිපත් නොකරන ලෙසත් මා ඉල්ලා සිටිනවා. ඒ දෙවැනි කාරණයයි.

මේ ප්‍රශ්නය ගැන අද දිනම පිළිතුරක් දෙන්නැයි මා කියන්නේ නැහැ. කෙසේ වුණත්, මේ ප්‍රශ්නය ගැන මුල සිට අග දක්වාම ප්‍රසිද්ධ විභාගයක් පැවැත්වීම සඳහා අපක්ෂපාත කොමිෂන් සභාවක් පත් කළ යුතු බව මා කියනවා. අපක්ෂපාත කොමිෂන් සභාවක් යයි මා කියන්නේ ඒ පැත්තෙන් දෙදෙනෙකු සිටිනවා නම් අඩු ගණනේ මේ පැත්තෙනුත් එක් අයෙකු වත් ඒ කොමිසමට පත් කළොත් පමණයි. තිදෙනෙකු පත් කරනවා නම් ඒ තිදෙනාගෙන් එක් කෙනෙකු ගැනවත් අපට විශ්වාසය තබන්නට පුළුවන් විය යුතුයි. එවැනි කොමිෂන් සභාවක් පත් කර ඒ මාගීයෙන් මේ ප්‍රශ්නය ගැන පමණක් නොවෙයි මීට අදාළ වෙනත් ප්‍රශ්න ගැනත් සොයා බැලීම අවශ්‍යයි. අගමැතිතුමා කියන හැටියට පසුගිය මහා මැතිවරණයේදී අපෙන් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගන්නට විශාල සේවයක් කළ මේ පත්‍ර සමාගම් රජයේ ප්‍රතිපත්තියට විරුද්ධවත් රටේ නීතියට විරුද්ධවත් ක්‍රියා කර තිබෙනවාද, වැරදි කර තිබෙනවාද, එසේ නම් ඒ ක්‍රියා සහ වැරදි මොනවාද යන්න සොයා ගැනීමට එවැනි අපක්ෂපාත කොමිෂන් සභාවක් පත් කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම මහජන ජීවිතයේ පිරිසිදුකම ගැනත් දේශපාලන නායකයින්ගේ ජීවිතය ගැනත් තවත් නොයෙක් දේවල් ගැනත් බොහොම උසස් විධියට අපට බණ කියන මේ පත්‍ර සමාගම ක්‍රියා කර තිබෙන ආකාරය මහජනතාවට දැනගන්නට සැලැස්වීම යුතුකමක්. ඔවුන් වැරදි කර තිබෙනවා නම් ඒවා ගැන සොයා බලන්නටත්, ඒ වැරදිවලට දිය යුතු දඬුවම් මොනවාද කියා සොයා බලන්නටත්, එවැනි ප්‍රසිද්ධ අපක්ෂපාත කොමිෂන් සභාවක් පත් කරන මෙන් මා නැවතත් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

මේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදය රකින්නට කැමති නම්, යුක්තිය ඉෂ්ට කරන්නට කැමති නම්, අයුතු ප්‍රයෝජන ගනිමින් වැරදි කරන මිනිසුන් තමන්ගේ දේශපාලන වාසියට සඟවා ගන්නට කැමති නැති බව පෙන්නුම් කරන්නට සතුටු නම්, තවත් බලාගෙන නොසිට එදා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මේ ගරු සභාවේදී හෙළිදරව් කරන ලද සිද්ධිය ගැන සැලකිල්ලක දක්වා වහාම මා මුලින් සඳහන් කළ ආකාරයේ අපක්ෂපාත කොමිෂන් සභාවක් පත් කරන්නට ක්‍රියා කිරීමෙන් මේ රටේ ප්‍රසිද්ධ ජීවිතය පිරිසිදු කිරීමට දැන්වත් ආරම්භයක් ඇති කරන මෙන් මා නැවතත් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ආදායම් දෙපාර්තමේන්තුවේ පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමෙන් මේ ඉතා වැදගත් කාරණය ගැන වචනයක්වත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

ප්‍රකාශ කරන්නට මට ඉඩ ප්‍රස්තාව ලබා දීම ගැන වැඩ බලන ගරු මුදල් ඇමතිතුමාට ස්තුති කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

අ. භා. 3.10

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)

*(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)*

(Mr. M. Tennakoon—Nikaweratiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම වැඩ බලන ඇමතිතුමාට මා සුබ පතන්නට සතුටුයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු හොඳින් කිරීමට යන්ත්‍රෝපකරණ යනාදිය ගැනීමට එතුමා පරිපූරක වැය ශීර්ෂයක් ඉදිරිපත් කර තිබෙනවා. මේ අවස්ථාවේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කැපී පෙනෙන ලක්ෂණයක් ගැන මා තමුන්නාන්සේගේ අවධානය යොමු කරවන්නට සතුටුයි. මේ යුගයේ අනෙක් සෑම දෙපාර්තමේන්තුව කම සංඛ්‍යා ලේඛන වලින් වැඩිවීමක් පෙන්වනවා; නමුත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පමණක් සංඛ්‍යා ලේඛනවලින් අඩුවීමක් පෙන්නුම් කරනවා. හැම දෙයක්ම වැඩි වන යුගයක් මේක. මේ කාලයේ නොයෙක් අංශවලින් වැඩිවීම් ඇති වේගන යනවා. නමුත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පමණක් ක්‍රමයෙන් අඩුවේගන යනවා. 1967 වර්ෂය සඳහා දේශීය ආදායම් කොමසාරිස්වරයා ඉදිරිපත් කර තිබෙන පාලන වාර්තාවේ 17 වන පිටුවේ සඳහන් කර තිබෙන්නේ මෙහෙමයි :

> "සංඛ්‍යා ලේඛන තොරතුරු
>
> සංඛ්‍යා ලේඛන තොරතුරුවලින් 1966-67 වර්ෂයේ සිට තක්සේරු කරන ලද මුළු ආදායමෙහි සුළු අඩුවීමක් පෙන්නුම් කරයි. එනම්, කලින් වර්ෂයේ එය රු. දශ ලක්ෂ 1485 වුවද මෙම වර්ෂයේදී එය රු. දශ ලක්ෂ 1421 පමණක් විය. ඊට අනුරූපව අය කරන ලද ශුද්ධ ආදායම 1965-66 වර්ෂයේ දී රු. දශ ලක්ෂ 410.6 ක් වූ අතර එය රු. දශ ලක්ෂ 346 දක්වා මෙම වර්ෂයේ දී පහත වැටින."

හේතු වශයෙන් දක්වන්නේ මොනවාද? අපි මේවා ගැන කීප වතාවක්ම සඳහන් කර තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමාගෙන් අපි යම් යම් විස්තර බලාපොරොත්තු වුණා. ඒ විස්තර ලැබුණේ නැහැ. එහෙත් දැන් සාමාන්‍ය වශයෙන්වත් විස්තර එළිදරව් වී ගෙන එන බව පෙනෙන්නට තිබෙනවා. එම පාලන වාර්තාවේ මෙසේ සඳහන් වෙනවා :

> "......1965-66 වර්ෂයේදී තක්සේරු කරන ලද සමාගම්වල ආදායම් ප්‍රමාණය පහත වැටීම—"

සමාගම්වල ආදායම 1965 න් පසු පහත වැටී තිබෙන බවයි එයින් පෙනෙන්නේ. එහි තවදුරටත් මෙසේ සඳහන් කර තිබෙනවා :

> "1965-66 වර්ෂයේදී එය රු. දශ ලක්ෂ 444ක් වුවද, 1966-67 වර්ෂයේදී එය රු. දශ ලක්ෂ 360 දක්වා අඩු විය."

1967 වර්ෂය සඳහා දේශීය ආදායම් කොමසාරිස්වරයා නිකුත් කර තිබෙන පාලන වාර්තාවේ බී 17 වන පිටුවෙහියි මෙසේ තිබෙන්නේ. අපට මේවා ගැන දිගින් දිගට කියන්නට වුවමනාවක් නැහැ. මෙම වාර්තාවෙහි පෙන්වා තිබෙන සුළු සුළු කරුණුවලින් එක්තරා දෙයක් පැහැදිලි වෙනවා. එනම් මේ රටේ ධනපති කොටස්වලට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඇති වී තිබුණු අවහිරතාවයන් රාශියක් 1965 න් පසු මගහැරී ගොස් තිබෙන බවයි. එදා ඔවුන්ට තද කර තිබුණු බදු ක්‍රම රාශියක් අද ලිහිල් කර තිබෙනවා. ඒ අනුව ඔවුන්ට අද නිදැල්ලේ හැසිරෙන්නට අවස්ථාව සැලසී තිබෙනවා. ඒ බව මෙම වාර්තාවෙන් පෙනෙනවා. ඔය සෙල්ලම පටන් ගෙන තිබෙන්නේ 1965න් පසුයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට තමන්ගේ වත්කම්වලට අනුව ගෙවන්නට තිබෙන බදු මුදල් ගෙවීම මගහැරවීම පිණිස කළ ප්‍රධානම දෙය තමයි වගා ව්‍යාපාරය පටන් ගැනීම. මම එය ඔප්පු කරන්නම්.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

වගාද, පගාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

පගා එන්නේ ඊට පස්සේයි. වගාව පගාවෙන් වහලයි තිබෙන්නේ. 1956 න් පසු නොයෙකුත් විධියේ අවහිරකම් ධනේශ්වර පන්තියට ඇති වී තිබුණු බව අප දන්නවා. මෙම රජය එම අවහිරතාව යන් සියල්ලම එක වර ලිහෙන අන්දමට කටයුතු කර තිබෙනවා. 1965 පටන් ගත් වගා ව්‍යාපාරය අනුවයි එසේ කර තිබෙන් නේ. වගා ව්‍යාපාරයෙහි යෙදෙන සෑම දෙනා ටම ආදායම් බදු සහනයක් ලබා දුන්නා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

කාර්මිකයන්ට කවුද නිදහස දුන්නේ ? කර්මාන්ත ශාලා අයිති අයට නිදහස දුන් නේ කවුද ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

මා කතා කරන්නේ වගාව ගැනයි. මේ අවහිරතාවයන් මගහරවන්නට හදාගත් ලෙහෙසිම කවුල්ල තමයි වගා ව්‍යාපාරය. මේ රටේ ආදායම් බදු ගෙවිය යුතු සෑම පුද් කලයෙකුම, සෑම ආයතනයක්ම දැන් වගා ව්‍යාපාරයේ යෙදී අවසානයි. සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්නට පුළුවන් කමක් තිබෙ නවා නම් එය ඔප්පු කරන්නට පුළුවන්. සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්නය කියා පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් ඉදිරිපත් කළොත් පිළිතුරු දෙන්නට 6 මාසයක් නොවෙයි 6 අවුරුද්දක් කල් ඉල්ලයි. සමහර විට ඒ සංඛ්‍යා ලේඛන හැදීම සඳහා අළුතෙන් දෙපාර්තමේන්තුවක් පිහිටුවන් නටත් වෙයි. කෙසේ වුණත් ආදායම් බදු ගෙවිය යුතු, ආදායම් බදුහිඟ තිබෙන අය අතරෙන් වගා ව්‍යාපාරයේ නොයෙදුණු කී දෙනෙක් ඉන්නවාද, ව්‍යාපාර කීයක් තියෙනවාද, කියා ප්‍රශ්න කළොත් ලැබෙන උත්තරය, එක් කෙනෙකු හෝ එක් ව්‍යාපාරයක්වත් නැත යන්නයි. ආදායම් බදු හිඟ තිබෙන හැම පුද්ගලයෙකුම, හැම ව්‍යාපාරයක්ම, ඒ අවහිරයෙන් බේරෙන් නට කළේ වගා ව්‍යාපාරයේ යෙදීමයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ඔය පැත්තෙ අයත් කළා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ඒ පැත්තේ හෝ වේවා, මේ පැත්තේ හෝ වේවා, මට කමක් නැහැ. මා කථා කරන්නේ කර තිබෙන ක්‍රියාව ගැනයි. කළේ කවුද යන්න ගැන මට ප්‍රශ්නයක් නැහැ. ධනපති පුද්ගලයන් සෑම දෙනෙකුම, ධනපති ව්‍යාපාර සියල්ලක්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලැබෙන්නට තිබුණු කෝටි ගණනක මුදල් වගා ව්‍යාපාරයේ මුවාවෙන් වංචා කර තිබෙනවා. ඒ ගැන සම්පූර්ණයෙන් වගකිව යුත්තේ මේ ජාතික ආණ්ඩුවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යුගයේ හැම දේකම සංඛ්‍යා ලේඛන වැඩි වේගෙන යන නමුත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම පිළිබඳ සංඛ්‍යා ලේඛන පමණක් 1965න් පසු අඩු වේගෙන යනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලැබෙන්නට තිබුණු විශාල මුදල් ප්‍රමාණයක්, වගා ව්‍යාපාරය නිසා නොලැබී ගොස් තිබෙන බව එයින් අපට පැහැදිලි වෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ආදායම වැඩි වෙලා තියෙනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

එහෙම නම් මේ වාර්තා, වැරදියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිදසුන් වුවමනා තරම් ඉදිරිපත් කරන්නට පුළුවන්. 1965 වන විට මගේ මිත්‍රයෙකු විසින් දේශීය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

ආදායම් දෙපාර්තමේන්තුවට විශාල මුදලක් ගෙවන්නට තිබුනා. මේ මිත්‍රයාගේ නීතිඥයා උපදෙස් දී තිබෙනවා මේකෙන් බේරෙන්නට තිබෙන හොඳම මාර්ගය කොහොන් හෝ අක්කර කීපයක් ගෙන වගා ව්‍යාපාරයේ යෙදීමය කියා. වගා ව්‍යාපාරයේ යෙදුණු පුද්ගලයන්ට, සමාගම්වලට, ආදායම් බදු සහනයක් ලැබී තිබෙනවා. ඒ නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට—මහජන භාණ්ඩාගාරයට—තමන් විසින් ගෙවිය යුතු තිබුණු මුදල් සියල්ලක්ම නොගෙවා ඒවා තමන්ගේ පෞද්ගලික ධනස්කන්ධයටම එකතු කර ගැනීමට ඒ පුද්ගලයන්ටත් ඒ සමාගම්වලටත් පුළුවන් වුණා. වගා ව්‍යාපාරයේ නාමයෙන් බදු සහන ලැබූ පුද්ගලයන්ටත් සමාගම්වලටත් ඒ බදු සහන ලබා දුන් ප්‍රමාණය කොපමණද කියා අප කීප වරක්ම මුදල් ඇමතිතුමාගෙන් අසා තිබෙනවා. එහෙත් අපට පිළිතුරු ලැබී නැහැ. 1965 වන තුරු තක්සේරු කර හිඟ හිට තිබුණු ආදායම් බදු ප්‍රමාණයෙන් කොතරම් ප්‍රමාණයක් වගා ව්‍යාපාර නිසා ලැබූ සහනයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අද නොලැබී ගොස් තිබෙනවාද කියා ගරු ඇමතිතුමාට කියන්නට පුළුවන්කමක් තිබෙනවා නම් එය මේ රටේ පොදු මහජනයාට කරුණු දැන ගැනීමට කරන ලොකු උපකාරයක් යයි මා විශ්වාස කරනවා. ඒ නිසා මේ අතුරු ඇස්තමේන්තු අනුමත කරන වෙලාවේදී මා ඒ තත්ත්වය පිළිබඳව දැන ගන්නට කැමතියි.

ආදායම් දෙපාර්තමේන්තුවේ නොයෙක් විධියේ ප්‍රතිසංවිධානයන් කරගෙන යනවා. පළාත්බද කාර්යාල ඇති කරගෙන යනවා. ගම්වල සිටින සුළු පොහොසතුන්ගෙන්, පුංචි පොහොසතුන්ගෙන් බදු අය කරන්නට අදහස් කරනවා. සමහරවිට ඒ ඇත්තන් දැනට කරගෙන යන ව්‍යාපාර වුණත් කරගෙන යන්නේ බොහොම අමාරුවෙනුයි. ගමක ට්‍රැක්ටරයක් තිබෙන කෙනෙකුගෙන්, නැත්නම් කරත්තයක් බයිසිකලයක් තිබෙන කෙනෙකුගෙන් බදු අය කිරීමට කල්පනා කර ඔවුන්ගෙන් නොයෙක් විධියේ ප්‍රශ්න අසා පෝර්ම කොළ හෙවත් විස්තර ඉල්ලන කඩදාසි යවනවා. ආදායම් දෙපාර්තමේන්තුව වැඩියෙන් ආදායම් සොයාගැනීමේ මාර්ගවල යෙදෙන මේ අවස්ථාවේදී අපි දැනගන්නට සතුටුයි. විශාල බදු ගෙවන්නට තිබෙන ඇත්තෝ ඒ ගෙවීම් වලින් කොපමණ දුරට වැළකී සිටිනවාද කියා. ඒ නිසා වගා ව්‍යාරයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් රජයට ලැබෙන්නට තිබුණු ආදායමෙන් කොපමණ ප්‍රමාණයක් අද රජයට අය වී නැද්ද කියා ගරු ඇමතිතුමාගෙන් මා දැන ගන්නට කැමතියි. එපමණයි.

අ. භා. 3.23

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ගිය සතියේ රථයක් එළවාගෙන නගරය තුළ ගමන් කළා නම්, දකින්නට ඇති නගරයේ තාප්පවල අලවා තිබුණු කහපාට පෝස්ටර් වගයක්. පෝස්ටර් දෙකක් එක තැන අලවා තිබුණා. ඒ පෝස්ටර්වල සඳහන් වී තිබුණු පාඨයන් මට මතක හැටියට මා යන්තම් සටහන් කර ගත්තා. ඉන් එකක තිබුණා, "ලේක් හවුස් සල්ලි හොරකම. විදේශ විනිමය හංග ගත්ත බේරේ බෑනා බේරේද ?" කියා. අනික් එකේ තිබුණේ, "ලේක්හවුස් විනිමය වංචාව. විනිමය හොරා ගත් හොරුන් හිරේ යනවාද, නැද්ද? රජය පිළිතුරු දෙනු" කියායි. මේ පෝස්ටර් ව්‍යාපාරය දැක්කාම මට මතක් වුණා අර පසුගිය දවස්වල චීනය දෙවනත් කරමින් පැතිර ගිය සංස්කෘතික විප්ලවයේ එක අංගයක් වූ පෝස්ටර් ව්‍යාපාරය. "Wall Paper campaign" යම්කිසි දෙපාර්තමේන්තුවක, යම්කිසි ජන නායකයකු ළඟ, යම්කිසි සංස්ථාවක, කිසියම් දූෂණයක් ඇත්නම් ඒ දූෂණය පිළිබඳ තොරතුරු මහජනයාට හෙළිදරව් කර ඒ දූෂණය කෙරෙහි මහජන අවධානය යොමු කරන මාර්ගයක් හැටියට ඒ චීන සංස්කෘතික විප්ලවයේදී ඔය පෝස්ටර් ව්‍යාපාරය ප්‍රමුඛස්ථානයක් ගත්තා. පසුගිය සියවස තුළදී ලංකාවේ ඇතිවූ ලොකු විදේශ විනිමය වංචාව පිළිබඳව, දිනමිණ කන්තෝරුවේ, ඩේලිනිව්ස් කන්තෝරුවේ, ලේක් හවුස් ආයතනයේ, ඇති වුණු ලොකුම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විදේශ විනිමය වංචාව පිළිබඳව, ලංකාවේත් ඒ විධියේ පෝස්ටර් ව්‍යාපාරයක් "Wall paper campaign" පටන්ගෙන මහජනයාට තොරතුරු කියන්නේ මොන හේතුවක් නිසාදැයි මා ටිකක් විපරම් කර බැලුවා.

දිනපතා පළ වන ප්‍රවෘත්තිපත්‍ර හයක් පමණ ලංකාවේ තිබෙනවා. මේවා ඉංගිරිසියෙන්, සිංහලෙන් සහ දෙමළ භාෂාවෙන් පළ වෙනවා. සතිපතා පළ කරන පත්‍රත් --සතියකට පිටපත් ලක්ෂ තුන, හතර පළ කරන ඒවා—තුනක් හෝ හතරක් තිබෙනවා. එසේ තිබියදීත් ආදායම් බදු නොගෙවා සිටීම පිළිබඳව, ආදායම් බදු වංචාවල් පිළිබඳව සොයා ගත් කරුණු ඒවායේ පළ වන්නේ නැහැ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දිනමිණ කන්තෝරුවට පැමිණ යම්කිසි ලියකියවිලි වගයක් අරගත්තාය යන්න ගැන ලංකාවේ නගරවල මිනිසුන් පෝස්ටර් ගහන්නේ මන්දැයි මා සොයා බැලුවා. කොළඹ පමණක් නොව, ගාල්ල, රත්ගම, හබරාදූව, යටියන්තොට ආදි කොට ඇති පසුගිය සති දෙක තුළ මා ගිය බොහෝ තැන්වල මෙවැනි පෝස්ටර් මට දකින්නට ලැබුණා. මොකක්ද මෙයට හේතුව? දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කීප දෙනෙක් දිනමිණ කන්තෝරුවට කඩා වැදිලා තිබෙනවා. දිනමිණ කන්තෝරුවට පමණක් නොව දිනමිණ කන්තෝරුවේ අයිතිකාරයන්ය කියන අධ්‍යක්ෂවරුන්ය කියන මහත්වරුන්ගේ නෝනා මහත්වරුන්ගේ ගෙවලටත් කඩා වැදිලා යම්යම් ලියකියවිලි වගයක්—තරමක් කල් සඟවාගෙන තිබුණු ආදායම් පිළිබඳ ලියකියවිලි වගයක් —අල්ලා ගත්තාය කියන කාරණය පසුගිය විවාදයේදී මේ මන්ත්‍රී මණ්ඩලයේ රැව්පිළිරැව් දුන්නා. ඈත පිටිසර ගමකට ගිහිල්ලා ලේක්හවුස් විනිමය වංචාව ගැන කථා කළා නම්, ලේක්හවුසියේ දිනමිණ, ඩේලි නිවුස්, තිනකරන් යන මේ පත්‍ර කන්තෝරු ගෙන ගිය හොර ජාවාරම් ගැන සඳහන් කළා නම්, ඒ ගැන රටවාසීන් කිසිවෙක් දැනගන්නේ නැහැ. ඒ තරම් දක්ෂ විධියට, ඒ තරම් සංවිධානාත්මකව, මේ රටේ ධනවාදි පත්‍ර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ක්‍රියා කලාපය වසන් කරගෙන තිබුණා. ඒ නිසා අර මා සඳහන් කළ සංස්කෘතික විප්ලවය ආදර්ශයට ගෙන මේ රටේ කවුරු නමුත් අර විදියේ පෝස්ටර් වගයක් ගහලා තිබෙනවා.

දිනමිණ කන්තෝරුවට, ඩේලිනිවුස් කන්තෝරුවට සහ තිනකරන් කන්තෝරුවට කඩා පැන මේ හොරකම අල්ලන්නට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පෙළඹුණේ කොහොමද? මේ සිද්ධිය සති දෙක තුනකට පෙර ඇති වූයේ කෙසේදැයි මේ රටේ සිටින ආදයම් බදු ගෙවන නොගෙවන හැම දෙනාටම දැනගන්නට ඕනෑ. එහෙම නොවෙයිද? ආදායම් බදු දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන්ට පඩි ගෙවන්නේ කෙලින්ම ආදායම් බදු ගෙවන මිනිසුන් පමණක් නොවෙයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත්, ඒ උදවිය පාවිච්චි කරන රථවාහනවලටත් වුවමනා කරන මුදල් සපයා දෙන්නේ කෙලින්ම ආදායම් බදු ගෙවන මිනිසුන් පමණක් නොවෙයි. මිරිස් කරලක් ගැනීමේදී ගෙවන්නට සිදු වන මුදල, රෙදි යාරයක් මිලයට ගන්නා විට ගෙවන මුදල, කිරි ටින් එකක් ගැනීමේදී ගෙවන්නට සිදු වන මුදල, කොත්තමල්ලි සවලපයක් ගෙදරට ගෙන යෑමට ගැනීමේදී ගෙවිය යුතු මුදල යනාදි හැම දෙයකින්ම ඒ සඳහා අවශ්‍ය මුදල රට වැසියාගෙන් අපේ භාණ්ඩාගාරයට එකතු වෙනවා. හාල් ගැන මේ අවස්ථාවේ කියන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ, එය නිකම් හම්බ වන නිසා. මේ රටේ නිපදවන මෙන්ම මෙ රටට පිටරටවලින් ගෙන්වන ඕනෑම භාණ්ඩයක් මිල දී ගැනීමේදී සාමාන්‍ය මහජනයා ගෙවන මුදලින් එක්තරා ප්‍රමාණයක් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් කෙරෙන හැම කාරණයක් ගැනම, ඒ නිලධාරීන් ගන්නා හැම පියවරක් ගැනම, ඔවුන්ට ගෙවන හැම සතයක් සඳහාම, කිසියම් මුදලක්, තමන්ගේ සාක්කුවෙනුත් ගෙවනවා. එසේ නම් ඒ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යෑමට මුදල් යොදවන්නා වූ මහජනතාවට අයිතියක් තිබෙනවා නේද මේ "ලේක් හවුස්" හොරකම සිදු වුණේ කොහොමද, මෙපමණ කලක් ඔය හොරක්ම වහගෙන හිටියේ කොහොමද, මේ හොරකම පිළිබඳ ආරංචිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමහර උසස් නිලධාරීන්ට දන්වා මාස ගණනක් යන තුරු ඔවුන් නිශ්ශබ්දව සිටියේ මන්ද,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

සති දෙකකට පමණ කලින් "ඇත්ත" පත්‍රයට පිං සිදු වන්නට මේ සිද්ධිය හෙළි කරනතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මේ ප්‍රශ්නය හංගාගෙන සිටියේ මක් නිසාද, යනාදී කරුණු ගැන දැනගන්නට. ඔය ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව බැඳී සිටිනවා නේද?

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මේ විධියට වැටලීම් කිරීම බදු මගහැරීම් සෝදිසි කිරීම ආදී කරුණු රහසිගතව තබා ගෙන ඉන්නේ මොන නීතියක් නිසාද කියා මා නම් දන්නේ නැහැ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රකාශ කරන ආදායම් මාර්ග රහසිගතව තබා ගැනීමට එම දෙපාතීමේන්තුව නීතියෙන් බැඳී සිටිනවා. එහෙත් ඒ දෙපාර්තමේන්තුව ගන්නා හැම පියවරක්ම මහජනයාගෙන් හංගා ගෙන රහසේ තබා ගන්නය කියා නීති යක් මා දන්නා තරමින් නම් නැහැ. එවැනි නීතියක් තිබෙනවාද කියා මා ගරු මුදල් ඇමතිතුමාගෙන් අහනවා. මා දන්නා තරමින් නම් තිබෙන නීතිය මෙයයි: දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බදු ගෙවන්නන් අවුරුදු පතා හෝ අවශ්‍ය වූ අන් අවස්ථාවලදී කරන ලද ප්‍රකාශයන් උසාවියක් මගින් ඉල්ලා සිටින තුරු—සමහරවිට උසාවියෙන් ඉල්ලුවත් නොදෙන්නට නීතියෙන් ආරක්ෂාව තිබෙනවා—හෙළි කරන්නට බැහැ. එහෙත් හොරෙන් බදු වංචාවන් කර දෙපාර්තමේන්තුව යම් කිසි සෝදිසියක් කළා නම් එය සඟවා ගන්නය කියා කොතනකවත් නැහැ. ආදායම් බදු ගෙවන අය අවංකව තබා ගන්නටත් ආදායම් බදු හොරුන් මෙල්ල කිරීමටත් ඕනෑ නම් ගත යුතු පියවරක් තමයි "අපි මෙන්න මේ විධියේ සෝදිසියක් කළා, මේ මාසය තුළ මෙවැනි සෝදිසි තුනක් නැත් නම් හතරක් කළා, ඒ අනුව මෙතෙක් සඟවා ගෙන සිටි මුදල් රාශියක් රජයට ලබා ගන්නට පුළුවන් වුණා" කියා දෙපාතීමේන්තුව මගින් කරුණු හෙළිදරව් කිරීම. එය ආදායම් බදු හොරුන් මෙල්ල කිරීමේ එක්තරා මාර්ගයක් කර ගන්නට පුළුවන්. එය මහජන සහයෝගය එම දෙපාර්තමේන්තුවට ලැබීමේ එක්තරා මාර්ගයක් කර ගන්නටත් පුළුවන්. එවැනි ප්‍රවෘත්ති පුවත්පත් මගින් හෝ අවශ්‍ය නම් ගැසට් නිවේදන මගින් හෙළිදරව් කිරීම මහජන සහයෝගය ලබා ගන්නට මාර්ගයක් වෙන්න පුළුවන්.

"ලේක් හවුස්" ආයතනයේ මේ සිද්ධිය සම්බන්ධව ගරු යටියන්තොට මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) සඳහන් කළ අවස්ථාවේදී එතුමා ළඟ තිබුණු ලියකියවිලි වල ඡායාරූප පිටපත් ඉදිරිපත් කරමින් සම්පූර්ණ විස්තරයක් කළා. මේ ආණ්ඩුවේ අවසාන නැත්නම් 5 වැනි අයවැය විවාද යේදී හෙළිදරව් වුණු නැත්නම් ඇවිස්සුණු ලොකුම කුනු කූඩය තමයි ඔය "ලේක් හවුස්" කන්තෝරුවේ "දිනමිණ" කුණු කූඩය. ඒ කුණු කූඩය ඇවිස්සීම නිසා ඇති වූ දුර්ගන්ධය වළක්වා ගැනීමට ලේක් හවුස් ආයතනයත් අනෙක් ධනපති පුවත්පත් ආයතනත් ක්‍රියා කළා. ලේක් හවුස් ආයතනයෙන් පළ කෙරෙන පුවත් පත්වල පමණක් නොව අනෙක් ධනපති පුවත් පත් ආයතනවලින් පළ කෙරෙන පුවත්පත්වලත් මේ සිද්ධිය පළ නොකර රහසක් වශයෙන් තබා ගැනීමට උත්සාහ කළා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මේ කාරණය සම්බන්ධයෙන් අද දක්වා ගෙන තිබෙන පියවරවල් මොනවාදැයි මා වැඩ බලන මුදල් ඇමතිතුමාගෙන් අහනවා.

එදා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) වන්නි නායක මුදල් ඇමතිතුමාගෙන් මේ සිද්ධිය ගැන ප්‍රශ්න කළා. වන්නිනායක මුදල් ඇමතිතුමා පිළිතුරු කථාව කරද්දී කිව්වේ "මම මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉල්ලා තිබෙනවා. වාර්තාව ලැබුණාම තොරතුරු කියන්නම්" යනුවෙනුයි. වන්නිනායක මුදල් ඇමතිතුමා මේ ප්‍රතිඥාව දී දැන් සති දෙකක් ගත වී තිබෙනවා. ඒ සති දෙක තුළදී නොයෙක් විධියේ කයිකතන්දර අසන්නට ලැබුණා. ගරු අගමැතිතුමා හෝ ගරු රාජ්‍ය ඇමතිතුමා හෝ ගරු මුදල් ඇමතිතුමා හෝ ඒ සම්බන්ධයෙන් මෙතෙක් මේ ගරු සභාවේදී ප්‍රකාශයක් කෙළේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව බේරේ ගෙදර හොර ගුහාවට පැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආදායම් බද්දෙන් බේරෙන්නට පමණක් රුපියල් ලක්ෂ 20 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දී ඇඟ බේරා ගත් බවටත් කට කතාවක් අසන්නට ලැබුණා. ඊට පසුව තවත් කතන්දරයක් අසන්නට ලැබුණා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව යම්කිසි දඩයක් ගසනවා නම් එයත් ගෙවා මේ ප්‍රශ්නය උසාවියට නොගොස් බේරා ගන්නා බව ඒ කතන්දරයයි. අද එක කතන්දරයක්. හෙට තව කතන්දරයක්. ප්‍රබල ප්‍රවෘත්ති පත්‍ර ආයතනයක් විසින් කරන ලද මේ හොරකම, මේ වංචාව, මේ මගඩිය හෙළිදරව් වුණාට පසුව ප්‍රශ්නය වැඩි දුර යන්නට ඉඩ නොදී ගොඩින් බේරා ගන්නට මෙන්, කුණු වණයකට පැලැස්තරයක් දමන්නා සේ පැලැස්තරයක් දමා හංගෙන්නට මෙන් දඩයක් පමණක් ගෙවා ප්‍රශ්නය කෙළවර කරන්නට උත්සාහ කරනවා විය හැකි වුනත් ඊට ඉඩ දුන්නොත් එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අවංක එඩිතර නිලධාරීන්ගේ හොඳ නමට කැළලක් වෙනවා. මේ ප්‍රශ්නය පිළිබඳව නඩු නොපවරා ගොඩින් බේරා ගන්නට යනවා යයි කියන්නේ මොන හේතුවක් නිසාද? දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හොඳ නම ආරක්ෂා කර ගැනීම සඳහා ඔවුන් වහාම ක්‍රියා කළ යුතුව තිබෙනවා.

ජාතියේ පොදු භාණ්ඩාගාරයට අය විය යුතු මුදල් ඊට නොදී හොරකම් කරගෙන, කෝටිපතියන් වී සුඛොපභෝගී ජීවිත ගත කරන ධනපති පත්තර අයිතිකාරයන් කළ මේ අපරාධය මේ විධියට වසං කරන්නට හදන්නේ මේ වර්තමාන රජයේ උසස් උදවියගේ ආරක්ෂාව ඔවුන්ට ලැබෙන නිසා බවට කථාවක් පැතිර යනවා. මෙහි ඉතිහාසය යන්තමින් හෝ දන්නා අය පවසන්නේ කුමක්ද? දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හෝ වේවා, විනිමය පාලන දෙපාර්තමේන්තුව හෝ වේවා, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව හෝ වේවා, මේ රටේ නීතිය යටතේ පවත්නා වෙනත් දෙපාර්තමේන්තුවක් හෝ වේවා රවටා මේ "දිනමින" කන්තෝරුව, මේ "ඩේලි නිව්ස්" කන්තෝරුව මේ "තින කරන්" කන්තෝරුව විසින් කරන ලද නීති විරෝධී ක්‍රියාව සම්බන්ධයෙන් පියවරක් ගැනීමට මේ ආණ්ඩුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉඩක් දෙන්නේ නැතැයි ඒ උදවිය පවසනවා. එයට හේතුව මෙයයි. මේ ආණ්ඩුව බිහිවීමට උපකාර කළ වින්නඹු කාන්තාව තමයි ඔය බේරේ ගෙදර දිනමිණ කාර්යාලය, බේරේ ගෙදර දිනමිණ කාර්යාලය කළ වින්නඹුකමේ ප්‍රතිඵලය තමයි මේ ආණ්ඩුවේ උත්පත්තිය. ඒ කියන්නේ තමන්ගේ උත්පත්තියට නැත්නම් බිහිවීමට උපකාරීවූ වින්නඹු අම්මාට එරෙහිව අත ඔසවන්නට මේ ආණ්ඩුව ශක්තිසම්පන්න නැති බවත්, ඉදිරිපත් නොවන බවත්, සාමාන්‍ය ජනතාවගේ හැඟීමයි.

එය සනාථ කරන කථාවක් මේ ආණ්ඩුවේ ඇමතිවරයකුගෙන් කියවුණා. අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳව පැවති සාකච්ඡාවේදී පිළිතුරු කථාව කළ අධ්‍යාපන ඇමතිතුමා මේ වංචාව හෙළිදරව් කිරීමට මූලිකව ක්‍රියා කළ ලේක් හවුස් ආයතනයේ ලන්ඩන් කාර්යාලයේ නියුක්තව සිටි නුගේරා මහත්මයා ගැන සඳහන් කරමින් කිව්වේ මොකක්ද? මේ කර තිබෙන්නේ මහ ගුණ මකුකමක්ය කිව්වා. හොරකමක් අල්ලා දීම ගුණමකුකමක්ද කියා මා ප්‍රශ්න කරනවා. සාමාන්‍ය දුප්පත් මනුෂ්‍යයෙකුට හෙම්බිරිස්සාවක් සැදුණාම උණු කරගෙන බොන්නට දැන් කොත්තමල්ලි ටිකක් සොයා ගැනීම අමාරුයි. කොත්තමල්ලි හිඟ වෙන්නට හේතුව කුමක්ද? කොත්තමල්ලි ගෙන්වන්නට විදේශ විනිමය නැත කියනවා. කුඩා දරුවකු බඩගින්නේ කිරි ටිකක් ඉල්ලා අඬනවා. එතකොට අම්මා කඩේ නෙස්ප්‍රේ කිරි පිටි නැත කියනවා. විදේශ විනිමය නැති නිසා කිරි පිටි ගෙන්වන්නට බැරිය කියා ආණ්ඩුව කියනවා.

**ගරු විමලසේන**
*(கௌரவ விமலசேன)*
(The Hon. Wimalasena)

නෙස්ප්‍රේ මොකටද? ලක්ස්ප්‍රේ තියෙන්නෙ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**

*(திரு. பிறின்ஸ் குணசேக்கர)*

(Mr. Prins Gunasekera)

ලක්ස්ප්‍රේ ආවෙ ගිය සතියෙ නොවැ. කලින් තිබුණෙ නෙස්ප්‍රේ. නෙස්ප්‍රේ ගෙන්වන්නට බැරි වුණේ විදේශ විනිමය නැති නිසාය කියනවා. කොත්තමල්ලි ටික ගෙන්වන්නට බැරි වුණේ, නෙස්ප්‍රේ ටික ගෙන්වන්නට බැරි වුණේ, මොන හේතුවක් නිසාද යන්න දැන් පෙනෙනවා නේද? තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බිහි කරන්නට වින්නඹුකම කළ ලේක් හවුස් ආයතනයේ දිනමිණ අයිතිකරුවන්, ඩේලි නිවුස් අයිතිකරුවන් සහ තිනකරන් අයිතිකරුවන්—අධ්‍යක්ෂවරුන්—මේ රටේ වස්තුව සූරා ගෙන විදේශීය බැංකුවල තැන්පත් කරගත් නිසා නේද හෙම්බිරිස්සාව සැදුණු මනුෂ්‍යයකුට කොත්තමල්ලි ටිකක් නැතිව ගියේ, බඩගින්නේ අඬන දරුවකුට නෙස්ප්‍රේ ටින් එකක් නැතිව ගියේ ? එපමණක්ද ? අපට දෙමින් තිබුණු හාල් සේරු දෙකෙන් එකක් කපා හරින විට තමුන්නාන්සේලා කිව්වේ මොකක්ද ? විදේශ රටවලින් හාල් ගන්නට අපට විදේශ විනිමය නැත කිව්වා. එමනිසා හාල් සේරු දෙකෙන් එකක් කපනවාය කිව්වා. මේ රටේ මිනිසුන්ට බඩගින්නේ ඉන්නට සිද්ධවී තිබෙන්නේ ලේක් හවුස්කාරයින්ට සුඛෝපභෝගී ජීවිත ගත කරන්නට වුවමනා නිසයි. මේ රටේ මිනිසුන්ට අවශ්‍ය හාල් ටික ගෙනෙන්නට විදේශ විනිමය නැහැ. ලේක් හවුස්කාරයින් රටේ විදේශ විනිමය ටික සූරා ගෙන ස්විට්සර්ලන්තයේ බැංකුවල තැන්පත් කරගෙන ජොලි පිට ජීවත් වෙනවා. මේ රටේ මිනිසුන්ගේ එදිනෙදා ජීවිතයට අවශ්‍ය බඩු බාහිරාදිය ගෙන්වන්නට විදේශ විනිමය නැහැ. ලේක් හවුස් ආයතනයේ අධ්‍යක්ෂවරුන්ට රෝවර් 2000 කාර් ගෙන්වන්නට විදේශ විනිමය තිබෙනවා. මේකද ජන සම්මත වාදය ? මේකද ප්‍රජාතන්ත්‍රවාදය ? 1965 දී ආරක්ෂා කර ගත්තාය කියන්නේ මේ ජනසම්මත වාදයද ? මේ ප්‍රජාතන්ත්‍ර වාදයද ? මේ රජය බිහි කොට මේ රජය උපද්දවා තමතමන්ට වුවමනා කරන මෙවැනි නෙයියාඩම් නටන්නට බිය නැතුව ඉදිරිපත් වන්නට තරම් ශක්තියක් ලේක් හවුස් ආයතනයට තිබෙනවා නේද ? එම නිසා නේද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හෙළිදරව් කළ යුතු තොරතුරු හෙළිදරව් නොකර ඒවා තමන්ගේ ගේදොරවල සහ කන්තෝරුවල රහසිගතව තබා ගන්නට බිය සැක නැතුව මේ උදවිය ඉදිරිපත් වුණේ ? මේ ආණ්ඩුව තිබෙන තුරු කවදාවත් අපව අල්ලන්නේ නැත යන විශ්වාසය නිසා නේද මේ අය කිසිම බියක් සැකක් නැතුව මෙම ලියකියවිලි තමන්ගේ කන්තෝරුවල පවා තබා ගෙන ඉඳලා තියෙන්නේ ?

අප මෙම කාරණයෙහිදී එක්තරා ප්‍රමාණයකින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රසංසා කළයුතුයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සියයට සියයක්ම මල් පොකුරු දෙන්නට මා යන්නේ නැහැ. එහෙත් එක්තරා ප්‍රමාණයකින් මෙම කරුණෙහිදී ඔවුන්ට ප්‍රශංසා කරන්නට ඕනෑ. මේ ආණ්ඩුවේ නිර්මාතෘවරුන් වන "දිනමින" කන්තෝරුවට පැන එඩිතරව එහි සිටින හොරුන් අල්ලා ගැනීම ගැනයි අපි එම ප්‍රශංසාව ඔවුන්ට පුදකරන්නේ. මෙම කරුණෙහිදී එම දෙපාර්තමේන්තුවේ සිටින සමහර අවංක එඩිතර නිලධාරීන්ට මා ප්‍රසංසා කරන බව නැවත වරක් කියනවා. බේරේ ගෙදර හොර ගුහාව අයිතිකාර නෝනලාගේ සහ මහත්මයලාගේ ගෙවලට පැන බිය නැතුව එම හොර ලියවිලි අල්ලා ගැනීමට නිර්භයව ඉදිරිපත්වීම ගැන මෙනෙහි කොට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සිටින එඩිතර අවංක නිලධාරීන් ටික දෙනාට අපි කෘතඥතාව පුද කළයුතුනේද ? සුළුපටු කෙනෙකුගේ ගෙදරට නොවෙයි, අපේ ගරු අගමැතිතුමාගේ බෑණන්ඩියගේ ගෙදරට ගොස්—විස්තර ඇතුව කියනවා නම් අගමැතිතුමාගේ සහෝදරයාගේ දුවගේ ස්වාමිපුරුෂයාගේ ගෙදරට ගොස්—කෙටියෙන් කිවයුතු නිසායි බෑණාය කිව්වේ, "බේරේ බෑණා" යනුවෙන් කහපාට පෝස්ටර්වල සඳහන් කර තිබුණේ එම නිසායි—මෙම කඩදාසි සොයා බලන්නට තරම් එඩිතර වීම ගැන එම නිලධාරීන්ට අපේ කෘතඥතාව හිමිවන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘතඥතාව පුද කිරීම එතැනින් නවත්වා මම ප්‍රශ්න පිකක් අහන්නට කැමතියි. එම හොර කල්ලියේම සිටි එක්තරා පුද්ගලයකු විසින් මෙම විදේශ විනිමය වංචාව ගැන යම් යම් තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දීලා මාස 5 ක් යන තුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමහර නිලධාරීන් කළේ මොනවාද ? වැඩ බලන ගරු මුදල් ඇමතිතුමාගෙන් අප මේ ගැන කෙළින්ම පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. මෙම කෝටි ගණනක මුදල් වංචාව ගැන එක ලිපියක් නොවෙයි ලිපි දෙකක් නොවෙයි ලිපි තුනක් නොවෙයි ලිපි හතරක් පහක්ම ඔහු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට එවා තිබෙනවා. මෙම හොර කල්ලියෙන් අහකට පැන ඔවුන් සමග තරහ වී සිටින එම පුද්ගලයා ලන්ඩන් නුවර සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලියුම් හතරක් පහක්ම එවන තුරු මේ පිළිබඳව කිසිම පියවරක් නොගෙන නිකම් බලාගෙන සිටියේ ඇයි ? මෙම හොර කල්ලියෙන් අහකට පැන ගත් "ලේක් හවුස්" හොර ගොල්ලෝ හිටපු මෙම කොටස්කාරයා තවත් රජයේ දෙපාර්තමේන්තුවකට, නමින් කියනවා නම් රාජ්‍ය ඇමතිතුමාගේ පාලනය යටතේ පවත්නා විදේශ විනිමය පාලන දෙපාර්තමේන්තුවට, මෙම තොරතුරු දන්වා සිටින තෙක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඒ ගැන ක්‍රියා නොකළේ ඇයි ? විදේශ විනිමය පාලන දෙපාර්තමේන්තුවට නිල ලිපියක් ලියමින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් මේ විනිමය වංචාව නැති නම් මේ දේශීය ආදායම් හොරකම ගැන ප්‍රශ්න කරනතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිදි කිරමින් අහක බලාගෙන සිටියේ ඇයි ? දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඒ පිළිබඳව කිසිම පියවරක් නොගත් නිසා—මෙය විදේශ විනිමය වංචාවකුත් වන නිසා—ඊළඟට විදේශ විනිමය පාලන දෙපාර්තමේන්තුවට මේ ගැන තොරතුරු දන්වා තිබෙනවා. රජයේ දෙපාර්තමේන්තු දෙක කටම—එකකට අනිකට වඩා ප්‍රමාද වී වුවත්—මේ තොරතුරු ඇන ගන්නට ලැබුණු නිසා මේ ගැන කලබල වුණා වන්නට ඇති. ගරු රාජ්‍ය ඇමතිතුමා මේ කාරණය ගරු මුදල් ඇමතිතුමාට පවරා ඇඟ බේරා ගන්නට උත්සාහ කරනවද දන්නෙ නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මට භාර නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ආනයන අපනයන අංශය අතින් තමුන්නාන්සේට භාරයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

කව්රුවත් අපට දන්නුවෙ නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මේ මන්ත්‍රී මණ්ඩලයේදී තමුන්නාන්සේට විශේෂයෙන් බුලත් දී කියන්න ඕනෑද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඔව්.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඉලත්තට්ටුවට බුලත් තියාගෙන වෙලාවක මම එන්නම්. තමුන්නාන්සෙත් බේරේ ගෙදර කොටස් කාරයකු වන්නට ඇති. එහෙත් තමුන්නාන්සේට එතැනින් ඒ තරම් උදව්වක් නැහැ. එය සේනානායක වර්ගයා වර්ණනා කරන ආයතනයක් මිස ජයවර්ධන වර්ගයා වර්ණනා කරන ආයතනයක් නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඒකට කමක් නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
බේරේ ගෙදර, ඔබතුමා ඒ තරම් ආදරය කරන තැනක් නොවන බව මා දන්නවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඒකටත් කමක් නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
නමුත් සාමූහික වගකීමක් තමුන්නාන්සේටත් පැවරී තිබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඒක භාර ගන්නවා. ඒ ගැන තමුන්නාන්සේ කියන්න ඕනෑ නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
දැන් ටිකකට කලින් තමුන්නාන්සේ කිව්වේ බුලත් දී කියන්න ඕනෑය කියා. ආරංචිය ලැබුනා නේ දැන්. ඒ ගැන නැවතත් මතක් කරන්න වුවමනා නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මේ ආදායම් බදු වංචාවට, විදේශ විනිමය වංචාවට ප්‍රධාන උපාය මාර්ගය වුණේ තමුන්නාන්සේගේ පාලනය යටතේ තිබෙන ආනයන අපනයන බලපත්‍ර ක්‍රමයයි. ඒ මාර්ගයෙන් තමයි, මුදල් ඉපයුවේත්; ඒ රටට මුදල් යැව්වේත්. පිටකොටුවේ සාමාන්‍ය වෙළෙන්දකු විදේශයකින් යම් කිසි භාණ්ඩයක් ගෙන්වා ගැනීමට බලපත්‍රයක් ඉල්ලාගෙන, ඒ බඩුවේ මිලට වඩා වැඩි මිලක් ඒකට පටවා ලංකාවේ මුදල් විදේශ විනිමය හැටියට පිටරට යැව්වොත් "ඕවර්ලෝඩිං ද ඉන්වොයිස්" කියා තමුන්නාන්සේලා නීත්‍යනුකූලව ක්‍රියා කරනවා. පිටකොටුවේ බෝරා වෙළෙන්දකු එසේ කළොත් ඔහුගේ බලපත්‍රය තහනම් කරනවා. පිටකොටුවේ බෝරා වෙළෙන්දෙකු තමන්ගෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලැබිය යුතු මුදලක් සැඟෙව්වොත් ඔහුට විරුද්ධව නඩු පවරා, දඩ ගසා ඒ මුදල අය කර ගන්නවා. ඒ පිටකොටුවේ බෝරා කාරයන් සම්බන්ධයෙන් මේ ආණ්ඩුව කටයුතු කරන සැටි. එහෙත් බේරේ ගෙදර බෝරා කාරයන් මේ විධියට ඉන්වොයිස් ඕවර්ලෝඩ් කර විදේශ විනිමය පිටරට පැටවීම ගැන රාජ්‍ය ඇමතිතුමා කිසි දෙයක් කරන්නෙ නැහැ. ඔවුන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මුදල් සොරකම් කරනවා. මුදල් අමාත්‍යාංශයවත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවවත් ඒ ගැන හාවක් හුවක් නැහැ. අහක බලා ගෙන ඉන්නවා.

**ජෝර්ජ් කොතලාවල මයා.** (බණ්ඩාරගම)
*(திரு. ஜோர்ஜ் கொத்தலாவல—பண்டாரகம)*
(Mr. George Kotelawala—Bandaragama)
කල් ඕනෑනෙ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
කොච්චර කල් ඕනෑද? අපේ නුවර එළියේ ගරු මන්ත්‍රීතුමා (රණවීර මයා.) ආදායම් බදු ගෙවීම ගැන සඳහන් කරන විට හිනා වෙනවා. මේ පරිපූරක ඇස්තමේන්තුවෙන් කියන්නේ රුපියල් 2,50,000 ක් වෙන් කරන්න කියායි. අපේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හරිහැටි ක්‍රියා කළා නම් මේ මුදල අපේ නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමාගෙන්ම අය කර ගන්නට පුළුවන් කම තිබුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩොනල්ඩ් ජේ. රණවීර මයා.** (නුවර එළිය)
*(திரு. டொனல்ட் ஜே. ரணவீர—நுவரெலியா)*
(Mr. Donald J. Ranaweera—Nuwara Eliya)
මොකක් ද කිව්වේ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ආදායම් බදු නොගෙවන අය ඇල්ලීමට රථවාහන ලබාගැනීමට සහ නිලධාරීන්ට ගෙවීම සඳහා රු. 2,50,000 ක් වෙන් කර ගන්නටයි මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ මුදල වගේ දෙතුන් ගුණයක මුදලක් අය කර ගන්නට පුළුවන්කම තිබෙනවා, අපේ නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමාගෙන්—

**රණවීර මයා.**
*(திரு. ரணவீர)*
(Mr. Ranaweera)
ඇයි, මම වැඩිපුර ගෙව්ව, මට ආපසු ලැබෙන්න තිබෙන සල්ලි හම්බ වෙන්නෙ නැද්ද?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Order, please! The hon. Member must not make allegations against another Member.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
නැහැ, නියෝජ්‍ය කථානායකතුමනි, වැරදීමක්. එහෙම නොවෙයි මම කියන්නේ. අපේ මහාධිකරණය ඉදිරියේ මගේ නමින් තිබෙන නඩුවක් අහන්නට පටන් ගන්න තුරු මා ඒ උසාවියේ වාඩි වී සිටියා. ඒ උසාවියේ ඊට කලින් තිබුණු නඩුවක් ගැන තර්ක කරන විට ඒ නඩුවේ පැමිණිලිකරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව බව මට ඇහුණා. ඒ නඩුවේ අනික් පාර්ශ්වකාරයා බොහෝ දෙනෙකු දන්නා හඳුණන සල්ලි තිබෙන ගරු මන්ත්‍රීවරයෙක්. ඒ නඩු වෙන් තීන්දු වුණා. ඒ ගරු මන්ත්‍රීතුමාගෙන් අයවිය යුතු මුදල ගෙවන තෙක් ඒ ගරු මන්ත්‍රීතුමා විසින් ඉඩම්වලින් ඇප යක් තැබීමට අත්සන් කළ යුතුයි කියා. රුපියල් හත් ලක්ෂ පනස්දාහක් කියායි, මට මතක.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඒක දැන් අපැල් ගෙන තිබෙනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
අපැලේදී තමයි ඔය තීන්දුව ලැබුණේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඒක දැන් ප්‍රිවිකවුන්සිල්—

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
නැහැ. ඒ අනික් එක. කෙලින්ම ආදායම් බදු දෙපාර්තමේන්තුව මගින් පවරන ලද නඩුවක් පිළිබඳවයි, මා සඳහන් කරන්නේ. රාජ්‍ය ඇමතිතුමා ඒ නඩුවට පෙනී සිටියේ නැහැ. එතුමා සමහර විට ඒ ගැන දන්නවා ඇති. නවත් දන්න අය තමුන්නාන්සේලා ගෙ පැත්තෙ ඇති. ආදායම් බදු දෙපාර්ත මේන්තුවට ලැබෙන්නට තිබෙන මුදල් මේ අන්දමට හිරවීම නිසා—සමහරවිට දෙපාර්ත මේන්තුව කාර්යක්ෂම ලෙස වැඩ නොකරන නිසා වෙන්නට පුළුවනි.—දෙපාර්ත මේන්තුවට වුවමනා කරන රථවාහන ආදිය ගැනීමට වුවමනා තරම් මුදල් නියම වේලාවට දෙපාර්තමේන්තුවට නැතිව ඇති. ඒ වගේම ඒ නිසා වුවමනා කරන නිලධාරීන් බඳවා ගැනීමට සෑහෙන මුදලක් නැතුව ඇති.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 4.30 p.m. On resumption Mr. Deputy-Chairman of Committees will take the Chair.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමාගේ [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

*இதன்படி, அமர்வு பி. ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு மீண்டும் ஆரம்பமாயிற்று. குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்கள்.*

*Sitting accordingly suspended till* 4.30 P.M., *and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *in the Chair.*

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු සභාපතිතුමනි, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව උදෙසා රු. 2,50,000 ක් ලබා ගන්නට යන්නේ එය වඩාත් කාර්යක්ෂම ලෙස පැවැත්වීමේ චේතනාවෙන් බවයි, පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳ විස්තරයේ සඳහන් වන්නේ. අපි දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට රු. 2,50,000 ක් නොවෙයි, ලක්ෂ 75 ක් වුවත් වෙන් කිරීමට කැමැත්තෙන් ඉන්නවා. මක්නිසාද, අවුරුදු ගණනාවක් තිස්සේ හොරා පැන පැන හිටපු ආදායම් බදු හොරුන්ගෙන් අඩු ගණනේ හය දෙනකුවත් අල්ලා ගන්නට මේ දෙපාර්තමේන්තුව සමත් වී සිටින නිසයි. ඊට සරිලන සැලකුමක් හැටියට, ඒ දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂම පැවැත්මට මුදල් වෙන් කිරීම විෂයයෙහි අපි කොහෙත්ම මැලි වන්නේ නැහැ.

තේ පානය සඳහා රැස්වීම තාවකාලිකව අත් සිටුවන්නට පෙර මා සඳහන් කරමින් සිටියේ ලේක්හවුස් ආයතනය—සාමාන්‍ය පොදු ජනයා දන්නා හැටියට දිනමිණ කන්තෝරුව—අවුරුදු ගණනක් තිස්සේ මේ රටේ දේශීය භාණ්ඩාගාරයට හිමි විය යුතු මුදල නොගෙවා කරන ලද ඒ වංචාව හෙළිදරව් වීමෙන් පැන නැගී තිබෙන තත්ත්වය ගැන දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව මගින් මෙතෙක් ගන්නා ලද පියවරවල් මොනවාදැයි දැනගන්නට මේ රටේ ජනතාවට අසිතියක් තිබෙන බවයි. මේ අවස්ථාවේ ගරු අගමැතිතුමාත් සභා ගර්භයට පැමිණ සිටින නිසා එක් කාරණක් මතක් කරන්නට කැමතියි. මේ කාරණය සම්බන්ධව අංග සම්පූර්ණ පරීක්ෂණයක් පැවැත්වීමට කොමිෂන් සභාවක් පත් කළ යුතුයයි යෝජනාවක් විරුද්ධ පාර්ශ්වයෙන් ඉදිරිපත් කරනවා. දැන් ගරු අගමැතිතුමත් පැමිණ සිටින නිසා මා ඔබතුමන්ලා හමුවේ තැබීමට කැමතියි ඒ කාරණය. කොමිෂන් සභා කෙරෙහි මගේ නම් ඒ තරම් තද විශ්වාසයක් නැහැ. කොමිෂන් සභාවට නමක් දීමේදී එයට රාජකීය කොමිෂන් සභාව යන නම තබනවා ඇති, මහ රජන වෙනුවෙන් ගරුතර අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අගමැතිතුමාගේ උපදෙස් පරිදි පත් කරන කොමිසමක් නිසා සාමාන්‍යයෙන් ඒ නම එයට දෙනවා ඇති. එහෙත් මේ වාගේ කාරණයකදී මෙයට සම්බන්ධ පුද්ගලයන් ගැන කල්පනා කර බලන විට මට නම් ඒ තරම් විශ්වාසයක් තබන්නට අමාරුයි, කොමිෂන් සභාවකින් බලාපොරොත්තු වන කාරණා හරි හැටි ඉටු වේවිද යන්න ගැන.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

එහෙම යෝජනාවක් ගැන දැනුම් දී තිබෙනවාද ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

නැහැ, නිකම් අදහසක් . හැටියට පමණයි මා ඉදිරිපත් කෙළේ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

එහෙම දැනුම් දීමක් කර තිබෙනවා නම් ඒ ගැන දැන් කථා කරන්නට එපා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

එහෙම දැනුම් දීමක් කර නැහැ. එහෙම කළ යුතුය කියන අදහසක් පමණයි මා ඉදිරිපත් කෙළේ. මේ පාර්ලිමේන්තුවේ කාලය කෙළවරට ඇවිත් තිබෙන නිසා මෙවැනි කමිටුවක් ඉල්ලීමෙන් පාඩුවක් වන බව සැබෑවක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාර්ලිමේන්තුව විසුරුවා හැරි විගසම ඒ කොමිටියේ ක්‍රියාකාරිත්වයත් නැතිව යනවා. මෙබඳු බරපතළ විනිමය වංචාවක් හෝ මෙබඳු බරපතළ ආදායම් බදු වංචාවක් මීට ඉහත ලංකාවේ කොහේවත් සිදු වී නැහැ. මේ සිද්ධියට සම්බන්ධ ලියකියවිලිවලින් පැහැදිලි වන්නේ මෙය සාමාන්‍ය ආදායම් බදු වංචාවක් හෝ සාමාන්‍ය විදේශ විනිමය වංචාවක් පමණක් නොවෙයි. ඊට වඩා බරපතළ දේශපාලන හා ජාතික වැදගත්කමක් අතින් අනූන වූ ප්‍රශ්නයක් බවයි. "දිනමිණ" කන්තෝරුව, "ඩේලිනිවුස්" කන්තෝරුව, "තිනකරන්" කන්තෝරුව—"ලේක් හවුස්" ආයතනය—මගින් මේ රටේ දේශපාලනය කෙරෙහි කොතරම් දුරට බලපෑම් කර තිබෙනවාද? ඔවුන් මේ අන්දමින් ආදායම් බදු වංචා කර හොරෙන් තබා ගත්තා මුදල් මේ රටේ ප්‍රගතිශීලී දේශපාලනය විකෘති කිරීමට කොතරම් යොදවා තිබෙනවාද? මේ රටේ මහජනයාගේ පාරිභෝගික භාණ්ඩ සඳහා මේ රටින් සොයා ගත හැකි දේශීය ධනය විදේශ විනිමය බවට හරවා විදේශ බැංකුවල තැන්පත් කර ඒවා මේ රටේ ප්‍රගතිය වැළැක්වීම සඳහා කොතරම් දුරට උපයෝගී කර ගෙන තිබෙනවාද? මේ රටේ පොදු ජනයා හිස ඔසවා ගෙන එන සෑම අවස්ථාවකදීම මේ "ලේක් හවුස්" නැත්නම් බේරේ ගෙදර ආයතනය මේ රටේ පොදු ජනයාගෙන් හොරා . ගත් මුදල් ඒ පොදු ජන යුගය මකා දැමීමට කොතරම් දුරට උපයෝගී කර ගෙන තිබෙනවාද? ඔය විධියේ කරුණු රාශියක් තිබෙනවා. මෙන්න මේ ආර්ථික පසුබිම, මෙන්න මේ සමාජ පසුබිම මෙන්න මේ සංස්කෘතික පසුබිම නිසයි මේ දේශීය ආදායම් බදු හොරකමත් විදේශ විනිමය වංචාවත් ගැන රජය මගින් නිර්දේශ කරන කොමිෂන් සභාවක් ලවා පරීක්ෂා කිරීමෙන් පමණක් සෑහීමකට පත් වන්නට බැරිය කියා මට සැකයක් ඇති වී තිබෙන්නේ.

ගරු අගමැතිතුමා මා සමග නොමනාප වෙනවා ඇත කියා මා බලාපොරොත්තු වෙනවා. මෙයට සම්බන්ධ පුද්ගලයා ගරු අගමැතිතුමාගේ ඉතාම කිට්ටු ඥාතිවරයෙක්. එම නිසා සමහර විට පොදු ජන සන්තානයේ සැකයක් ඇති වන්නට පුළුවන් මෙන්න මේ ඉතාම කිට්ටු ඥාති සම්බන්ධය නිසා මේ අය ආරක්ෂා කිරීමට මේ රජය ඉදිරිපත් වෙනවාය කියා. මෙබඳු බරපතළ උග්‍ර මුදල් වංචාවක් මේ රටේ කවදාවත් සිදු වී නැති නිසා ඔවුන්ට නියම දඬුවම් දීමට මේ රජයට නම් පුළුවන්කමක් නැහැ කියන කථාවක් මහජනයා අතර පවතිනවා.

ජාත්‍යන්තර දේශපාලන කටයුතුවලදී මෙවැනි සිද්ධීන් ඇති වූ විට සිදු වන්නේ කුමක්ද? මට එක පූර්වාදර්ශයක් මතක් වෙනවා. ලංකාවේ ටොරිංටන් කියා ආණ්ඩුකාරයෙක් හිටියා. ඔහු එංගලන්තයේ සිටි යටත් විජිත පාලක මහ ලේකම්වරයාගේ කිට්ටුවර ඥාතියෙක්. මේ ආණ්ඩුකාරයාගේ සමයේදී ලංකාවේ එක්තරා දේශපාලන සිද්ධීන් වගයක් ඇති වුණා. නිදහස සඳහා මහජනයා නැගී සිටි අවස්ථාවකදී මහජන මතයට විරුද්ධව ඒ සාමිවරයා විසින් හදිසි නීතිය පනවා ඒ නිදහස් ව්‍යාපාරය යට කරන්නට දැරූ උත්සාහයක් අන්තිමේදී නීති විරෝධි අසාධාරණ ක්‍රියාවක්ය යන මතයක් පැන නැගී ඇති බව එංගලන්තයේ ආණ්ඩුවට දැනගන්නට ලැබුණා. එවැනි සිදධියකදී එංගලන්තයේ ආණ්ඩුව සාමාන්‍යයෙන් කරන්නේ කොමිෂන් සභාවක් පත් කිරීමයි. ඒක අධිරාජ්‍ය යුගයේ සාමාන්‍ය අංග ලක්ෂණයක්. මොකක් හෝ ප්‍රශ්නයක් මතුවූ විට එය අමතක කරවා දැමීම සඳහා කොමිෂන් සභාවක් පත් කරනවා. බරපතළ ජාතික ප්‍රශ්නයක් ඇති වූ විටත් කොමිෂන් සභාවක්, ජාතික නිදහස ඕනෑ යයි කී විටත් කොමිෂන් සභාවක්. බරපතළ ආන්දෝලනයක් ඇති වූ විටත් කොමිෂන් සභාවක්. මතු වූ සිද්ධිය අමතක වී යන තුරු කොමිෂන් සභාව සාක්ෂි අහනවා. ටොරිංටන් ආණ්ඩුකාරයාගේ යුගයේදී එංගලන්තයේ සිටි මහ රජතුමා එදා ඒ ඇති වූ ප්‍රශ්නය සම්බන්ධයෙන් නම් කොමිෂන් සභාවක් පත් නොකර පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කළා. යටත් විජිත ලේකම්වරයාගේ නිර්දේශය පිට ඔහුගේ ඥාතියාට විරුද්ධව පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කොමිසමක් පත් කළා නම් බැලූ බැල්මට ඒ කොමිෂන් සභාව කෙරෙහි විශ්වාසයක් තැබිය නොහැකි තත්ත්වයක් මතු වන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

බව පෙනී ගිය හෙයින් පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කරලයි, ඒ කාරණය ගැන සොයා බැලුවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අගමැතිතුමාගේ එක කුස උපන් සහෝදරයාගේ දියණියගේ ස්වාමිපුරුෂයා, ලේක්හවුස් ආයතනයේ ප්‍රධාන අධ්‍යක්ෂවරයායි. මේ කිට්ටු සම්බන්ධතාව නිසා මේ පල් හොරුන් පිළිබඳව කවදාවත් සාධාරණ ක්‍රියා මාර්ගයක් නොගනීතැයි මහජනයා තුළ සැකයක් තිබෙනවා. මේ කාරණය සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ නඩුවක් පැවරීමටවත් අවස්ථාවක් සැලසේදැයි සැකයක් මතු වී තිබෙනවා. නීති උපදෙස් සොයන බවට අපට ආරංචියක් තිබෙනවා. නඩු පැවරුවත් එයින් බේරෙන්නට පුළුවනැයි ඒ වැරදි කළ පුද්ගලයන් තුළ විශ්වාසයක් තිබෙන්නට පුළුවනි. මේ කාරණයේ දී මහජන සන්තානයේ පවතින සැකයන් තුරන් කළ යුතුයි. පොදු ජන ජීවිතයේ පාරිශුද්ධිය සඳහා මෙවැනි සැකයන් මතුවීම වැළැක්වීමට ක්‍රියා කළ යුතුයි. මේ තරම් බලසම්පන්න ආයතනයක් මේ අන්දමේ උග්‍ර වංචාවක් කර අසුවීම අවුරුද්දේ හැමදාම සිදු වන දෙයක් නොවෙයි. මේ වංචාව අවුරුදු හයක පමණ කාලයක් තිස්සේ කරගෙන ගොස් තිබෙනවා නේද? යටියන්තොට ගරු මන්ත්‍රීතුමා විසින් මෙම ගරු සභාවට ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන අනුව අවුරුදු හයක පමණ කාලයක් තිස්සේ මේ වංචාව සිදු වී තිබෙන බව පෙනී යනවා. මේ හොර කල්ලියේ—මේ "දිනමිණ" කන්තෝරුවට සම්බන්ධ හොර ගුහාවේ—සිටි එක චෞරයකු යම්කිසි මතභේදයක් නිසා කල්ලියෙන් ඈත් නොවුණා නම් කවදාවත් මේ වංචාව හෙළිවන්නේ නෑ නේද? ලේක් හවුස් ආයතනය අවුරුදු පතා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එවන ලැයිස්තු අනුව සාමාන්‍ය වෙළඳ සමාගමකින් බදු අය කරන්නාක් මෙන් අවුරුදු පතා මේ ආයතනයෙන්ද බදු අය කරන්නට ඇති. මේ ප්‍රබල ආයතනය එවන ගණන් හිලව් සම්බන්ධයෙන් සැකයක් හිතන්නට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉඩක් නැහැ. මෙහෙම වංචාවක් මේ ආයතනයෙන් සිදුවෙතැයි කොහොම හිතන්නද? හැමදාම උදේ මේ ආයතනයෙන් පිට වන පත්තරයක් ගත්තොත් එහි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඇතැම් අක්‍රමිකතා ගැන බණ දෙසා තිබෙන බව පෙනී යනවා. ඉතින් කොහොම නම් සැක හිතන්නටද? උදේ පාන්දර පත්‍රය ගත් සැටියේම "ආදායම් බදු දෙපාර්තමේන්තුවේ මෙවැනි දූෂණ කෙරෙනවා; මෙවැනි වැරදි කෙරෙනවා; මෙවැනි දුර්වලකම් තිබෙනවා; මේවා හරිගස්සන්නට ඕනෑ; විදේශ විනිමය හොරකම් කරන අයවලුන්ට විරුද්ධව ක්‍රියා කරන්නට ඕනෑ; අර බෝරු කාරයා මේ විධියට බොරු ගණන් දමා මුදල් යවනවා; මේවා ගැන බොහොම පරීක්ෂාකාරී වෙන්න ඕනෑ" ආදී වශයෙන් දිනපතාම වැදි බණ පළ කර තිබෙන බව පෙනෙනවා. නමුත් දැන් ඔය වැදි බණ දේශනා කරන බේරේ ගෙදරම හොර ගුහාව බව පෙනෙනවා නේද? මේ පත්‍ර කියවමින් මේ පළ කරන දේවල් විශ්වාස කරන නිලධාරීන්ගෙන් යුත් දෙපාර්තමේන්තුවක් ඒ පත්‍රය පළ කරන ආයතනයම හොරකම් කරනවාය කියා සැකයක් ඇති කර ගනීයිද? මේ සිද්ධියට තිබෙන්නේ එවැනි භයානක පසුබිමක් නේද? හැමෝටම වැදි බණ දේශනා කරන දිනමිණ ඩේලිනිව්ස්, තිනකරන් අයිතිකරුවන්ම නේද මේ වංචාව ගෙන ගොස් තිබෙන්නෙ?

නවත් පැත්තකින් බලමු. මේ රටේ ආදායම් බදු දෙපාර්තමේන්තුවට ලැබිය යුතු මුදල පමණක්ද මේ සොරකම් කර තිබෙන්නෙ? සාමාන්‍යයෙන් වෙළඳ සමාගමකට සැහෙන ආදායමක් තිබෙනවා නම්, සැහෙන ලාභයක් තිබෙනවා නම්, ඒ සියල්ලක්ම ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවන්නේ නැතිව කොටසක් ඒ වෙළඳ සමාගමේ සේවය කරන සේවකයන් අතර බෙදා දීමේ සිරිතක් තිබෙනවා. අසහනයෙන් නොපෙළෙන සැහීමකට පත් සේවක පිරිසක් ඇති කර ගැනීමේ බලාපොරොත්තුවෙන් ලාභයෙන් කොටසක් වාර්ෂික දීමනා වශයෙන් හෝ පාරිතෝෂික දීමනා වශයෙන් සේවකයන් අතර බෙදා හැරීමේ සිරිතක් තිබෙනවා. ලේක් හවුස්කාරයින් කෝටි ගණන් මුදල් උපයන්නේ ප්‍රවෘත්ති පත්‍ර කර්මාන්තයෙන්ම නොවෙයි. ඩකම්ස් තෙල් ගෙන්වා විකිණීමෙන් කැමරා ගෙන්වා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විකිණීමෙන්, කැමරාවලට වුවමනා සෝයා පටි ගෙන්වා විකිණීමෙන් කෝටි ගණනින් මුදල් උපයා ගන්නවා. තවත් නොයෙකුත් මාර්ගවලින් මුදල් උපයනවා. මේ කෝටි ගණනින් උපයන අධික ලාභය ආදායම් බදු දෙපාර්තමේන්තුවට දැන්නුවෙත් නැහැ. ඒ අධික ලාභයෙන් අඩු වශයෙන් සියයට එකක තරම් ප්‍රමාණයක්වත් ඒ ආයතනයේ දිවා රෑ නොබලා වෙහෙස මහන්සියෙන් වැඩ කරන අහිංසක සේවකයන්ට දුන්නෙත් නැහැ. අධ්‍යක්ෂ මණ්ඩලයේ කීප දෙනෙකු පමණක් මේ මුදල සූරා ගෙන ගොස් විදේශීය බැංකුවල තැන්පත් කර සුඛෝපභෝගි ජීවිත ගත කරනවා. ඒකයි තත්ත්වය. ලේක්හවුස් ආයතනය මේ තරම් විශාල ධනයක්, මේ තරම් විශාල ලාභයක් උපදවන්නේ ඇත්ත වශයෙන්ම අධ්‍යක්ෂවරුන්ගේ කුශලතාවක් නිසා නොවෙයි; අධ්‍යක්ෂවරුන්ගේ දක්ෂතාවක් නිසා නොවෙයි. අපේ සමාජයේ පවත්නා වර්තමාන ක්‍රමයේ හැටියට එවැනි බලසම්පන්න ආයතනයකට අනිවාර්යයෙන්ම ඉබේම විශාල ලාභයක් ලබා ගන්නට පුළුවන්කම තිබෙනවා. ඒ කාරණය සහ සේවකයන් දිවා රෑ නොබලා වෙහෙස මහන්සි වී වැඩ කිරීම නිසයි මේ තරම් විශාල ආදායමක් ලැබෙන්නෙ. පත්‍ර කතෘවරුන් සිටිනවා. ප්‍රවෘත්ති ලේඛකවරුන් සිටිනවා. පරිපාලන අංශයේ ලිපිකරුවන් ආදීන් සිටිනවා. පත්‍රය මුද්‍රණය කළාම මිටි බැඳ කරේ තබා ගෙන වෑන් රියට දමන සේවකයන් සිටිනවා. පත්‍ර කාර්‍යාලය අතුගාන අහිංසක කුලීකරුවන් සිටිනවා. මේ ආයතනයේ දිවා රෑ නොබලා දහඩිය මහන්සියෙන් වැඩ කරන ඒ පත්‍ර කතෘවරයාගේ පටන් අහිංසක කුලීකරුවා දක්වා කිසිම කෙනෙකුට ඒ අධික ලාභයෙන් සියයට එකක තරම්වත් කොටසක් නොදී, ආදායම් බදු දෙපාතීමේන්තුවටත් හෙළි නොකර සඟවා ගෙන ගොස් තමන්ගේ පෞද්ගලික පරිහරණය සඳහා විදේශීය බැංකුවල තැන්පත් කර තිබෙනවා. මහජන ආන්දෝලනයට හේතු වී තිබෙන්නේ ඒ තත්ත්වය නේද?

මෙම ආයතනයේ සේවකයන්ගේ ඇස් ඇරවිය යුතු ප්‍රශ්නය මෙයයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අවුරුදු පතා අය විය යුතු මුදල් පමණක් නොවෙයි ඔවුන් වංචා කර තිබෙන්නේ. මෙම ආයතනයට විරුද්ධව කම්කරු උසාවියෙහි පවරා තිබුණු නඩු කීපයකටම පෙනී සිටින්නට මට සිදු වුණා. තමන්ට ලැබිය යුතු සාමාන්‍ය පාරිතෝෂික දීමනාවත් නොදී අයුක්ති සහගත අන්දමින් සේවයෙන් පහ කළාය යන්නයි ඒ කම්කරුවන් ගෙන් වැඩි දෙනා ඉදිරිපත් කර තිබුණු පැමිණිල්ල. මේතරම් විශාලතම ලාබයක් උපදවන මෙම සමාගම අහිංසක සේවකයෙකුගේ පාරිතෝෂිකයක් වැනි සුළු මුදලක් පවා නොදී සේවයෙන් පහ කර දමා තිබෙනවා. මේ අය එවැන්නන්ගේ පඩිය රුපියල් 10 කින් වත් වැඩි කරන්නේ නැහැ. මේ අය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ලක්ෂ ගණන් මුදල් ගෙවන්නේ නැතුවා පමණක් නොවෙයි, එතන සේවකයන්ගෙනුත් හොර කම් කරනවා. එතන සේවකයන්ගේ සාක්කු වලින් පික්පොකට් ගහනවා. මෙතන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පික්පොකට් ගහලා පිටරට ගොස් සුඛොපභෝගි ජීවිත ගත කරනවා.

එසේ කරන්නෙත් මෙතන හැම හවුල්කාරයෙක්ම නැති නම් හැම කොටස් කාරයෙක් ම නොවෙයි. සීමිත අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් පමණයි මෙවැනි වරප්‍රසාද හැම දෙයක්ම භුක්ති විඳින්නේ. මෙම ආයතනයේ සේවක මණ්ඩලය කෙරෙහි කොතෙක් දුරට මේ ප්‍රශ්නය බල පාන වාද යන්න ඔවුන් නිසියාකාර වටහා ගත යුත්තේ එම නිසයි.

ගරු අගමැතිතුමනි, දුප්පත් මන්ත්‍රීවරුන්ට එහා මෙහා යන්නට කාරයක් ඉල්ලා සිටි විට විදේශ විනිමය ප්‍රශ්නය මතුකොට එය දෙන්නට එපායයි තමුන්නාන්සේට උපදෙස් දුන්නේ මෙම පත්‍ර ආයතනය නේද?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
**(The Hon. Dudley Senanayake)**
මා එහෙම උපදෙස් ගත්තේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

එහෙත් ඒ පිළිබඳව ලොකු ආන්දෝලනයක් ඇතිවී තිබුණ නේද? "මන්ත්‍රීවරුන්ට වරප්‍රසාද දෙන්නට එපාය; මන්ත්‍රීවරුන්ට අළුත් රථ දෙන්නට එපාය; වෙන වෙනත් අත්‍යවශ්‍ය දේ සඳහා විදේශ විනිමය තබා ගන්නට වුවමනාය" යනාදී වශයෙන් කියමින් විශාල ව්‍යාපාරයක් පසුගිය දිනවල ඒ උදවිය ගෙන ගියා නේද? තමුන්නාන්සේ එම ව්‍යාපාරයට යට වුණේ නැතැයි කියනවා නම් මා එය පිළිගන්නම්. එහෙත් මොවුන් බණ දේශනා කළේ අන්න එහෙමයි.

දැනට එළිදරව් වී තිබෙන පමණින් විදේශ විනිමය කෝටි 28කට වැඩි සංඛ්‍යාවක් හොරකම් කර තිබෙන ප්‍රවෘත්ති පත්‍ර ආයතනයක් තමයි මන්ත්‍රීවරුන්ට රුපියල් 6,500 ක් වටිනා කාරය බැගින් ගෙන්වා දෙන්නැයි යෝජනා කළ විට විදේශ විනිමය නැත කියා කෑ ගැසුවේ. මන්ත්‍රීවරුන්ට බස්වලින් යන්න සහ දුම්රියෙන් යන්න පිකට්ස් දී තිබෙනවාය කියන්නේ මෙවැනි පසුබිමක් තිබෙන උදවියයි. මෙම කරුණෙහිදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බදු නොගෙවන සාමාන්‍ය වෙළඳ සමාගමක් දෙස බලන අන්දමට බලා මෙම ප්‍රශ්නය අමතක නොකරන හැටියට මා ඉල්ලා සිටිනවා. මේ ගැන විභාගකර බලා මන්ත්‍රී මණ්ඩලයට දන්වන බවට එදා ගරු මුදල් ඇමතිතුමා ප්‍රතිඥාවක් දී තිබෙනවා. මෙතෙක් කරන ලද පරීක්ෂණවලින් හෙළිදරව් වී ඇති තත්ත්වය කුමක්දැයි අප දැනගන්නට කැමතියි. එම කරුණ පිළිබඳව මෙතෙක් ගෙන තිබෙන පියවර මොනවාදැයි අප දැනගන්නට කැමතියි. මෙම මන්ත්‍රීවරුන්ගේ මාර්ගයෙන් මේ රටේ බදු ගෙවන හා නොගෙවන හැම දෙනාම දැනගන්නට කැමැත්තෙන් සිටින්නේ එම කාරණයයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ පළාතේ වඩු කර්මාන්ත ශාලාවක සේවය කරපු දැනට එම රක්ෂාවෙන් අස් කර සිටින එක්තරා මනුස්සයෙක් ගිය සතියේ මා හමුවන්නට ඇවිත් ඔහුට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඇවිත් තිබෙන ලියමනක් පෙන්නුවා. මාසයකට පෙර ඔහුට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලියාපදිංචි කළ තැපෑලෙන් ලිපියක ඇවිත් තිබෙනවා. වහාම තමන්ගේ වාර්ෂික ආදායම පෙන්වන්නැයි එම ලිපියෙන් නියෝග කොට තිබෙනවා. ඒ මනුස්සයාට ඉන්න තැනක්වත් නැහැ. කරපු රක්ෂාවෙන් පවා අස් කර දමා තිබෙනවා. තවම රක්ෂාවක් සොයා ගෙනත් නැහැ. මොහු කවදාවත් රුපියල් 200කට වැඩි මාසික ආදායමක් ලැබූ කෙනෙක් නොවෙයි. එවැනි පුද්ගලයෙකුටයි මාසයක් ඇතුළත තමන්ගේ වාර්ෂික ආදායම එළිදරව් කරන්නැයි දන්වමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් යථෝක්ත ලිපිය එවා තිබෙන්නේ. ඒ මනුස්සයා අන්දුන් කුන්දුන් වෙලා උත්තරයක් යැව්වේ නැහැ. ඊට පසු රතු පාටින්—ලේ පාටින්—මුද්‍රණය කරන ලද දැන්වීමක් ඔහුට එවනවා එය ලැබී සති දෙකක් ඇතුළත වාර්ෂික ආදායම් විස්තරය ඉදිරිපත් නොකළොත් ඔහුට විරුද්ධව නඩු පවරනවාය කියා. රක්ෂාවෙන් අස් කරනු ලැබ සිටින, ඉන්න හිටින්න තැනක් නැති, වේල් තුනෙන් එක වේලක්වත් හරියට කන්නෙ නැති සාමාන්‍ය මනුෂ්‍යයාට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සලකන්නෙ මේ විධියටයි. ඒ තැනැත්තා වාමාංශික තරුණයෙක්. මිනිහා හුඟක් සල්ලි හම්බ කරනවාය, ආදායම් බදු ගෙවන්නේ නැත කියා කව්දෝ කෙනකු ලිපියක් යවන්නට ඇති. සති දෙකක් ඇතුළත ආදායම් විස්තර ඉදිරිපත් නොකළොත් නඩු පවරනවාය කියා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් දැන්නුවේ ඒ නිසයි. ඒ ලිපිය මට පෙන්වා මොනවා කරන්නද කියා ඔහු මගෙන් ඇහුවා. මේ තරම් වතු තිබෙනවාය, මේ තරම් ගෙවල් තිබෙනවාය, ආදායම් මේ තරම් තිබෙනවාය කියා සම්පූර්ණ විස්තර හෙළිදරව් කරන්නය කියා මා ඔහුට කිව්වා. රක්ෂාව නැති මනුෂ්‍යයාට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සලකන්නේ මේ විධියටයි.

ධනවත්, බලවත් ප්‍රවෘත්තිපත්‍ර ආයතනයක් වංචා කළ බව හෙළිදරව් වූ පසු සලකා තිබෙන්නේ කොයි විධියටද? අසවල් දව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සට පෙර නියම විස්තර ඉදිරිපත් නොක ළොත් නඩු පවරනවාය කියා දැනුම් දී තිබෙනවාද? දඬගසා ගොඩින් බේරන්නට උත්සාහ කරනවාද? බදු නොගෙවා හොර කම් කරන මහා ඩකම්ස් මුදලාලිලා අල්ලන්නට වුවමනා නම් රුපියල් හත් ලක්ෂ පනස් දාහක් නොවෙයි, ඒ වගේ දහ ගුණයක් වුණත් මේ මන්ත්‍රී මණ්ඩලයෙන් සම්මත කරයි. අපට දැන ගන්නට වුවමනා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සාමාන්‍ය මනුෂ්‍යයන් පස්සේ එළවන්නාක් මෙන්ම, මේ අනුමත කරන මුදල් යොදවා, දේශපාලන නායකයන් හා ඥාති සම්බන්ධකම් ඇති ප්‍රබල ධනවාදී කම්මාන්ත කාරයන් පසුපසත් එළවනවාද කියායි. බැරිම තැන ගිහින් අල්ලගත්ත බව සැබැයි. එහෙත් සාමාන්‍යයෙන් මේ වගේ තොරතුරක් ලැබුණු වහාම අප්‍රමාදව ක්‍රියා කරනවාද යන්නයි, ප්‍රශ්නය. මට ලැබී තිබෙන ආරංචියේ හැටියට අධ්‍යක්ෂවරුන් 6 දෙනකුගේ ගෙවල් සෝදිසි කරන්නට දේශීය ආදායම් දෙපාතීමේන්තුවේ නිලධා රීන් ගියා. පස් දෙනකුගේ ගෙවල් පම ණයි, ඒ අයට සෝදිසි කරන්නට පුළුවන් වුණේ. අනික් ගේ වසා තිබුණු නිසා ඒ ගෙට ඇතුළු වන්නට ඔවුන්ට බැරි වුණා. එසේ වසා යතුරු දා තිබුණේ වෙන කව රකුගේ වත් නොව ගරු අගමැතිතුමාගේ සහෝදරයාගේ දියණියගේ ස්වාමිපුරුෂ යාගේ ගෙයයි. ඒ නැනැත්තා එදා කොළඹ නැතිලු. යතුරු දමා දොර වසා තිබුණු නිසා ඔහුගේ ගේ පරීක්ෂා කරන්නට බැරි වුණාලු. යතුරු දමා වසා තිබෙන ගෙදරකට ඇතුළු වීම සඳහා දේශීය ආදායම් දෙපාතී මේන්තුවට යම් කිසි බලතල වගයක් තියෙනවා. දේශීය ආදායම් දෙපාතී මේන්තුවේ නිලධාරීන් එම බලතල පාවිච්චි කර එම ගෙට ඇතුළු නොවුණේ කුමක් නිසාද කියා මා අහන්නට සතුටුයි. දවස් 4 කට පසු ඒ ගෙදර අයිතිකරුවා දිය තලාවේ හෝ බණ්ඩාරවෙල සිට පැමිණ තමන්ගේ යතුරෙන් දොර අරින තෙක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිල ධාරීන් ඒ ගෙට ඇතුළු නොවූයේ කුමක් නිසාද? මෙවැනි නොයෙක් දේ මිනිසුන් අතර කථා වෙනවා. දේශීය ආදායම් දෙපාතීමේන්තුව භාර ඇමතිතුමා හෝ මුදල් ඇමතිතුමා ප්‍රමාද වී හෝ මේ ගැන කරුණු පැහැදිලි කළ යුතු බව මා කියා සිටියේ ඒ නිසයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආදා යම් බදු හොරකම පිළිබඳව ඔත්තුව දුන් පුද්ගලයාට විශාල සන්තෝශමක් දී ඔහු ළඟ තිබෙන මූලික ලියකිවිලි ආපසු ගැනීමට මේ ආයතනය උත්සාහ කරන බව ආරංචියි.

Freeze the licence, stop the quota immediately. Are you going to continue to give them the licence to defraud the people of this country? You are continuing to give them the licence. If this had been done by any other person in this country you would have cancelled his quota until the matter was investigated and disposed of. Why are you not taking steps to cancel their quota?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
What about the newspapers?

ද මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)
This particular newspaper will have to continue, for after all, the general election is round the corner. This particular newspaper must continue to be printed to support the Government.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
National paper.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)
Disgraceful!

ද මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)
It is a shame that the Government has not taken the minimum action in this matter in the last five weeks. You are giving them the quota for newsprint to continue to defraud the people of this country. What have you done with regard to the importation of photographic materials, what have you done with regard to the importation of ink, by these people? And what have you done with regard to their other quotas and licences? In the case of any other person in this country, by this time all his import quotas would have been freezed.

ජෝර්ජ් රාජපක්ෂ මයා. (මුල්කිරිගල)
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ—முல்கிரிகல)
(Mr. George Rajapakse—Mulkirigala)
He is waiting till the shares drop to buy them over.

ද මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)
There are various schools of thought on this question. It is the duty of this Government to make a statement. The Hon. Minister of Finance promised this House that a statement would be made. That was when the hon. Member for Yatiyantota raised this matter on the Floor of this House. He said that the matter was being investigated and that he would call for a report. It is in HANSARD. We presume that the report is with him now. We presume that the Hon. Minister of Finance knows what is happening and we also presume that the Government is aware of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]

the extent of the fraud, the extent of tax evasion, the magnitude of the problem. We would call upon the Acting Minister of Finance to honour the undertaking given by the Minister of Finance to make a statement to this House in regard to the extent of the fraud.

In fairness to all concerned, in fairness to the employees of Lake House who might not get their bonus at the end of this year—they will probably have to claim their bonus in foreign exchange—in fairness to the Department of Inland Revenue, and in fairness to this House, we would call upon the Acting Minister of Finance to make a statement on the Floor of this House in relation to the extent of the fraud and the extent of tax evasion. Do not try to shield yourselves under the secrecy clauses of the Inland Revenue Act.

These are the people who preach morality to the nation. These are the people who once made an insinuation against the hon. Member for Kolonnawa (Mr. Ilangaratne) in their "Talking Point" column or rather, in their "stinking point" column. They made the insinuation that Ceylonese visiting Switzerland could see the photograph of an Hon. Minister of the previous Government in the lobby of a hotel in Switzerland. Meanwhile they have, during the last seven years, been engaging in the most flagrant exchange abuses.—[*Interruption*]. Out of the bounty of their knowledge of Swiss bank accounts, out of their intimate knowledge of the secret numbered accounts in Swiss banks, they were making various insinuations against Ministers of the last Government. They were preaching morality to the nation. Are these the people who preach morality to us? This is a matter of national importance, a matter of paramount importance to the people of this country. These are the so-called king-makers of the nation, people who imagine that they can make and break governments. This is not any X, Y or Z defrauding a few rupees, evading a little tax or salting a little exchange. This is the largest income tax and exchange fraud which has come to the knowledge of the people of this country. It is the duty of the Hon. Prime Minister—in the absence of the Hon. Prime Minister, at least of the erstwhile darling of the "Daily News" Group, or of the Acting Minister of Finance—to make a statement to this House on the extent of the fraud and the extent of the problem.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

How do we know?

ද මැල් මයා.
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

As far as you know it. Surely, you have called for a report.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I know less than you.

ද මැල් මයා.
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

I am sorry for the ignorance of my hon. Friend while being a shareholder. He is one of the poor shareholders of this company who, under the provisions of the present Companies Ordinance, is being defrauded by its directors. He is one of the countless poor shareholders of this company. I am sorry for him, but in his capacity as the Deputy Head of the Government he has a duty to make a statement to this House.

I do not wish to repeat the arguments of the hon. Members who spoke before me. This is not only an income tax fraud, but also an exchange fraud; it is an offence under the Import Control Ordinance, and action can be taken in various ways in regard to this matter.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

With regard to the Supplementary Estimate under discussion I should like to speak a few words. The Taxation Commission made some important recommendations, some of them worthwhile, some less worthwhile, and some others, which we on this side of the House cannot accept. Anyway, they made some very important recommendations to change the structural and organizational side of the Inland Revenue Department. The Taxation Commission recommended the creation of a directorate-general of revenue. The commission also recommended the co-ordination of the activities of all the revenue collecting departments of the country. I do not know what action this Government has taken on these very worthwhile recommendations. I understand there was some opposition in the department to some of these changes. It may be that certain amendments have to be made, but I would call upon the Hon. Acting Minister of Finance to look into these structural and organizational changes which have been recommended by the Taxation Commission, and to let us know how many of these recommendations they are prepared to implement, the recommendations that have already been implemented and what their plans are for the future.

There is also the question of the decentralization of the Inland Revenue Department which has been suggested by the Taxation Commission. I am aware that a certain amount of decentralization has already taken place, but I think there is scope for much more decentralization of the department with a view to roping in all the small tax evaders in the provinces and in the outstations. I earnestly appeal to the Hon. Acting Minister of Finance to go ahead with this scheme of decentralization advocated by the Taxation Commission.

There are one or two other matters to which I would wish to refer on this occasion. There are two matters which are a standing disgrace to this country, a blot on income tax, exchange control and other revenue collecting organizations of this land. I am referring to the question of air tickets and to the question of gift cars. It is a known fact that a pre-paid air ticket to any part of the world can be obtained in this country at a price. If you want to travel to the United States tomorrow the air ticket will be at your doorstep in twenty-four hours if you know the necessary contacts and how to set about the matter. If you want an air ticket to Japan you can have it at your doorstep the next day. This is a racket that has been going on for the last so many years.—[*Interruption*]. I will tell you the relevance of this to income tax. The Income Tax Department must not go to sleep. The Exchange Control Department must not go to sleep.

When there are rackets which everybody in this country is aware of, traffic in air tickets, traffic in gift cars, surely the simplest thing is from the passenger manifests—

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
Gift cars are not allowed.

ද මැල් මයා.
*(திரு. டி மெல்)*
(Mr. de Mel)
When did you disallow that ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
That was allowed in your time.

ද මැල් මයා.
*(திரு. டி மெல்)*
(Mr. de Mel)
How do these 5 Sri cars keep on rolling into this country ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
They are not gifts.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

What about the seven 5 Sri cars supposed to be in the garages of the Directors of the Associated Newspapers of Ceylon Limited ? I want to know how those cars came into the country, now that you have contested this point about cars. I did not want to make a personal allegation all this time. There are at least seven 5 Sri cars among the various members of the families of the directors of the Associated Newspapers of Ceylon Limited. Ostentatious spending of foreign exchange which they have salted away in other countries, the most flagrant abuses of exchange control laws, the most high-handed highway robbery—all this has taken place during the last five years.

If starting from the passenger manifests of persons who have left this country the Income Tax Department starts investigations it will open up a trail into all these activities that I have mentioned—air tickets, gift cars and so on.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

How did Charlie get his car ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

How did Dr. Wicks get his car ? In the same way.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

The Sri Lanka Freedom Party supports *in toto* the proposal of the hon. Member for Agalawatta (Dr. Colvin R. de Silva) for the appointment of a Royal Commission of Inquiry to go into the allegations made against the Lake House, and we earnestly request a statement from the Hon. Acting Minister of Finance as to whether the Government is prepared to appoint such a commission.

අ. භා. 6.40

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු සභාපතිතුමනි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පරිපූරක ඇස්තමේන්තුව ගැන කථා කරන මේ අවස්ථාවේ ලේක් හවුස් සමාගමයේ විදේශ විනිමය වංචාව ගැන නැවත නැවත කියන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් මේ අවස්ථාවේදී මා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට විශේෂ ප්‍රශංසාවක් කරන්නට කැමතියි. මා ඒ ප්‍රශංසාව කරන්නේ ලේක් හවුස් පත්‍ර ආයතනයට කඩා පැනීම ගැන නොවෙයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ලේක් හවුසියට කඩා පැන්නා පමණක් නොව, ළඟදී මාතර නගරයේ එක්තරා ඉඩමකටත් කඩා පැන ඒ ඉඩමේ හදාගෙන තිබුණු කුඩා ගෙවල් තුනෙන් ඒවායේ සිටි මහජනයා එලවා දමා ඒ ගෙවලුත් කඩා දමා ඊළඟට අක්කර 25ක් තරම් විශාල වූ ඒ ඉඩමත් ආදායම් දෙපාර්තමේන්තුවට අත්පත් කර ගත්තා. ඒ සිද්ධිය තමුන්නාන්සේ වෙත ඉදිරිපත් කිරීමටයි මා බලාපොරොත්තු වන්නේ.

අක්කර 25ක් පමණ විශාල මේ ඉඩම ඩොනල්ඩ් රණවීර නැමැති මහත්මයකුට අයිති ඉඩමක් බව පළමුවෙන්ම සඳහන් කරන්නට සිදු වී තිබෙනවා. මේ ඉඩමෙන් පර්චස් 10, 15, 20, 40 සහ 80 තරම් වූ කොටස් ගණනාවක් ඒ ප්‍රදේශයේ ඉඩම් නැති මහජනයාට විකුණා තිබෙනවා. ඒ ඉඩම් කොටස් මිල දී ගැනීමට සමහර උදවිය තමන් එතෙක් පදිංචිව සිටි පර්චස් හතරේ පහේ හවුල් ඉඩම් පවා විකුණා මුදල් ලබා ගෙන තිබෙනවා. ඒ මුදල ප්‍රමාණවත් නොවූ නිසා වෙනත් මාර්ගවලින් ණයටත් අරගෙන තමයි මේ ඉඩම් කොටස් ගත්තේ. ඉඩම් කොටස් මිලදී ගත් සමහර අය ඒවායේ ගෙවල් හදා ගත්තා. හදිසියේ පොලීසියත් සමග පැමිණි නිලධාරීන් ඒ ගෙවල සිටි මිනිසුන් පන්නා දමා ඉඩම අත්පත් කර ගැනීම නිසා දැන් ඒ අසරණ මිනිසුන්ට යන්න එන්න අතක් නැතිවයි ඉන්නේ. ඒ නිසා නිරන්තරයෙන්ම මගේ නිවසට පැමිණ ඒ උදවිය තමන්ගේ දුක් ගැනවිල්ල කියා සිටිනවා. කම්බි ගැසීමටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙවල් තැනීමටත් ඉඩම් කොටස් ගැනීම වත් වැය කළ මුදලවත් ලබා දෙන්නැයි ඒ උදවිය මගෙන් ඉල්ලා සිටිනවා. මෙහිදී තවත් විශේෂ සිද්ධියක් ගැන සඳහන් කරන්නට තිබෙනවා. ඔය ඉඩම් මිලයට ගත් උදවිය තමන් ගෙවූ මුදල පර්ච් එකකට රු. 200 ක් නම් ඔප්පුවේ සටහන් කර තිබෙන්නේ පර්ච් එකක් ගත්තේ රු. 350 බැගින් ය කියායි. මට ඒ ආකාරයට දැනුම් දී තිබෙනවා. රු. 200 බැගින් විකුණා ඊට වැඩි ගණනක් ඔප්පුවේ සඳහන් කෙළේ මන් දැයි මා දන්නේ නැහැ. අද ඒ ප්‍රදේශයේ විශාල පිරිසකට මේ කුතුහලය ඇති වී තිබෙ නවා. ඒ නිසා මේ භයානක තත්ත්වය ගැන මා මේ ගරු සභාවේදී සඳහන් කර නවා. මේ ඉඩමේ අයිතිකාරයා වන ඩොනල්ඩ් රණවීර මහත්මයා ඒ ප්‍රදේශයට ගියේත් නැහැ. ඒ කටයුතු භාරව සිටින මහත්මයාත් දැන් ඒ ස්ථානයේ නැහැ. ඒ මහත්මයා ඒ ස්ථානයෙන් පැනලා ගිහිල්ලා කියලයි කියන්නේ. මිනිසුන්ගෙන් බේරෙන්නට බැරි නිසා පැනලා ගියාය කිය ලයි කියන්නේ. අද ඔහු සොයා ගන්නට වත් පුළුවන්කමක් ඇත්තේ නැහැ.

මේ මහත්මයාට අයිති කිංස් හෝටලය නම් ආයතනයක් තිබෙනවා. එහි විවිධ ව්‍යාපාර තිබෙනවා. ව්‍යාපාර 25 ක් පමණ තිබෙනවාය කියන්නට පුළුවනි. ඒවායේ වැඩ කරන උදවියත් දැන් ලොකු බියකින් තමයි පසු වන්නේ. කිංස් හෝටලයත් මේ විධියටම අරන්, ඒ ව්‍යාපාරත් නතර කර, ඔවුන් ඒ ස්ථානයෙන් එළියට දමනු ඇතැයි බියකින් ඒ උදවිය සිටිනවා. ඒ නිසා ගරු මුදල් ඇමතිතුමාගේ සැලකිල්ල එක් වැද ගත් කාරණයක් කෙරෙහි යොමු කරවන් නට කැමතියි. දේශීය ආදායම් දෙපාර්ත මේන්තුවට අය කර ගැනීමට තිබෙන මුදල් වෙනුවට මෙවැනි ඉඩම් අත්පත් කර ගැනී මේදී ඒ ඉඩම්වල ඉන්න උදවියට හිරිහැර යක් නොවන විධියට ඒ කාර්යය සංවිධානය කරනවා නම් හොඳයි. මුදල් ලබා ගැනීමට ඒ අනුව යම්කිසි ක්‍රියා මාර්ගයක් හරිගස්සා ගන්නවා නම් එය සාධාරණයි. අර ඉඩමෙන් පන්නා දමන ලද උදවිය දැන් ඉතාමත් කර දර සහිත තත්ත්වයකට වැටී සිටින නිසා ඒ ගැන සානුකම්පිකව සලකා බලා ඔවුන් ගෙවූ මුදලවත් ඔවුන්ට ලබා දෙන්නට වැඩ පිළිවෙළක් ඇති කිරීම ඉතාමත් වැදගත් බව මතක් කරන්නට කැමතියි. මේ අයට සහනයක් ලබා දෙන මෙන් මා නැවතත් ඉල්ලා සිටිනවා.

අ. භා. 6.45

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(The Deputy Chairman of Committees)

Order, Please! The Hon. Deputy Speaker will now take the Chair.

**අනතුරුව කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායක තුමා මූලාසනාරූඪ විය.**

அதன் பிறகு, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, உப சபாநாயகர் அவர்கள் (திரு. எம். சிவசிதம்பரம்) தலைமை தாங்கினார்கள்.

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු විමලසේන**
*(கௌரவ விமலசேன)*
(The Hon. Wimalasena)

Sir, the main issue in this matter, that is, the Supplementary Estimate, has been totally forgotten and ignored. Nobody spoke very much about it and, therefore, I do not think it is necessary for me to deal with it at all in my reply.

With regard to the subsidiary issue of exchange malpractices by the Lake House Group of Newspapers, I must say here and now that we, on our side here, are with most of the speakers who spoke about this matter this evening in condemning it in the strongest possible terms. Let it be known by everybody that there is no effort on the part of the Government, and never will be, to shield any wrongdoer and I must say that the strongest possible steps will be taken to deal with such people.

Sir, I dare say that it is a gigantic exchange fraud, and some hon. Members wanted me to make a statement on the action that will be taken by the Government on this matter. I am sure the lawyer Members of this House who spoke on this matter will appreciate the fact that it is neither

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු විමලසේන]

wise nor appropriate to make a statement on that question straightway on the Floor of this House when it is still being investigated. Nothing should be done to prejudice the steps that are being properly taken. That much I can say. But I can assure the House once again that everything necessary will be done to bring the culprits to book. I am not able to say whether a Royal Commission will be appointed, but, Royal Commission or otherwise, I can once again assure the House that adequate and proper steps will be taken.

Sir, some hon. Members were surprised about the intervention in these discussions by the Hon. Prime Minister. I must say that the Hon. Prime Minister was compelled to intervene in these discussions. It is very regrettable to note that an endeavour has been made to drag in his name and give a mischievous twist to this matter, and that kind of thing cannot be prevented from being utilized for political propaganda. That is why the Hon. Prime Minister intervened in these discussions.

I have nothing more to say on this matter because, as I said earlier, we are one with most of the views expressed with regard to exchange malpractices.

As regards the observations made by the hon. Member for Matara (Mr. Tudawe), I am not able to give him any details about the matter that he raised but I can say that I shall go into it and take appropriate action.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## පරිපූරක මුදල: විශ්‍රාම වැටුප්

## குறைநிரப்புத் தொகை : இளைப்பாற்றுச் சம்பளம்

## Supplementary Supply: Pensions

**ගරු විමලසේන**

*(கௌரவ விமலசேன)*

(The Hon. Wimalasena)

I move,

"That a supplementary sum not exceeding Rupees Four million five hundred thousand (Rs. 4,500,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto:

*Schedule*

| | Rs. |
|---|---|
| Head 37—Pensions, Vote No. 2—Administration Charges—Recurrent Expenditure .. .. | 4,500,000." |

A sum of Rs. 61.5 million was provided in the current year's Estimates under Head 37, Vote No. 2, Sub-head 2, to meet the payment of Cost of Living Allowance and Special Living Allowance to pensioners. It is now found that an additional sum of Rs. 4.5 million is required for expenditure in the current financial year as a result of the increased number of pensions awarded during the year. Sometimes it is rather difficult to assess with accuracy the number of pensions that become payable in the course of any year, and as cases come up these pensions have to be paid. It is a feature every year, and this year a supplementary sum of Rs. 4.5 million is necessary to pay the increased pensions.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question proposed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ.භා. 6.53

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්‍රාම වැටුප් අංශයේ ප්‍රමාදය නිසා රජයේ සේවයෙන් විශ්‍රාම ගෙන යන සේවකයන්ට විශාල දුෂ්කරතාවලට මුහුණ පාන්නට සිදු වී තිබෙන බව මතක් කරන්නට කැමතියි. භාණ්ඩාගාරයේ විශ්‍රාම වැටුප් ශාඛාවේ තිබෙන ප්‍රමාද දෝෂ ගැන ජනතාව අවුරුදු ගණනාවක් තිස්සේ බලවත් විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙනවා. මේ ශාඛාවේ ප්‍රමාද දෝෂ නිසා රජයේ සමහර සේවකයන්ට ජීවිතාන්තය දක්වාම විශ්‍රාම වැටුප් ගන්නට නුපුළුවන් වූ අවස්ථා තිබෙනවා. එවැනි සිද්ධීන් එකක් දෙකක් මටත් ඉදිරිපත් කරන්නට පුළුවනි. සමහරුන් අවුරුදු 30 ක් රජයේ සේවය කර වයස අවුරුදු 60 දී සේවයෙන් විශ්‍රාම ලබා යනවා. ඔවුන් තමන්ගේ විවේක කාලය සැපසේ ගත කරන්නටයි, බලාපොරොත්තු වන්නේ. සමහර අය අවුරුදු තුනක් හතරක් විශ්‍රාම වැටුප් ලබාගෙන ජීවත් වෙනවා. ඇත්තෙන්ම විශ්‍රාම වැටුප් අංශයේ ප්‍රමාද දෝෂ නිසා මුළු ජීවිත කාලය තුළදීම විශ්‍රාම වැටුප් ගන්නට බැරි වූ රජයේ සේවකයන් කීප දෙනකු සිටින බව මගේ අත්දැකීමෙන් කියන්නට පුළුවනි. සමහර අයට ඔවුන්ගේ ජීවිත කාලය තුළදී පමණක් නොව ඔවුන්ගේ භාර්යාවන්ගේ ජීවිත කාලය තුළදීවත් ඔවුන්ට ලැබෙන්නට තිබෙන විශ්‍රාම වැටුප් ගන්නට බැරි වී තිබෙනවා.

ඊයේ පෙරේදා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ "බඩර්" කෙනකු වශයෙන් සේවය කළ, මා නියෝජනය කරන කොට්ඨාශයේ කෙනකු ඔහුගේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය මට ඉදිරිපත් කළා. ඔහු අවුරුදු 30 ක් සේවය කළ සුළු සේවකයෙක්. 1928 සිට 1958 දක්වා ඔහු රජයේ සේවයේ යෙදී සිට විශ්‍රාම ලබා ගත්තා. එහෙත් 1958 සිට අද වන තුරුත් ඔහුගේ විශ්‍රාම වැටුප් ගෙවා නැහැ. ඔහු නොයෙක් ලියවිලි ඉදිරිපත් කර ඔහුගේ විශ්‍රාම වැටුප් සකස් කර ගන්නට උත්සාහ කර තිබෙනවා. ඒ එක ලියවිල්ලකටවත් පිළිතුරක්වත් ලැබී නැහැ. මම ඔහුගේ දුක්ගැනවිල්ල ඉදිරිපත් කළායින් පසු ලිපියක් ඉදිරිපත් කර ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාට ටෙලිෆෝන් මගිනුත් කථා කර ඒ පුද්ගලයාගේ විශ්‍රාම වැටුප් ඉක්මණින් ලබා දෙන්නට උත්සාහ කළා. එහෙත් අද වන තුරුත් අවසාන තීරණයක් ගන්නට පුළුවන් වී නැහැ.

මෙවැනි සිද්ධීන් ඕනෑ තරම් තිබෙන්නට පුළුවනි. විශ්‍රාම ලබාගෙන වාසනාවන්ත විශ්‍රාම කාලයක් ගත කිරීමට බලාපොරොත්තු වුණු රජයේ සමහර සේවකයන්ට විශ්‍රාම වැටුප් අංශයේ ප්‍රමාද දෝෂ නිසා අභාග්‍ය සම්පන්න තත්ත්වයන්ට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. අවුරුදු කීපයක් යන තුරු විශ්‍රාම වැටුප් ලබා ගන්නට බැරිවීම අවාසනාවන්ත තත්ත්වයක්. ඊට හේතු රාශියක් තිබෙනවා. සමහර ලියවිලි නැති වී තිබෙනවා. පෞද්ගලික ලිපි ගොනුවල තිබුණු සමහර ලියවිලි නැති වී තිබෙනවා. සමහර විට නිලධාරීන්ගේ වරද නිසාත් කලට වේලාවට අවශ්‍ය ලිපි නියම ආකාරයට නියම ස්ථානයන්ට යවා නැහැ. සේවය කළ දෙපාර්තමේන්තු වලිනුත් නියම වේලාවට අවශ්‍ය ලිපි ලේඛන විශ්‍රාම වැටුප් අංශයට යවා නැහැ. කොතරම් ප්‍රමාද දෝෂ තිබුණත්, දෙපාර්තමේන්තුවල අඩු පාඩු තිබුණත්, නිලධාරියාගේ නොසැලකිල්ලෙන් සිදු වූ, නැත්නම් අමතක වීමෙන් සිදුවූ, යම් යම් කරුණු තිබුණත් රජයේ විශ්‍රාම වැටුප් අංශයට එක්තරා වගකීමක් තිබෙනවා. භාණ්ඩාගාරයේ විශ්‍රාම වැටුප් අංශයෙහි එක්තරා සංවිධානාත්මක වැඩ පිළිවෙළක් ඇති කිරීමෙන් විශ්‍රාම ගන්නා රජයේසේවකයින්ට මීට වඩා ලෙහෙසි පහසු ඉක්මන් ක්‍රමයකට විශ්‍රාම වැටුප් ලබා ගැනීමට අවස්ථාව සලස්වන මෙන් මා ඉල්ලීමක් කරනවා. වර්තමාන යුගයේ දවස් කීපයක් ඇතුළත හඳට ගොස් එන්නටත් පුළුවන් නම් එක්තරා සංවිධානාත්මක සැලැස්මක් පිළියෙළ කළොත් කිසිම ප්‍රමාදයක් නැතිව විශ්‍රාම වැටුප් ලබා ගන්නට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැති බව මා කියන්නට සතුටුයි. රජයේ සේවකයින්ට තමන්ගේ පෞද්ගලික ලිපි ගොනුව එක්තරා පිළිවෙළකට සකස් කරන්නට උදව් කරන්නට පුළුවනි. පෞද්ගලික ලිපි ගොනු සකස් කිරීම පිළිබඳව නීතිරීති වලට අනුකූලව චක්‍ර ලේඛන

පරිපූරක මුදල්

[ද මැල් මයා.]

මගින් රජයේ සේවකයන්ට විශේෂ උපදෙස් නිකුත් කරන්නට පුළුවනි. විශේෂයෙන්ම විශ්‍රාම ගන්නට අවුරුද්දකට දෙකකට කලින් තමන්ගේ ලිපි ගොනුවත් වෙනත් අවශ්‍ය ලිය කියවිලිත් නියම පිළිවෙළට ගොනු කර ගන්නට රජයේ සේවකයන්ට උපදෙස් මාලාවක් නිකුත් කරන්නට පුළුවනි. එවැනි වැඩ පිළිවෙළක් ඇති කිරීම ගැන අවධානය යොමු කරවන මෙන් මා වැඩ බලන ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. විශ්‍රාම වැටුප් අංශයේ යල් පැනපු ක්‍රම අහෝසි කර මීට වඩා සංවිධානාත්මක, කාර්යක්ෂම, සීඝ්‍ර වැඩ පිළිවෙළක් සකස් කර රජයේ සේවකයන්ගේ විශ්‍රම වැටුප් ප්‍රශ්න නිරාකරණය කිරීමට ක්‍රියා කරන මෙන් යලිත් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 7

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**

විශ්‍රාම වැටුප් සම්බන්ධව පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී මා පළමුකොටම ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කම්කරුවන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නයක් ගැන වැඩ බලන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට සතුටුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට කම්කරුවන් බඳවා ගත් අවස්ථාවේදී ඔවුන්ගේ උප්පැන්න සහතික යනාදිය නියම පිළිවෙළට නොගත් නිසා විශ්‍රාම යන අවස්ථාව වන විට ඒ කම්කරුවන්ගේ නියමෙ වයස සම්බන්ධව දැනගන්නට දෙපාර්තමේන්තුවට පුළුවන්කමක් ලැබී නැහැ. මේ බොහෝ කම්කරුවන් විශ්‍රාම වැටුප් ලබන තත්ත්වයට උසස් කර තිබෙන්නේ අවුරුදු හැටේ සීමාව පැන්නාට පසුවයි. බොහෝ කම්කරුවන් වයස අවුරුදු හැටපහ, හැට අට වන තෙක්—විශ්‍රාම ගන්නා කාලයත් පසු කර—ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩ කර තිබෙනවා. මේ උදවිය දැන් විශ්‍රාම වැටුප් ලැබීමට සුදුස්සන් වී සිටිතත් වයස අවුරුදු හැට පන්නාට පසුවත් සේවය කර තිබෙන නිසා විශ්‍රාම වැටුප් ලබා ගන්නට බැරි තත්ත්වයක් තිබෙනවා. මෙවැනි කම්කරුවන් හතළිස් දෙනෙකු පමණ අද කිසිම විශ්‍රාම වැටුපක් නැතිව ඉතාම අමාරුවෙන් කාලය ගත කරන බව මා දන්නවා. මේ අය බොහෝ දුක් කරදර මධ්‍යයේ මහා ඝන කැලෑවල වැඩ කළ කම්කරුවන් බව මා වැඩ බලන ගරු මුදල් ඇමතිතුමාට මතක් කරන්නට සතුටුයි. ඉඩම් සංවර්ධනය සඳහා දිවයිනේ නොයෙක් ප්‍රදේශවලට ගෙන යනු ලැබූ මේ කම්කරුවන් අද වැඩක් පලක් කර ගන්නට බැරිව මහළුව සිටින අවස්ථාවේදී විශ්‍රාම වැටුපක් ලබා ගන්නට අවුරුදු ගණනාවක් තිස්සේ බලා ගෙන සිටින්නට සිද්ධ වී තිබෙනවා.

මාතර, වැවහමන්දුවේ පදිංචි ඒ. පී. ජේම්ස් අප්පුහාමි නම් මහළු කම්කරු මහත්මයකු ගැන මා දන්නවා. ඒ මහත්මයාට භාණ්ඩාගාරයේ අංක පී. එල් 65643/පී දරණ ලිපියෙන් විශ්‍රාම වැටුප් ප්‍රදානය කරන බව දැනුම් දී තිබෙන්නේ වී නමුත් තවම එය ලැබී නැහැ. මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයෙන් විමසූ විට භාණ්ඩාගාරයේ නිලධාරි මහත්වරුන් කියා සිටියේ මේ උදවිය විශ්‍රාම වැටුප් ලැබිය යුතු වයසේ සීමාවෙන් පිට පැන—ඒ කියන්නේ අවුරුදු හැට පහ, හැට හය දක්වා වැඩ කර—තිබෙන නිසා ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් කරදරයක් තිබෙනවාය යන්නයි. ඒ වාගේම මට දැනගන්නට ලැබුණා එය විශේෂ කාරණයක් හැටියට සලකාගෙන එම උදවියට විශ්‍රාම වැටුපක් ලබා දීම සඳහා කටයුතු සලස්වන්නට ගරු මුදල් ඇමතිතුමාට පුළුවන්කම තිබෙන බව. මේ සම්බන්ධයෙන් විශෙෂ සැලකිල්ලක් දක්වා ක්‍රියා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය ගැන ඊළඟට කතා කරන්නට කැමතියි. ලංකාවේ ප්‍රධාන ගුරු සංගම් කීපයක් මගින් මෙම කාරණය ගැන රජයට කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඔවුන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳව පවත්නා වෙනස ගැන එම කරුණුවල සඳහන් වී තිබෙනවා. රජයේ අනිකුත් සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමයක් තමයි අද මේ රටේ ගුරුවරුන් කෙරෙහි බල පාන්නේ. ගුරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වරුන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ තත්ත්වය එසේම තිබියදී, අනිකුත් රජයේ සේවකයන් කෙරෙහි බල පාන සියලුම මුදල් රෙගුලාසි සහ පාලන රෙගුලාසි පිළිපදින්නවත් ඔවුන් බැඳී සිටිනවා. නීති රීතිවලින් කොතෙක් බැඳී සිටියත්, අනිකුත් රජයේ සේවකයන්ට මෙන් විශ්‍රාම වැටුප් පිළිබඳ සහනයක් ගුරුවරුන්ට නැති එක ගැනයි ඔවුන් කියන්නේ.

ලංකා ජාතික ගුරු සංගමය, සමස්ත ලංකා ද්‍රවිඩ ගුරු සංගමය, ජාතික ගුරු සංගමය, සමස්ත ලංකා ඉස්ලාම් ගුරු සංගමය, සමස්ත ලංකා රජයේ පාඨශාලාවල ද්‍රවිඩ ගුරුවරුන්ගේ සංගමය සහ ද්විතීයික පුහුණු ගුරුවරුන්ගේ සංගමය වැනි ගුරු සංගම් ගණනාවකින්ම මේ පිළිබඳව සංදේශ ඉදිරිපත් කර තිබෙනවා. විශ්‍රාම වැටුප් අතින් තමන්ට බල පාන්නාවූ විෂමතාවන් නැති කරන ලෙසයි ඔවුන් නිතරම කියා සිටින්නේ.

1965 අවුරුද්දේ ගුරු වෘත්තියෙහි යෙදී සිටියේ 91,981 දෙනෙක් පමණයි. ඔවුන්ගෙන් 85,953 දෙනෙක් පමණ සේවය කළේ රජයේ පාඨශාලාවලයි. මෙම ගුරුවරුන්ගෙන් වැඩි දෙනෙකුට විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් වෙනසක් ඇති වුණු නිසා අද ඔවුන්ගේ තත්ත්වය අනිකුත් ගුරුවරුන්ගේ තත්ත්වයට වඩා වෙනස් වී තිබෙනවා.

තමුන්නාන්සේ දන්නවා ගුරුවරුන්ට විශ්‍රාම වැටුප් ලබා දීම සඳහා පළමුවෙන්ම ව්‍යවස්ථා ඉදිරිපත් කළේ 1928 අවුරුද්දේ බව. මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය පළමුවෙන්ම ආරම්භ කළේ ආධාර ලබන පාඨශාලාවල සේවය කරන ගුරුවරුන් සඳහායි. රජයේ පාඨශාලාවල සේවය කළ ගුරුවරුන්ට අනිකුත් රජයේ පොදු සේවාවන්හි යෙදී සිටින සේවකයන්ට මෙන් විශ්‍රාම වැටුප් වරප්‍රසාද ලැබුණු අතර, ආධාර ලබන පාඨශාලාවල ගුරුවරුන්ට එවැනි වරප්‍රසාද නොලැබුණු නිසා මෙවැනි ක්‍රමයක් ආරම්භ කළ නමුත්, යටත් විජිත කාලයේදී—ඒ කියන්නේ 1934 අවුරුද්දේ—හිටපු මුදල් ලේකම්තුමා ආණ්ඩුවේ ආදායම වැඩි කර ගැනීමේ අදහස ඇතිව ආධාර



ලබන පාඨශාලාවල ගුරුවරුන් එම විශ්‍රාම වැටුප් ක්‍රමයෙන් ඉවත් කරන්නට ඕනෑ යයි නියමයක් කළා. එම ඉවත්කිරීම නිසා මොවුන්ට සිදු වුණා. තමන්ගේ විශ්‍රාම වැටුප වෙනුවෙන් සියයට 4 ක පරිත්‍යාගයක් කරන්නට. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමතිවරයා වශයෙන කටයුතු කළ කාලයේදී විශ්‍රාම වැටුප් වෙනුවෙන් ඒ අන්දමට සියයට 4 බැගින් කපා ගත් මුදල සියයට 2 දක්වා අඩු කළ බව අප දන්නවා. නමුත් තවමත් මේ රටේ ගුරුවරුන්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් සඳහා පඩියෙන් සියයට 2 ක් ගෙවන්නට සිදු වී තිබෙනවා.. මේක ඉතාමත්ම අසාධාරණයි. අද රජයේ අනිකුත් සේවකයන්ට ලැබෙන විශ්‍රාම වැටුප් වරප්‍රසාද ගුරුවරුන්ට ඒ විධියටම ලැබෙන්නෙ නැහැ. තමන් රජයේ සේවකයන් හැටියට සලකනවා නම්, අනිකුත් රජයේ සේවකයන්ගෙන් බලාපොරොත්තු වන යුතුකම් තමන්ගෙනුත් ඉටුවිය යුතුය කියා බලාපොරොත්තු වෙනවා නම්, රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමයට සමාන විශ්‍රාම වැටුප් ක්‍රමයක් තමන් සම්බන්ධයෙනුත් ඇති කර විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් ගෙවීමෙන් තමන් නිදහස් කරන ලෙස ගුරුවරුන් ඉල්ලා සිටිනවා.

1951 සිට 1964 සැප්තැම්බර් 30 වැනිදා දක්වා මේ රටේ ගුරුවරුන්ගේ වැටුපෙන් සියයට 4 ක් විශ්‍රාම වැටුප් සඳහා අය කළා. 1964 ඔක්තෝබර් 1 වැනිදා සිට ඒ ප්‍රමාණය සියයට 2 දක්වා අඩු කළා. ඒ නිසා 1951 සිට 1964 දක්වා කපා ගත් වැඩිපුර සියයට දෙකේ ප්‍රමාණය ඔවුන්ට ආපසු දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. ඔවුන් ඒ මුදල ආපසු ඉල්ලා සිටින නිසා එය දීම ආණ්ඩුවේ යුතුකමක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාසල්වල උගන්වන ගුරුවරියන්ගෙන් වැන්දඹු විශ්‍රාම අරමුදල සඳහා මුදල් කැපීමක් කරන්නේ නැහැ. වැන්දඹු විශ්‍රාම අරමුදලට මුදල් කපා ගන්නේ ගුරුවරුන්ගෙන් පමණයි. මේ තත්ත්වය නිසා සමහර විට ගුරු වෘත්තියේ යෙදී සිටින ගුරුවරියනට අසාධාරණයක් සිදු වන්නට ඉඩ තිබෙනවා. එමනිසා වැන්දඹු විශ්‍රාම වැටුප්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

අරමුදලට ඔවුන්ගෙනුත් මුදල් කපාගෙන විශ්‍රාම ගිය පසු ඒ මුදලින් අනාථ දරුවනට සහන සලසා දෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් සඳහා වැටුපෙන් සියයට 2 ක කැපීමක් නොකෙරෙන අන්දමටත්, අනිකුත් රජයේ සේවකයන්ට බලපාන වෙනත් වරප්‍රසාද පිළිබඳ නීතිරීති ගුරුවරුන් සම්බන්ධයෙනුත් එසේම බලපාන අන්දමටත් ව්‍යවස්ථා සංශෝධනය කරන ලෙස මා වැඩ බලන ගරු මුදල් ඇමතිතුමාගෙන් නැවතත් ඉල්ලා සිටිනවා.

යම්කිසි ගුරුවරයකු නියමිත කාලයට— එනම් විශ්‍රාම ලැබීමට— පෙර මියගියොත් ඔහු සේවයට බැඳීමේදී කවර අන්දමේ ප්‍රකාශයක් කොට තිබුණත් ඔහුට ලැබිය යුතු මුදල හෝ ඔහු විසින් ගෙවා ඇති මුදල ඔහුගේ භාර්යාවට සහ ළමයින්ට ලැබෙන අන්දමට නීතිය සකස් කරන ලෙස මා වැඩ බලන මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ කරුණු ටික ඉදිරිපත් කරමින් අද ගුරු වෘත්තිය තුළ වුවත් දෙයාකාරයක විශ්‍රාම වැටුප් ක්‍රම තිබෙන නිසා මේ දෙයාකාරයක පවත්නා වූ විශ්‍රාම වැටුප් ක්‍රම එක විශ්‍රාම ක්‍රමයක් බවට පත් කරන ලෙසත්, අනිකුත් රජයේ සේවකයන්ගේ ගණයේ ලා ඔවුන්ටද විශ්‍රාම වැටුප් හා අනිකුත් වරප්‍රසාද ලබා දෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

අ. භා. 7.13

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්‍රාම වැටුප් පිළිබඳව කතා කරන විට මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) විසින් ඉදිරිපත් කරන ලද ගුරුවරුන්ගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නය විශාල දෙයක් බව අපට පෙනී යනවා. මේ රටේ ඉදිරි අනාගත පැවැත්ම සම්පූර්ණයෙන්ම රඳාපවතින ගුරුවරුන්ට අපි අසාධාරණ ලෙස සලකන බව අපට පෙනී යනවා. ඒ නිසා දැනට විශ්‍රාම වැටුප් ලබන වෙන කිසිවෙකුට නැති අන්දමේ අමුතු සැලකිල්ලක් ගුරුවරුන්ට දක්වන නිසා ඒ අමුතු සැලකිල් සම්පූර්ණයෙන්ම අස් කර අනිකුත් රජයේ සේවකයන්ගේ තත්ත්වයෙන්ම ඔවුන්ටද සලකන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගුරුවරුන්ට පමණක් නොවෙයි, විශ්‍රාම වැටුප් ලැබීමේදී අනෙකුත් අයටත් සිදුවන විශාල වරදක් තිබෙනවා. එය නැති කරන්නට ගරු මුදල් ඇමතිතුමා කටයුතු කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. තම ජීවිත කාලය අන්තිමේදී විශ්‍රාම වැටුප් පිළිබඳ පෝර්ම අත්සන් නොකර යම්කිසිවෙකු මරණයට පත් වුණොත්, සමහර විට වයස අවුරුදු 55 දී විශ්‍රාම ලබන කෙනෙකු 55 වෙනි අවුරුද්දේ අන්තිම දවසේ දී වුණත් විශ්‍රාම වැටුප් ලියකියවිලි අත්සන් නොකර මරණයට පත් වුණොත්, තමන්ගෙන් පැවතෙන්නන්ට ඒ මුදල් ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ නීති වෙනස් කර එවැනි උදවියගේ දරුමල්ලන්ට හා භාර්යාවනට ඒ මුදල් ලබාගැනීමට හැකිවන අන්දමට අළුතෙන් නීති රීති සකස් කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1965 මහා මැතිවරණ කාලයේදී එක්සත් ජාතික පක්ෂයේ සමහර මන්ත්‍රීධුරාපේක්ෂකයන් ප්‍රකාශ කළා, අවුරුදු 60 න් ඉහළ හැම කෙනෙකුටම විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කරනවාය කියා. මගේ ආසනයට අල්ලපු ආසනයක ගරු මන්ත්‍රීවරයෙකුත් ඔහුගේ නමින්ම මේ කාරණය සඳහන් ප්‍රකාශනයක් ප්‍රචාරය කළා. එහෙත් අද වන තුරු ඒ ගැන වචන මාත්‍රයක්වත් සඳහනක් නැහැ. මෙය මහජනතාව නොමග යැවීමට හේතුවක්ව පවතිනවා. ඒ මෙයයි: සමාජ සේවා ඇමති අංශයෙන් නොයෙක් විධියේ අසරණයන්ට රුපියල් පහ, දහය, පහළොව ආදී වශයෙන් විස්ස දක්වා අනාථාධාර වශයෙන් දෙන මුදල් රජයෙන් දෙන විශ්‍රාම වැටුප් හැටියට සමහර පුද්ගලයන් හඳුන්වා දෙනවා. මෙය සම්පූර්ණයෙන්ම කණපිට පෙරළා අසත්‍ය ප්‍රකාශ කිරීමක් වශයෙන් මා සලකනවා. ඒ නිසා රජය ප්‍රතිපත්තියක් වශයෙන් ඉදිරිපත් නොකළත්, එක්සත් ජාතික පක්ෂයේ උදවිය මන්ත්‍රීධුරාපේක්ෂකයන් වශයෙන් ඉදිරිපත් කළ මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පොරොණ්දුවේ හැටියට වයස අවුරුදු 60 ට වැඩි හැම කෙනෙකුටම විශ්‍රාම වැටුපක් දීමට කටයුතු සලස්වන හැටියට මා ඉල්ලා සිටිනවා.

රටේ සංවර්ධනය සඳහා තමන්ගේ ජීවිතය කැප කරන උදවිය වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම ගොවියා තමාගේ ජීවිතය සම්පූර්ණයෙන්ම ගත කරන්නේ මේ රටේ අනාගත ජාතියේ සුභසිද්ධිය සඳහායි. මේ රටේ කම්කරුවන් තමන්ගේ දහඩිය පමණක් නොවෙයි, තම මුළු ශ්‍රමයම යොදවන්නේ මේ රටේ ජාතියේ අභිවෘද්ධිය සඳහායි. ඔවුන් සමහරවිට මැරෙන තුරුම වගේ මේ සේවය කරනවා. එවැනි උදවියට වයස අවුරුදු 60 සම්පූර්ණ වුණායින් පසු බොහෝ විට ජාතියට සේවයක් කරන්නට ඉඩක් ලැබෙන්නේ නැහැ. ඔවුන් අන්තිමේදී මිය යන්නේ ඉතා දුඃඛිත අන්දමටයි. කම්කරුවා ගොවියා පමණක් නොවෙයි, මේ රටට මහා විශාල සේවයක් කළ මේ රටේ සිටි මහා වීර පුරුෂයෙක් නැත්නම් ජාතියේ නායකයෙක් හැටියට අද උදේ වරුවේ මේ ගරු සභාවේදී හැඳින්වුණු ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා පාර්ලිමේන්තුවෙන් ගියාට පසු මේ ගරු සභාවට පසුගිය කාලයේ ආයාචනා කීයක් ඉදිරිපත් කළාද කියා තමුන්නාන්සේට මතක ඇති. මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුපක් නැති නිසා එතුමා පසුගිය කාලයේ ජීවත් වූයේ මොන තරම් අමාරුවකින්ද කියා ඒවායින් පෙනෙනවා. මේ ගරු සභාවේ මුදල් ඇමතිවරුන්ට ආයාචනා කීපයක්ම ඉදිරිපත් කළා. එහෙත් එතුමාට සෙතක් ඇති වුණේ නැහැ. මේ රටේ පැවැත්ම සඳහා මේ රටේ ඉදිරි ගමන සඳහා කටයුතු කරන දේශපාලනඥයාගේ අනාගතය පිළිබඳව කිසිම සථිරතාවක් නැහැ. ඔහුගේ දරුමල්ලන්ට හා ඔහුගේ බිරිඳට අනාගතය පිළිබඳව කිසිම අන්දමක විශ්වාසයක් තබාගෙන ඉන්නට බැහැ. ඔහු අන්තිමට අනාථයෙක් නැත්නම් හිඟන්නෙක් බවට පත් වෙනවා. අවංකව සේවය කරන දේශපාලඥයාට අවසානයේදී කිසිවක් නැතිව හිඟන්නෙක් බවට පත් වී මහ මඟට බසින්නට පවා සිදු වෙනවා. පසුගිය කාලයේ කන්නන්ගර මැතිතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණු ලිපිවලින් අපි ඒ සිද්ධිය ඇසින්ම දැක්කා. ඒ නිසා ඒ කාරණය සම්බන්ධව යම් ක්‍රියා මාර්ගයක් ඇති කරන්නය කියා ගරු මුදල් ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

එසේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමන්ගේ ශ්‍රමය මේ රටේ දියුණුවට කැප කරන ගොවියාටත්, කම්කරුවාටත් අවසාන කාලයේදී තම ජීවිතය ගෙනයෑම සඳහා විශ්‍රාම වැටුපක් නොලැබුණොත් අන්ත දුගී තත්ත්වයකට පත් වී මහ මඟට බසින්නට පවා සිදු වෙනවා. ඒ නිසා ගොවියාත් කම්කරුවාත් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් මේ රටේ ඇති කරන්නය කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 7.20

**වෛද්‍යාචාර්ය නාගනාතන්**

*(டொக்டர் நாகநாதன்)*

(Dr. Naganathan)

The matter of pensions, I think, deserves some part of the Hon. Minister's time and effort. The whole department requires to be streamlined. I know of instances where government servants have died and their widows and children have not received their pension sometimes for one year, sometimes two. There have been a number of such cases. Sometimes the case numbers are different. Why should that happen? After all, it is the department that gives the case number. There is a lot of delay, causing pain, worry and anguish. The Hon. Minister must take measures to see that the department is streamlined, that every section is streamlined.

Next, I agree totally with what the hon. Member for Matara said about teachers' pensions. It is not only teachers who are affected in this way. Even local government employees are similarly affected. I am sorry the Minister is not here. There are cases where people have waited for 15 years for their pensions. They have come to me and I have looked into their matters and written many letters on their behalf. There is something wrong some-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය නාගනාතන්]

where. There must be follow-up action so that two or three months after a person's death his children and widow will be able to get their pension instead of having to wait for fifteen years.

The question of teachers' pensions reminds me of what I spoke this morning, about teachers who are still in private schools. They were on a contributory pension scheme. The most reactionary, the most irregular action was done by the previous Government when it stopped their pensions. It was a most disgraceful thing. Those teachers had done a service to the country. The good Lady, the hon. Leader of the Opposition, is looking at me. I cannot help it. I do not blame her. I blame her officers and the so-called progressive sections who have been the most retrograde and most reactionary people in this country.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

Blame yourself.

**වෛද්‍යාචාර්ය නාගනාතන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)

I do not blame myself. You blame yourself. Sir, they should be ashamed.—[*Interruption*]. I knew the late Dr. Kannangara and he used to say—he was also a teacher in a private school—that that was unfair. — [*Interruption*]. In the modern world, all workers, whether they be government servants or people working in the private sector, are given pensions when they get old and weak. But, in our country, people pretend to be progressives when they are the most reactionary.—[*Interruption*]. I can excuse you. You were innocent. Your advisers, the people who shout here, are the people who are responsible for this monstrosity.

I am surprised that this Government has not corrected the wrong done to the teachers in private

පරිපූරක මුදල්

schools. They, too, have been following the Bandaranaike policies. There were good Bandaranaike policies and there were bad Bandaranaike policies. They are still observing the Bandaranaike policies. There are afraid. What are they afraid of? Why should they be afraid? If they cannot govern let them get out of their seats of power. If they cannot do the right thing or correct the wrongs done by other governments, then they should not be the Government. That is my advice.

අ. භා. 7.25

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය නාගනාතන්) විශ්‍රාම වැටුප් කාලය ළඟා වූ කෙනෙකු මෙන් කථා කළා. එතුමාට විශ්‍රාම දුන්නොත් රටට සේවයක් වන්නට පුළුවනි. එතුමා කථා කළේ කරුණු නොදැනයි. අප ආධාර ලබන පාඨශාලා රජයට ගත්තාඨින් පසු ඒ පාඨශාලාවල සේවය කළ ගුරුවරුන්ට තිබුණු අයිතිවාසිකම් නැති කෙළේ නැහැ. හැබැයි, දේශපාලන අයිතිවාසිකම් නම් දුන්නේ නැහැ. රජයේ අනෙක් ගුරුවරුන්ට තිබුණු අයිතිවාසිකම් සියල්ලම ඒ ගුරුවරුන්ටත් දුන්නා. [බාධා කිරීමක්] දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධව එක්තරා විධියක මතභේදයක් තිබුණා. ආණ්ඩුවේ වරදකින් ඒ අයිතිවාසිකම නොලැබුණා නොවෙයි.

වෘත්තීය සමිති අයිතිවාසිකම් හා දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධව යෝජනා ඉදිරිපත් කිරීමට තෙන්නකෝන් කාරක සභාව ඒ කාලයේ පත් කළා. ඒ කාරක සභාවට වෘත්තීය සමිති නායකයනුත් සිටියා. විල්ප්‍රඩ් පෙරේරා වැනි අය එහි සිටියා. ආධාර ලබන පාඨශාලාවල ගුරුවරුන්ට සහ අනෙක් ගුරුවරුන්ට දේශපාලන අයිතිවාසිකම් දීම යුක්තිසහගත නැතැයි ඒ අය කියා සිටියා. ඒ යෝජනා සම්බන්ධයෙන් වාර්තා කිරීම සඳහා නැවත කොමිටියක් පත් කරන්නට යෙදුණා. අපේ ආණ්ඩුව බිඳ වැටුණේ ඒ අවස්ථාවේදීයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ තත්ත්වය ඒක වුණත්, විශ්‍රාම වැටුප් දීම සම්බන්ධයෙන් අප කිසිම වෙනසක් කෙළේ නැහැ; කිසිම අයිතිවාසිකමක් නැති කළේ නැහැ. දිගටම ආණ්ඩුවේ සේවයේ යෙදී සිටි ගුරුවරුන්ටත්, උපකෘත පාඨශාලාවල සේවය කොට ආණ්ඩුවේ සේවයට බැඳුණු ගුරුවරුන්ටත්, අනෙක් සේවකයන්ටත්, එක හා සමාන අයිතිවාසිකම් දෙන ලෙස මා මේ රජයෙන් ඉල්ලා සිටිනවා. උපකෘත පාඨශාලා රජයට ගනිද්දී ඒවායේ සේවය කළ ගුරුවරුන්ට වුවමනා නම් විශ්‍රාම වැටුප් ලබාගෙන අස් වී යන්නට අවසර දුන්නා. ඒ නිසා නල්ලූර්හි මන්ත්‍රීතුමා කෑගැසුවේ කරුණු නොදැනයි. [බාධා කිරීමක්]

**වෛද්‍යාචාර්ය නාගනාතන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)

When a Member is saying something which is not true, it must be corrected.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The hon. Member for Kolonnawa is not giving way.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්‍රාම ගෙන කාලයක් ගත වූ සේවකයන්ට බණ්ඩාරනායක ආණ්ඩු කාලයේ දී එක්තරා වියඩ්ක සහනයක් දුන්නා. "කොමියුටඩ් පෙන්ෂන්" මුදල එකවර ගත් සේවකයන් අවුරුදු දහයකට වැඩියෙන් ජීවත්ව සිටියා නම් නැවත වරක් සම්පූර්ණ විශ්‍රාම වැටුප් දෙන්නට ක්‍රියා කළා. හුඟ කාලයක් තිස්සේ විශ්‍රාම වැටුපෙන් හතරෙන් තුනක් ගත් අය සිටියා. අවුරුදු දහයක් දොළහක් ගත වුණාට පසුවත් ඔවුන්ට ලැබුණේ ඒ වැටුප මයි. එයින් ඒ අයට පාඩු සිදු වුණා. ඒ නිසා පසුගිය ආණ්ඩුව ඒ අඩුපාඩුව සකස් කළා.

නව කාරණයක් තිබෙනවා. ඒ ගැන ගරු මුදල් ඇමතිතුමාට කීප වරක්ම මතක් කළා. එහෙත් තවමත් ඒ ගැන ක්‍රියා කෙරී



නැහැ. තවමත් දෙන්නේ සියයට 75 කට වුවමනා කරන ජීවනාධාර දීමනාවයි. කරුණාකර සම්පූර්ණ ජීවනාධාර දෙන ලෙස මා නැවතත් ඉල්ලා සිටිනවා.

පළාත් පාලන සේවකයන්ට නම් අර කියන ලද සහනය තවමත් ලැබී නැහැ. පළාත් පාලන ඇමතිතුමා මේ සම්බන්ධයෙන් කථා කරන විට එහි වගකීම මුදල් ඇමතිතුමා පිට තබනවා. මුදල් ඇමතිතුමා කියන්නේ පළාත් පාලන ඇමතිතුමා එය අනුමත කර එවිය යුතු බවයි. අනෙක් විශ්‍රාමිකයන්ට අවුරුදු දහයක් දොළහක් ගත වීමෙන් පසු දෙන සම්පූර්ණ විශ්‍රාම වැටුප පළාත් පාලන සේවයේ යෙදී සිට විශ්‍රාම ගිය අයටත් දීම සම්බන්ධයෙන් ඉක්මණින් ක්‍රියා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඉතාමත් අඩු වේතනයක් ලබමින් සිටින අය විශ්‍රාම ගිය විට ඔවුන්ට ලැබෙන්නේ රුපියල් දහයක් නැත්නම් විස්සක් වැනි සුළු මුදලක්. දැන් රුපියලේ වටිනාකමත් අඩු කර තිබෙනවා. ජීවන වියදම වැඩි වීම නිසා නොයෙක් නොයෙක් දීමනා අනෙක් අයට දුන්නත් මේ අයට එවැනි කිසිවක් දෙන්නෙත් නැහැ. ඒ නිසා රුපියල අව ප්‍රමාණ කිරීමේ අවාසිය පියවීම සඳහාවත් දීමනාවක් දී ඒ අයගේ වැටුප් වැඩි කරන ලෙස මා ඉල්ලා සිටිනවා. සියලු දෙනාටම විශ්‍රාම වැටුපක් අවශ්‍යය යන ප්‍රතිපත්තිය උඩ තමයි අප අර්ථසාධක අරමුදල ඇති කළේ. බෙන්තර-ඇල්පිටියෙ ගරු මන්ත්‍රීතුමා (කාරියවසම් මයා.) කිව්වා වාගේ එයින් මහඟු සේවයක් අත් වී තිබෙනවා. මේ රටේ ස්ව ශක්තියෙන් රක්ෂාවක් කරමින් ජීවත් වන අයටත් එවැනි ක්‍රමයක් සකස් කළයුතු බව අපේ හැඟීමයි. රක්ෂණ සංස්ථාවෙන් ඒ පිළිබඳව යම්කිසි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් ඒ වැඩ පිළිවෙළත් දැන් සම්පූර්ණයෙන්ම වැඩක් නැති තත්ත්වයකට පත් වී තිබෙනවා. ඒ ගැනත් මා ඉදිරිපත් කළ අනෙක් කරුණු දෙක තුන ගැනත් වැඩ බලන ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය යොමු වේවි යයි මා බලාපොරොත්තු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන** (අම්බලන්ගොඩ)
*(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன —அம்பலாங்கொடை)*
(Dr. M. H. Saddhasena—Ambalangoda)

Mr. Deputy Speaker, I shall not take much of your time, only two or three minutes just to emphasize the necessity of retiring all government servants on reaching the age of 55 years. The problem of unemployment is acute: there is unemployment even among graduates and doctors. Therefore, all government employees, on reaching the age of 55 years, should be compulsorily retired.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

What about Members of Parliament ?

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
(Dr. Saddhasena)

Members of Parliament should be retired at 65 ; otherwise, you and I will be too old to fight here ! They should be retired or prevented from contesting seats after they have reached the age of 65 years.

There are even medical specialists, surgeons, physicians, and other highly qualified people without a chance of getting into employment. Therefore, in all the higher ranks, those who are advanced in years, those who are past 55 years, should be retired. They can very well set up in private practice. They should make room for younger people who are waiting for specialists' jobs.

With regard to peasants and cultivators too, there should be inaugurated a provident fund scheme as in the case of workers. In this connection, I would like to bring to the notice of the Hon. Acting Minister that there is an inordinate delay in the payment of E. P. F. monies. The same position obtains even in regard to repatriates to India. They have to waste their time here waiting for their E. P. F. contributions. I would appeal to the Hon. Acting Minister to please look into these matters.

With regard to the operation of the compulsory retirement rule, there may be certain instances where, for instance, a highly qualified technician cannot be retired immediately on reaching the age of 55 years till another is trained—the necessary training courses are provided under our new education system—to take his place. There may be a few people like that who may have to be kept in service even after they have reached the age of 55 years. But the principle should be that everyone must retire on reaching the age of 55 years. After all, to get into a job a young man has to spend about 20 to 25 years of his life. The average life of a man today is 65 years. He works for 30 to 35 years ; we should let him have 10 years' rest. I appeal to the Hon. Acting Minister of Finance to look into these matters that I have raised.

අ. භා. 7.33

**ඩබ්ලිව්. ඒ. ධර්මදාස මයා.** (පැල්මඩුල්ල)
*(திரு. டபிள்யு. ஏ. தர்மதாச—பெல்மதுல்ல)*
(Mr. W. A. Dharmadasa—Pelmadulla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්‍රාම වැටුප් පිළිබඳව පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී බලයට පැමිණ සිටින ආණ්ඩු පක්ෂයේ උදවිය අවුරුදු හතරහමාරකට පෙර ජනතාවට දුන් මැතිවරණ පොරොන්දුවක් ගැන මතක් කරන්නට සතුටුයි :

"සමාජ සේවා රජයකට පදනම දැම්මේ එක්සත් ජාතික පක්ෂයයි. සමාජ සේවා දෙපාර්තමේන්තුවක් ඇති කොට අබල දුබලයින්ගේ යහපතට අපි මං පෑදුවෙමු. එක්සත් ජාතික පක්ෂය යළිත් බලයට පත් කළහොත් සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් හා විශ්‍රාම වැටුප් ක්‍රමයක්—පෙන්ෂන් පඩි ක්‍රමයක්— අපි ආරම්භ කරමු."

එක්සත් ජාතික පක්ෂය බලයට පත් වී දැනට අවුරුදු හතරහමාරක් ගත වී තිබෙනවා. තව තිබෙන්නේ හය මාසයයි. මේ දුන් පොරොන්දුව ඉෂ්ට කරන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කවදාද යන ප්‍රශ්නය මා ඉදිරිපත් කරනවා. ඒ කොයි හැටි වෙතත්, දුන් පොරොන්දු කොයි විධියට ඉෂ්ට නොකර තිබුණත් මා මේ අවස්ථාවේදී විශේෂ ඉල්ලීමක් කරනවා. මා ඒ ඉල්ලීම කරන්නේ අනාථාධාර ලබන්නන් සම්බන්ධවයි. බොහෝ දෙනෙකුගේ අනාථාධාර කපා හැර තිබෙනවා. ලෝක බැංකුවේ උපදෙස් පිට මේ ආණ්ඩුව පිං පඩි—අබල දුබලයින්ට ගෙවන ආධාර දීමනා—කපා හැර තිබෙනවා. මේ රටේ සියළු දෙනාටම විශ්‍රාම වැටුප් දෙන එක කොයි හැටි වෙතත් පසුගිය රජයෙන් දී ගෙන ආ පිළිවෙළටම අබල දුබලයින්ට ආධාර දෙන මෙන් මා ඉල්ලීමක් කරනවා. ඒ මුදල අඩු කරන්නට එපා. පසුගිය රජයෙන් ගෙවා ගෙන ආ පිළිවෙළටම රුපියල් පහළොව විස්ස බැගින් අඩුවක් නොකර දිගටම ඒ ආධාර මුදල් ගෙවන මෙන් මා ඉල්ලීමක් කරනවා. යම් යම් උදවියගේ අනාථාධාර මුදල සම්බන්ධයෙන් දිසාපතිවරයාට කරුණු ඉදිරිපත් කරන්නට සිද්ධ වූ අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් වෙන් කර තිබෙන මුදල බොහොම අඩුය. එම නිසා ගෙවන්නට බැරි තත්ත්වයක් තිබෙනවාය කියා අපට දැනගන්නට ලැබී තිබෙනවා. ඒ ගැන වගකිය යුත්තන්ගේ අවධානය යොමු කරවන අතර අබල දුබලයින්ට ගෙවන දීමනාවල අඩුවක් නොකරන ලෙසත් කලින් දීගෙන ආ පිළිවෙළටම ඒ මුදල් ගෙවන ලෙසත් මා යළිත් ඉතා කරුණාවෙන් ඉල්ලීමක් කරනවා.

ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රමාදවීම ගැනත් වචන ස්වල්පයක් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. ගුරුවරුන් ඉතා දුකසේ වැටුපෙන් ජීවත් වන පිරිසක්. විශ්‍රාම ගත් වහාම ඒ අයට විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමයක් අද පාලන යන්ත්‍රයේ නැහැ. අවුරුදු තිහක් හතළිහක් සේවය කර විශ්‍රාම ලබන ගුරුවරුන්ට විශ්‍රාම ලබනවාත් සමගම විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමයක් වහාම ආරම්භ කළයුතුව තිබෙනවා. එය එතරම් අමාරු වැඩක් නොවෙයි. නමුත් අද අවුරුදු හතේ අටේ විශ්‍රාම වැටුප් ප්‍රමාදවීම් ඇති වෙනවා. විශ්‍රාම ලබනවාත් සමගම විශ්‍රාම වැටුප් නොලැබුණොත් ඒ අයට දරු පවුලත් සමග ජීවත්වීම අමාරුයි. එමනිසා මේ ගැන



වගකිවයුත්තන්ගේ අවධානය යොමු විය යුතුව තිබෙනවා. යම් ගුරුවරයකුගේ විශ්‍රාම වැටුප විශ්‍රාම ලබනවාත් සමගම ගෙවන්නට බැරි නම් එය හරිගස්සන තුරු ඔහු විශ්‍රාම යැවීම තව ටිකක් ප්‍රමාද කරන්නට පුළුවනි. ඒ අන්දමට වැඩ පිළිවෙළක් යොදන ලෙස වැඩ බලන ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අපේ ආසනය තුළ වෙසෙන ජී. ඩී. ප්‍රේමලතා නමැති විශ්‍රාම ලත් ගුරුවරියක ගැන සඳහන් කරන්නට ඕනෑ. ඇය අවුරුදු 33 මාස 4 ක් සේවය කර තිබෙන උප ගුරුවරියක්. ඇය තමන්ගේ විශ්‍රාම වැටුප පිළිබඳව නොයෙකුත් තැන්වලට ලියුම් ගණනාවක්ම එවා තිබෙනවා. එහෙත් ඇගේ ඉල්ලීම තවම ඉටු වී තිබෙන බවක් පෙනෙනන්නට නැහැ. ඇගේ ඉල්ලීම ඉදිරිපත් කරන්නට වෙලා අවුරුදු 4 ක් ගත වී තිබෙනවා. එම නිසා ඇයට ඉකමණින් විශ්‍රාම වැටුප ලබා දීමට කටයුතු යොදන ලෙස මා ඉල්ලා සිටිනවා.

අ. භා. 7.38

**රාජා වෙලේගම මයා.**

*(திரு. ராஜா வெலேகம)*

(Mr. Raja Welegama)

විශ්‍රාම වැටුප් පිළිබඳව සාකච්ඡා කරන මෙම අවස්ථාවේහිදී ඉතා වැදගත් කරුණු කිපයක් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. රජයේ සේවකයන්ට විශ්‍රාම වැටුප් ලබා ගැනීමේදී සිදුවන ප්‍රමාදය ගැනයි පළමුවෙන්ම සඳහන් කළ යුත්තේ. මන්ත්‍රීවරුන් වශයෙන් අපට නොයෙකුත් අවස්ථාවලදී සිදු වී තිබෙනවා නොයෙකුත් දෙපාර්තමේන්තු යටතේ සේවය කොට විශ්‍රාම ගිය උදවියට මුහුණ පාන්නට සිදු වී තිබෙන මෙම ප්‍රශ්නය ගැන කතා බහ කරන්නට. විශේෂයෙන් සුළු ශ්‍රේණිවල සේවයෙහි යෙදී සිටින උදවියට විශ්‍රාම වැටුප් ලබා ගන්නට ගිය විට අවුරුදු හතර පහ බලාගෙන සිටින්නට සිදු වන බව අප දන්නවා. උසස් ශ්‍රේණිවල සේවය කරන උදවියට මෙම තත්ත්වයට මුහුණ පාන්නට සිදු වන්නේ නැහැ. එවැනි උදවිය මාස හයකින් හෝ අවුරුද්දකින්වත් තමන්ගේ විශ්‍රාම වැටුප් ලබා ගැනීමට කෙසේ හෝ කටයුතු යොදා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

ගන්නවා. එහෙත් තැපැල් දෙපාර්තමේන්තුව වැනි ස්ථානවල කම්කරුවන් වැනි සුළු සේවාවන්හි නියුක්තව සිටින උදවියට විශ්‍රාම වැටුප් ලබා ගැනීමේදී මුහුණ දෙන්නට සිදු වී තිබෙන දුෂ්කරතාවන් බොහොමයි. ඒ නිසා යම් යම් අවස්ථාවලදී එවැනි සිද්ධීන් ගැන මෙම ගරු සභාවේදී පවා ප්‍රශ්න කරන්නට අපට සිදු වී තිබෙනවා.

විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ ප්‍රමාදයට තුඩුදුන් හේතු කීපයක් තිබෙනවා. යම් කිසි දෙපාර්තමේන්තුවක සේවය කරන කෙනෙක් විශ්‍රාම ලැබුවායින් පසුව තමයි ඔහුට විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳව කල්පනා කර බලන්නේ. විශ්‍රාම වැටුප් ලබන්නට සිටින උදවිය කවුද යන වග දෙපාර්තමේන්තුව දන්නවා. ඒ ඒ පුද්ගලයාගේ ලිපිගොනු අනුව සොයා ගන්නට පුළුවනි ඒ ඒ පුද්ගලයා විශ්‍රාම යන්නේ කුමන අවස්ථාවකදීද යන්න. අපි සිතමු මේ අවුරුද්ද අවසානයේදී යම් කිසි සේවකයෙක් විශ්‍රාම යනවාය කියා. එසේ නම් ඔහුගේ තත්ත්වය පිළිබඳව ඔහු සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් කල්තියා කල්පනා කර තිබෙන්නට ඕනෑ. එමනිසා ඔහු විශ්‍රාම යන දිනයට මාස හයක්වත් කල් සිට ඔහුගේ විශ්‍රාම වැටුප් ලබා දීම පිණිස කටයුතු සූදානම් කරන්නට ඒ උදවිය වග බලා ගන්නවා නම් මෙම තදබදය මග හැරෙන්නට පුළුවන්කම තිබෙනවා. එවැනි සැළැස්මක් දැනට ක්‍රියාවේ යෙදෙන්නේ නැහැ. එම නිසා එවැන්නෙක් විශ්‍රාම ගියාද කියන කාරණය ගැන ප්‍රධාන කාර්යාලයට දැනගන්නට ලැබෙන්නේත් නැහැ, කලක් යන තුරු. මෙවැනි උදවිය විශ්‍රාම ගොස් මාස ගණනක් තිස්සේ ලියුම් ලිව්වාට පසු තමයි ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ මූලික කටයුතු පවා ආරම්භ කරන්නට සිදු වන්නේ. එම නිසා විශ්‍රාම වැටුප් සහිත සේවාවන්හි නියුක්ත වූවන් විශ්‍රාම ලබන්නට ආසන්න වන විට ඔවුන්ගේ ලිපි ගොණු පරීක්ෂාකර බලා අවශ්‍ය වාර්තා යනාදිය සකස් කරගෙන ඒවා ගැන ඉක්මණින් ක්‍රියා කරන්නට හැකිවන පරිදි කටයුතු සකස්කර තබන හැටියට මා ඉල්ලා සිටිනවා. යම් කෙනෙකු විශ්‍රාම යන්නට අඩු වශයෙන් මාස හයකටවත් කලින් එවැනි තැනැත්තකු සඳහා ඉදිරිපත් කළයුතුව ඇති විස්තර සැපයීමෙන් මෙම ප්‍රමාදවීම් මගහරවන්නට කටයුතු යොදන හැටියට මා යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරනවා.

විශ්‍රාම වැටුප් ගෙවීමේදී සිදු වන ප්‍රමාදය වැළැක්වීම පිණිස මට තවත් යෝජනාවක් ඉදිරිපත් කරන්නට පුළුවනි. අද විශ්‍රාම වැටුප් ගෙවීමේදී අනුගමනය කරන එක්තරා ක්‍රියා පිළිවෙළක් තිබෙනවා. ලංකාවේ කුමන දෙපාර්තමේන්තුවක් යටතේ කුමන ස්ථානයක සේවයෙහි යෙදී සිටින්නකු සම්බන්ධයෙන් වුවත් විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිබඳ නිර්දේශයන් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරය විසිනුයි. නොයෙකුත් දෙපාර්තමේන්තුවල නියුක්ත නොයෙකුත් තරාතිරම්වල ලක්ෂ ගණනක් රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳව අන්තිම අනුමැතිය ලැබෙන්නේ භාණ්ඩාගාරයෙන් තමයි. විශ්‍රාම වැටුප් ගෙවීමේ ප්‍රමාදයට තුඩුදෙන එක් හේතුවක් වශයෙන් මෙම කාරණයත් සඳහන් කරන්නට පුළුවනි. එම නිසා උත්සාහ ගත්තොත් එම ප්‍රමාදය නවත්වන්නට අපට තවත් ක්‍රමයක් උපයෝගි කර ගත හැකියි. හැම සේවකයකුගේම විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු භාණ්ඩාගාරය මගින් කිරීම අත්හැර දැමිය යුතුයි. එම කටයුතු විමධ්‍යගත කළ යුතුයි. එසේ කොට ඒ ඒ පළාත්වල පිහිටි කච්චේරි මගින් හෝ දෙපාර්තමේන්තු මගින් හෝ ප්‍රාදේශීය ප්‍රධානීන්ගේ කාර්යාල මගින් හෝ ඒ වෙනුවෙන් කටයුතු කිරීමට වැඩ පිළිවෙළ යෙදිය යුතුයි. ඒ සඳහා අවශ්‍ය කරන මුදල් එම ස්ථානවල ප්‍රධානීන්ට දිය යුතුයි. එසේ කළවිට හැම සේවකයකුගේම විශ්‍රාම වැටුප් පිළිබඳ කටයුතු කොළඹ පිහිටි භාණ්ඩාගාරයට ඇවිත් අවුරුදු ගණනාවක් පල් වෙවී තිබෙන තත්ත්වයක් උදා වන්නේ නැහැ. එසේ කළ විට භාණ්ඩාගාරයෙන් කෙරෙනවාට වඩා ඉක්මණින් එම කටයුතු කෙරෙනවා ඇති. මා එම කාරණයත් යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරනවා. සමහරවිට එසේ කිරීමට අමාරුකම් තියෙන්නට පුළුවන්. නමුත් ආණ්ඩුවට යම්කිසි කරදරයක් ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වුණත් එවැනි යම්කිසි වැඩපිළිවෙළක් සකස් කරනවා නම් විශ්‍රාම වැටුප් ලැබිය යුතු සේවකයන්ට එයින් ලොකු සහන යක් සැලසෙනවා.

අ. භා. 7.43

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැය ශීර්ෂය යටතේ වැදගත් කරුණු කිප යක් තමුන්නාන්සේගේ සැලකිල්ලට යොමු කරවන්නට මා බලාපොරොත්තු වෙනවා. මේ අතිරේක වැය ශීර්ෂය ඉදිරි පත් කර තිබෙන්නේ පසුගිය කාලයේදී විශ්‍රාමිකයන්ට දෙන ලද වැඩිපුර ජීවනා ධාර මුදල් සහ විශේෂ ජීවනාධාර මුදල් පියවා ගැනීමටයි. ගරු මුදල් ඇමතිතුමා අය වැය කථාව කරන අවස්ථාවේදී රජ යේ සේවකයන්ගේ වැටුප් වැඩි කරන බවට පොරොන්දුවක් දුන්නා. ඒ පොරොන්දුව දෙන අවස්ථාවේදී විපක්ෂය ඇසුවා, විශ්‍රාම වැටුප් ලබන අයගේ ඒ විශ්‍රාම වැටුපත් වැඩි කිරීමට බලාපො රොත්තු වෙනවාද කියා. ඒ ගැන ක්‍රියා කරනවාය කියා ගරු මුදල් ඇමතිතුමා පොරොන්දු දුන්නා. ඒ නිසා විශ්‍රාම වැටුප් වැඩි කරනවාද, එසේ කරනවා නම් කරන්නේ කවදා සිටද කියා අදවත් වැඩ බලන ගරු මුදල් ඇමතිතුමා ස්ථිර ප්‍රකාශයක් කරනවාදැයි මා දැනගන්නට සතුටුයි.

රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කරන සෑම අවස්ථාවකදීම විශ්‍රාමිකයන්ට සැලකුවේ බොහොම අඩුවෙනුයි. රජයේ සේවකයන්ට රුපියල් 30 ක් වැඩි කරන විට ඔවුන්ට වැඩි කළේ රුපියල් 5 යි; රජයේ සේවකයන්ට රුපියල් 100 ක් වැඩි කරන විට ඔවුන්ට වැඩි කළේ රුපි යල් 15 යි. ඒ නිසා කාලයක් තිස්සේ විශ්‍රාමිකයන් ලැබූ විශ්‍රාම වැටුප්වල වැඩි වීමක් සිදු වුණා නම් සිදු වුණේ ඉතා සුළු වශයෙන්. ඒ නිසා විශ්‍රාම වැටුප් ලබන උදවිය ගැන විශේෂ සැලකිල්ලක් දැක්වීම රජයේ යුතුකමක්. රජයේ සේවක යන් සම්බන්ධයෙන් කරන ලද වැටුප් වැඩි කිරීම ඒ අයුරින්ම විශ්‍රාමිකයන් සම්බන්ධයෙනුත් කළ යුතු බවයි, මගේ හැඟීම. විශ්‍රාමිකයන්ට අඩුවෙන් සැලකීම —කුඩම්මාගේ සැලකිල්ල දැක්වීම—සුදුසු නැහැ.

විශ්‍රාම වැටුප් ලබන්නන්ට හෝ වේවා, දැනට සේවයේ යෙදී සිටින රජයේ සේවකයන්ට හෝ වේවා, පොරොන්දුවක් දුන්නා නම් ඒ පොරොන්දුව ඉෂ්ට කරන් නට ඕනෑ. පඩි කොමිෂන් සභාවේ වාර්තාව කවදා ලැබුනත් මැයි 1 වැනිදා සිට වැටුප් වැඩි කරනවා ය කියා ගරු අගමැතිතුමා ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශය ගුවන් විදුලි යෙනුත් ප්‍රචාරය කළා. මට මතක හැටියට 1968 මැයි දින රැළියෙදියි, එහෙම කිව්වේ. නමුත් දැන් ඒ වැටුප් වැඩිවීම ක්‍රියාත් මක කරන්නේ ඒ පිළිවෙළට 1968 මැයි මස 1 වැනිදා සිටද? අගමැතිතුමා හෝ වෙනත් ඇමතිවරුන් හෝ වගකිවයුතු අය හැටියට යම්කිසි ප්‍රකාශයක් කරනවා නම් ඒ ප්‍රකාශ ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ප්‍රකාශ ක්‍රියාත්මක නොකරනවා නම් ඒවා කරන්නට වුවමනා නැහැ.

ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය ගැනත් මා මතක් කරන්නට ඕනෑ. රට කට විශ්‍රාම වැටුප් ක්‍රම දෙකක් අවශ්‍ය නැහැ. රජයේ සියළුම සේවකයන්ට එකම විශ්‍රාම වැටුප් ක්‍රමයක් තියෙන්නට ඕනෑ. දැන් ගුරුවරුන් එක විශ්‍රාම වැටුප් ක්‍රම යක් යටතේත්, රජයේ අනිකුත් සේවක යන් වෙනත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් යට තේත් පාලනය වෙනවා. මේ ක්‍රම දෙකම එක ක්‍රමයක් කරන්න කියා මේ රටේ ගුරුවරුන් විශාල උද්ඝෝෂණයක් කර තිබෙනවා. අද ගුරුවරුන්ට විශ්‍රාම වැටුප් ලැබෙන්නේ වෙනස් විධියකටයි. ඔවුන්ට ගුරු විශ්‍රාම වැටුප් පනත යටතේ එකවර දීමනාවක් ලැබෙන්නේ නැහැ. එහෙත් ගුරුවරුන්ගෙන් එක කොටසකට එනම් 1938 ට කලින් සේවයට බැඳුනු අයට නම් ඒ අයිතිය තිබෙනවා. ඔවුන්ට රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් අයිතිය තිබෙනවා. 1938 ට පසුව බැඳුණු අයට ඒ අයිතිය නැහැ. ගුරුවරුන්ම දෙකොටස කට බෙදලා ඇයි මේ වෙනස? එවැනි වෙනසක් කරන්නට තිබෙන වුවමනාව මොකක්ද? ඒ නිසා ගුරුවරුනුත් රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් පනත යට තට පත් කරන්නය කියා අපි ඉල්ලා සිටි නවා. ඔය ගුරු විශ්‍රාම වැටුප් පනත කියන එක අහෝසි කරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජෝර්ජ් කොතලාවල මයා.**
(திரு. ஜோர்ஜ் கொத்தலாவல)
(Mr. George Kotelawala)

තමුන්නාන්සේලාගේ කාලයේ ඒක තිබුණේ නැද්ද?

**ටී. බී. එම්. හේරත් මයා.**
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේ හිටියේ නැහැනේ. හිටියා නම් දැනගන්නට තිබුණා.

යම් යම් වෙනස්කම් කෙරුණේ නැත කියා අපි කියන්නේ නැහැ. පොඩි පොඩි වෙනස්කම් සිදු වුණා. එහෙත් මූලික ප්‍රශ්නය විසඳුණේ නැහැ. එම මූලික ප්‍රශ්නය තමුන්නාන්සේලා හෝ අපි හෝ කවුරු හෝ විසඳන්නට ඕනෑ. එය සාකච්ඡා කළ යුතු ස්ථානයත් අවස්ථාවත් මෙයයි. ඒ නිසා ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කර දමා අනික් රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමයටම ගුරුවරුනුත් ඇතුළත් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. එය ගරු මුදල් ඇමතිතුමාට ලේසියෙන්ම කරන්න පුළුවන්. 1957 විතර වන තුරු ගුරුවරුන්ට ඒ සඳහා තම වැටුපෙන් යම් කිසි මුදලක් ගෙවන්න සිද්ධ වුණා. රජයේ අනිකුත් සේවකයන් කාගෙන්වත් ශතයක් වත් කපා ගන්නේ නැහැ. මට මතක හැටියට, ගුරුවරුන්ගේ වැටුපෙන් සියයට 4 ක තරම ප්‍රමාණයක් 1957 විතර වන තුරු කපා ගත්තා. 1958 දී පමණ ඒක අවලංගු කළා. දැනට ගුරුවරුන්ගෙන් විශ්‍රාම වැටුප් අරමුදල සඳහා සියයට 2 ක් කපා ගන්නවා. අනික් රජයේ සේවකයන්ගෙන් කියක්වත් කපා ගන්නෙ නැහැ. මේ වෙනස ඇති කරන්නට හේතුව කුමක්ද? විශ්‍රාම වැටුප් පනත යටතේ අවුරුදු 10 කින් විශ්‍රාම ගන්නට රජයේ සේවකයන්ට පුළුවන්කම තිබෙනවා. එහෙත් ගුරුවරුන්ට ඒ සහනය නැහැ. අවුරුදු 10 ක සේවයෙන් පසු ගුරුවරයෙකුට විශ්‍රාම යන්නට පුළුවන්කමක් නැහැ. රාජකාරිය කරන්නට තරම් සුදුසු සෞඛ්‍ය තත්ත්වයක මොහු නොසිටියි කියා වෛද්‍ය වරයෙකු කිව්වොත් පමණයි, ඔවුන්ට අවුරුදු 10 සේවයෙන් පසු විශ්‍රාම යන්නට පුළුවන්කම තිබෙන්නෙ. රජයේ සේවකයන් වයස 55 වන තුරු සේවය කරන්නට ඕනෑ. ගුරුවරයෙකු නම් මා හිතන්නේ අවුරුදු 51 ක් වන තුරු සේවය කරන්නට ඕනෑ. ඊට පසුව විතරයි විශ්‍රාම ගැනීමට ඉඩ දෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි ගුරුවරයා රජයේ ණය මුදලක ඇපකරුවකු වශයෙන් වත් පිළිගන්නේ නැහැ. රජයේ සේවකයෙකුට වැටුප් අත්තිකාරමක් ගන්නට වුවමනා වුණාම ඒ සඳහා තවත් රජයේ සේවකයෙකු ඇපයකට අත්සන් කරන්නට ඕනෑ. එහෙත් ගුරුවරුන්ට මේ නිදහස නැහැ. භාණ්ඩාගාරය කියනවා, ගුරුවරුන් රජයේ සේවකයන් නොවෙයි, ඒ නිසා ඔවුන්ට ඇපයකට අත්සන් කරන්නට බැහැ කියා. බයිසිකල්, කාර් ආදිය ගන්නට රජයේ සේවකයන්ට ණය දෙනවා. පුදුමය මේකයි. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්, පරීක්ෂක වරයාගේ සිට ඉහළට සිටින සියලුම නිලධාරීන්, රජයේ විශ්‍රාම වැටුප් පනත යටතෙයි ක්‍රියා කරන්නේ. ඒ වගේම 1938ට පෙර සේවයට බැඳුණු ගුරුවරුන් රජයේ විශ්‍රාම වැටුප් පනත යටතෙයි ක්‍රියා කරන්නේ. එක කොටසක් විතරක් වෙනම පැත්තකට දමා ඒ උදවිය රජයේ සේවකයන් නොවෙයි කියනවා.

ගරු මුදල් ඇමතිතුමනි, ඒගොල්ල රජයේ සේවකයන් නොවෙයි නම් ඇයි ඒ උදවිය අනිකුත් නීතිරීතිවලින් නිදහස් නොකරන්නේ? ඔවුන් දේශපාලන නිදහස ඉල්ලන විට කියනවා, උඹලා රජයේ සේවකයන් කියා. විශ්‍රාම වැටුප් ඉල්ලන විට කියනවා, උඹලා රජයේ සේවකයන් නොවෙයි කියා. මොකක්ද මේ දෙබිඩි ප්‍රතිපත්තිය? ගුරුවරුන්ගේ පැත්තෙන් කථා කරන විට නිතරම ඔහුගේ අවාසියටයි තීන්දුව දෙන්නේ. රජයේ පැත්තෙන් කථා කරනවිට නිතරම රජයේ වාසියටයි තීන්දුව දෙන්නේ. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. මේ වෙනස සිදු වී තිබෙන්නේ මේ විශ්‍රාම වැටුප් පනත් දෙකක් තිබීම නිසයි. හැම නොසැලකිල්ලක්ම ගුරුවරයාට ඇති වී තිබෙන්නේ මේ නිසයි. අපි කියා සිටින්නේ කෙලින්ම හැම ගුරුවරයාම රජයේ විශ්‍රාම වැටුප් පනත යටතට ගන්න කියායි. ඉන් පසු අනික් සේවකයන් පාලනය කරන ආකාරයටම ඔවුන් පාලනය කරන්න. ඒකට කමක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒගොල්ල රජයේ සියලුම නීතිරීතිවලට යටත්ව සිටින අතර විශ්‍රාම වැටුප්වලින් විතරක් ඔවුන්ට කුඩම්මාගේ සැලකිල්ල දක්වනවා. ගුරුවරුන් හැමදාම හැම රජයෙන්ම අහන්නෙ, "ගුරුවරුන් රජයේ සේවකයන්ද, නැද්ද ?" කියායි. ඒ ප්‍රශ්නයට කිසිම රජයකට උත්තර දෙන්නට බැහැ. කිසිම ආණ්ඩුවක් උත්තර දෙන්නෙ නැහැ. ඔවුන් රජයේ සේවකයන්ය කිව්වොත්, රජයේ සේවකයන්ගේ සියලුම අයිතිවාසිකම් ඔවුන්ට දෙන්ට සිද්ධ වෙනවා. ඔවුන් රජයේ සේවකයන් නොවෙයි කිව්වොත් ඔවුන්ට සාමාන්‍ය නිදහසක් ලැබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නයට උත්තර දෙන්නෙ නැහැ. ගුරුවරුන් රජයේ සේවකයන් නම්, ගරු මුදල් ඇමතිතුමනි, ඔවුන්ට අනිකුත් රජයේ සේවකයන් බුක්ති විඳින අයිතිවාසිකම් දෙන්නට ඕනෑ. ඔවුන් රජයේ සේවකයන් නොවෙයි නම් ඔය විශ්‍රාම වැටුප් ඔහොම තිබෙද්දී සාමාන්‍ය ජනතාවට තිබෙන නිදහස ඔවුන්ට දෙන්නට ඕනෑ. මේ කරුණු දෙකම යොදා තිබෙන්නේ ගුරුවරයාට විරුද්ධවයි. ඒ නිසා කරුණාකර ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත කියන එක සම්පූර්ණයෙන්ම අහෝසි කර දමන්න. එය ලෙහෙසියෙන් කරන්නට පුළුවනි. ගුරුවරුනුත් රජයේ විශ්‍රාම පනතට ඇතුළු කරන්න. එතකොට ඔය රෝග සනීප වෙනවා. මෙය කවුරු හෝ කවදා හෝ කළ යුතු දෙයක්. ඒ නිසා අසුවලා මෙය කෙළේ නැතැයි කියන්නට හොඳ නැහැ. එය ප්‍රශ්නයක් නොවෙයි. කළ යුතු වැඩක් නම් කවුරු හෝ කවදා හෝ කළ යුතුයි. ගුරුවරුන් විශාල පිරිසක් මේ සංඛ්‍යාවට ඇතුළත් වෙනවා. ඒ නිසා මෙය විශාල ප්‍රශ්නයක් හැටියට සලකා සතුටුදායක ලෙස විසඳන්නැයි හිටපු ගුරුවරයකු හැටියට මා ඉල්ලා සිටිනවා.

විශ්‍රාම වැටුප් ගැන තවත් කරුණක් දෙකක් සඳහන් කළ යුතුයි. ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙක් ඒ ගැන සඳහන් කළා. විශ්‍රාම වැටුප් ගෙවීමේදී විශාල ප්‍රමාදයක් තිබෙනවා. කලට වේලාවට විශ්‍රාම වැටුප් ලබා ගැනීම කෙතරම් දුෂ්කරද කියතොත් පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න අහන්නට ඕනෑ, කෙනෙකුට විශ්‍රාම වැටුපක් ලැබෙන්නට. එතකොටයි ඒක ඔහුට ලැබෙන්නේ. එහෙම නැත්නම් මාස ගණන් අවුරුදු ගණන් ඔහේ තියෙයි. විශ්‍රාම ලබා එළියට ගියාම අවුරුද්දක් ජීවත් වන්නේ කොහොමද මනුෂ්‍යයෙක් ? සමහර අයට ඇඩ්වාන්ස් එකක්වත් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ ප්‍රමාදය නැති කරන්නට වැඩ පිළිවෙළක් කල් තබා ඇති කරන්නට ඕනෑ. සේවකයකු විශ්‍රාම පිට යන්නේ කවදාදැයි දෙපාර්තමේන්තුව දන්නවා. ඒ නිසා විශ්‍රාම ගැනීමට අවුරුදු දෙකකට පමණ කලින් සේවා ලිපිගොනු සකස් කරන්නට පටන් ගන්න පුළුවනි. ටිකක් කලින් මේ කටයුත්ත පටන් ගත්තොත් සේවකයා සේවයෙන් විශ්‍රාම ගෙන එළියට යනවාත් සමගම ඔහුගේ විශ්‍රාම වැටුපත් ලබා ගන්නට පුළුවන් වේවි. එය එසේම විය යුතුයි. එහෙත් බොහෝ තැන්වල මේ කටයුත්ත පටන් ගන්නේ සේවකයා ගියාට පසුවයි. සේවකයා විශ්‍රාම ලබා යෑමට කලින් ලිපිගොනු සකස් කිරීම ආරම්භ කරන්න. සමහර විට අවුරුදු දෙකකුත් මදිනම් අවුරුදු පහකට පෙර ඒ කාර්යය පටන් ගන්න.

විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් දැන් පවතින විෂමතාවන් නැති කරන්නට කටයුතු කළ යුතුයි. රජයේ සේවකයන්ට ලැබෙන සාමාන්‍ය විශ්‍රාම වැටුප් ක්‍රමයම ගුරුවරුන්ටත් දිය යුතුයයි මම නැවතත් කියනවා. රජයේ සේවකයන්ට වැටුප් වැඩි කර දෙන්නට ගරු අගමැතිතුමා පොරොන්දුවක් දුන්නා. දැන් රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කළාය කියනවා. එහෙත් එය ගෙවීම මේ අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ පළමුවැනිදා සිට සිද්ධ වෙනවා දැයි මා දන්නේ නැහැ.

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)

වෙනවා, වෙනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු අගමැතිතුමා මුලදී කියාපු හැටියට 1968 මැයි මාසේ පළමුවැනිදා සිට නොවෙයිද පඩි වැඩිවීම් ක්‍රියාත්මක කරන්නට යන්නේ ? වශ්‍රාම වැටුප් ලබන්නන්ගේ තත්ත්වය මේ සම්බන්ධයෙන් කුමක්දැයි දැනගන්නට අපි කැමතියි. ඒ උදවියටත් මේ අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ පළමු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. බී. එම්. හේරත් මයා.]

වැනිදා සිට වැඩිපුර විශ්‍රාම වැටුප් ලබා ගැනීමට වැඩ පිළිවෙලක් සලසා දෙන්නැයි මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 7.58

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)

ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් ගැන ස්තුතිවන්ත වන අතරම ඒවා කෙරෙහි අවධානය යොමු වන බවද කියන්නට කැමතියි. විශ්‍රාම වැටුප් ගෙවීමේදී ඇති වන ප්‍රමාදය ගැන ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක්ම සඳහන් කළා. ඒ කියමන්වල ඇත්තක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කියන්නට තිබෙන්නේ දැන් තත්ත්වය මීට අවුරුදු තුන හතරකට නැත්නම් පහකට පමණ පෙර තිබුණු තත්ත්වයට වඩා හුඟක් ම සතුටුදායක බවයි. ඒ කාලයේ විශාල සංඛ්‍යාවක් තමන්ගේ විශ්‍රාම වැටුප් ලැබෙන තුරු කාලයක් තිස්සේ බලාගෙන සිටියා. ලිපි ලේඛන ආදිය පරීක්ෂා කර බලන්නට ඒ කාලයේ බොහොම කල් ගත වුණා. ඒ කාලයේ නිතරම වාගේ තුන් දාහකට අධික පිරිසක් විශ්‍රාම වැටුප් ගෙවනතුරු බලා සිටියා. ඒ තත්ත්වය දැන් නැහැ. දැන් තමන්ගේ විශ්‍රාම වැටුප් කඩදාසි සකස් කර නිම වන තුරු බලා ගෙන සිටින පිරිස හත්සියයකට වඩා නැහැ. එදා තිබුණු තුන්දාහ දැන් හත්සියයකට පමණ බැහැලා තිබීම ඇත්තෙන්ම සතුටුදායකයි. එහෙත් ඒ ගැනත් මා සතුටට පත් වී නැහැ. මේ සංඛ්‍යාව තවත් අඩු කරන්නට තමයි අපේ බලාපොරොත්තුව.

ප්‍රමාදයට හේතු රාශියක් තිබෙනවා. ඒ චෝදනාව අපි සම්පූර්ණයෙන් බාර ගන්නට බලාපොරොත්තුවක් නැහැ. එයට හේතුව මෙයයි: සේවකයින්ගේ සේවා වාර්තා නිසි පිළිවෙළට සකස් කර නැති නිසයි ප්‍රමාදය සිදු වන්නේ. ඒ ඒ දෙපාර්තමේන්තුවල කටයුතු නිසි ආකාරයට කෙරෙන්නේ නැති නිසා, ඒ කියන්නේ අවුරුදු පතා ඒ ඒ සේවකයාගේ සේවා වාර්තා ඒ ඒ දෙපාර්තමේන්තු මගින් නිසි පිළිවෙළට පුරවා සකස් නොකිරීම නිසයි ප්‍රමාදය ඇති වී තිබෙන්නේ. සමහර සේවකයින්ගේ සේවා වාර්තා අවුරුදු දෙක තුනක් නිසි පිළිවෙළට සකස් කර ඊළඟට අවුරුදු පහක් හයක් කිසිම සඳහනක් නොකර ඇති බව හෙළිවන ලිපි ගොනු රාශියක් තිබෙනවා. එවැනි සිද්ධීන් ඇති වූ විට විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රමාද වන එක ගැන කිව යුතු නැහැ. මේ තත්ත්වයන් වෙනස් කිරීමට දැන් කටයුතු කර ගෙන යනවා. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකට සෑම දෙපාර්තමේන්තුවකටම ගොස් ඒ ඒ දෙපාර්තමේන්තුවල වාර්තාවල තත්ත්වය ගැන විමසන්නට කියා තිබෙනවා. ඒ අනුව ඒ තත්ත්වය දැන් සතුටුදායක පිළිවෙලකට ගෙන එමින් තිබෙන බව තමුන්නාන්සේලාට කියන්නට කැමතියි.

තවත් කරුණක් ගැන පරීක්ෂා කර ගෙන ගියා. එනම් සෑම සේවකයෙක් සඳහාම අතිරේක ලිපිගොනු භාණ්ඩාගාරයේ ඇති කිරීමයි. එය විශාල මුදලක් වියදම් වන කරුණක් නිසා ඒ ගැන ස්ථිර පියවරක් ගන්නට තවම බැරි වුණා. ඒ පියවර ගත්තොත් නම් භාණ්ඩාගාරය මගින් ඒ සේවා වාර්තා නිසි පිළිවෙලට සම්පූර්ණ කර තබා ගන්නට පුළුවන්. එහෙත් ඒ සඳහා ලොකු මුදලක් වැය වන නිසා මා කලින් කී පරිදි ඒ ගැන ස්ථිර පියවරක් තවම ගන්නට නොහැකි වී තිබෙනවා. තත්ත්වය සතුටුදායක පිළිවෙලකට ගෙන එමින් තිබෙනවා යයි මා කලින් සඳහන් කළේ සෑම අවුරුද්දක් පාසාම නිසි පිළිවෙලට සේවා වාර්තා සකස් නොකරන දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට විනයානුකූලව දඬුවම් දෙන්නට අපි කටයුතු කරගෙන යන නිසයි. එසේ දඬුවම් දීමට කටයුතු පිළියෙල කර තිබෙනවා. එමෙන්ම තමන්ගේ සේවා වාර්තා නිසි පිළිවෙලට සකස් කර තිබෙනවාද කියා බලන්නට ඕනෑම සේවකයෙකුට දැන් අවස්ථාව සලසා තිබෙනවා. අපි අර ගෙන තිබෙන මේ පියවරවල් නිසා විශ්‍රාම වැටුප් ප්‍රමාද වීමේ තත්ත්වය නොබෝ කලකින්ම හැකිතාක් දුරට අඩු කිරීමට පුළුවන් වේය කියා බලාපොරොත්තු වෙනවා.

ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධවත් කිය යුතුයි. ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් නීති මාලාව වෙනස්. අනිකුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් නීති මාලාව යටතේ නොවෙයි ගුරුවරුන්ට විශ්‍රාම වැටුප් ගෙවන්නේ. සාමාන්‍ය රජයේ සේවකයින්ට එකකුත් ගුරුවරුන්ට වෙන එකකුත් වශයෙන් නීති මාලා දෙකක් තිබෙනවා. ඒ නිසා සෑම සේවකයෙකුටම පොදු විශ්‍රාම වැටුප් නීති මාලාවක් සකස් කිරීමේ කාර්යය කෙරෙහි රජයේ අවධානය යොමු වී තිබෙනවා. ඒ කාරණය තමුන්නාන්සේලාට මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. එමෙන්ම වැඩි කලක් යන්නට කලින් මේ වෙනස නැති කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

සමහර අයට ගෙවන විශ්‍රාම වැටුප ප්‍රමාණවත් නැත කියා කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) කිව්වා. එය පිළිගත යුතුයි. සමහර විශ්‍රාමිකයන්ගේ, ඒ කියන්නේ සමහර ශ්‍රේණිවල විශ්‍රාමිකයින්ගේ, වැටුප ප්‍රමාණවත් නොවන බව අපටත් පිළිගන්නට පුළුවන්. මේ ප්‍රශ්නය ගැන පරීක්ෂා කර බැලීම සඳහා වැටුප් කොමිසමට බලය තිබෙන බව ගරු මන්ත්‍රීවරුන්ට කියන්නට කැමතියි. විශ්‍රාමිකයන් ඒ සම්බන්ධයෙන් වැටුප් කොමිසමට කරුණු ඉදිරිපත් කර තිබෙන බවද ගරු මන්ත්‍රීවරුන් දන්නවා ඇති. අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට වැටුප් කොමිසම ක්‍රියා කරනවාට කිසිම අනුමානයක් නැහැ. ඒ අවස්ථාවේදී ඒ අයට යම් සහනයක් දීමට පුළුවන් වෙනවා ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

අතුරු මැතිවරණ අවස්ථාවලදී අප එක් ප්‍රතිපත්තියක් ප්‍රකාශ කළ නමුත් තව මත් ඒ ගැන කිසිවක් කෙරී නැතැයි සමහර ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා. ඔව්; මහජන රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම සඳහා දැන් ක්‍රියා කරගෙන යන බව මා මතක් කරන්නට කැමතියි. ඊට අදාළ කෙටුම්පත් පනත නොබෝ කාලයකින් මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නට අප බලාපොරොත්තු වෙනවා. ඒ පනත අනුව සෑම කෙනෙකුටම විශ්‍රාම වැටුප් ලැබෙනවා. ඒ කෙටුම්පත් පනතේ කටයුතු දැන් හුඟක් දුරටම හමාර වී තිබෙන බව සතුටින් ප්‍රකාශ කරන්නට කැමතියි.

ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාගේ අවසාන කාලයේදී එතුමා දුක්ඛිත තත්ත්වයක පසු වූ බව බෙන්තර-ඇල්පිටියේ ගරු මන්ත්‍රීතුමා (කාරියවසම් මයා.) ප්‍රකාශ කළා. කෙසේ වුණත් මේ රජය එතුමාට සහනයක් දුන් බව මා කියන්නට කැමතියි. ඒ සහනයේ තත්ත්වය මෙබඳු යයි මේ අවස්ථාවේදී මා විස්තර කරන්නට යන්නේ නැහැ. කොපමණ ප්‍රමාණයකින් සහන සැලසුවා දැයි කීම මේ අවස්ථාවේ හැටියට සුදුසු නැහැ. කෙසේ වුණත් එතුමාගේ අවසාන කාලයේදී දුක්ඛිත තත්ත්වයකට මුහුණ නොපා ජීවිතය ගෙන යෑම සඳහා අප මාස් පතා විශ්‍රාම වැටුපක් දුන්නා.

ඉදිරිපත් කරන ලද අනෙක් කරුණු අපේ අවධානයට යොමු වන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් හමාර කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

## මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු
## சபை அலுவல்
## BUSINESS OF THE HOUSE

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Item No. 5.

**ද සොයිසා සිරිවර්ධන**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

Sir, there was an agreement to adjourn the House at 8 o'clock.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

There is a certain problem that arises.

**ද සොයිසා සිරිවර්ධන**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

It is not fair to do that.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

That is right, but there is a revolt in my ranks. There are only three items which we want passed now.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ද සොයිසා සිරිවර්ධන
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

No, Sir. We do not agree because we have informed hon. Members on this side of the House of the agreement to adjourn the House at 8 o'clock and most of them have already left the House.

ගරු ජේ. ආර්. ජයවර්ධන මයා.
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

I agreed because the hon. Member for Medawachchiya (Mr. Maithripala Senanayeke) and the hon. Member for Minuwangoda (Mr. de Zoysa Siriwardena) said that we can bring these items as Excess Votes. Earlier in the day they wanted us not to move a single one of these items and asked why we should not bring them as Excess Votes. It is possible to bring them as Excess Votes, but as the hon. Members are aware the General Elections are close at hand and we do not know how the Public Accounts Committee will be constituted. We can agree that the Public Accounts Committee will accede to our request and the next Parliament will pass these Excess Votes, but there is some fear among some of the hon. Ministers that there might be some difficulty in getting the money expended. Therefore, if we can at least pass those three items—[*Interruption*].

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

No, Sir. We are not prepared to take up these items now. Let the Government fix any date before the 30th of September.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Then shall we meet for two hours tomorrow morning ?

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

Tomorrow I cannot come.

මෛත්‍රීපාල සේනානායක මයා.
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

I myself cannot come in the morning. Let us meet at 2 P.M. tomorrow.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

We will meet at 10 A.M. They also prefer the morning.

මෛත්‍රීපාල සේනානායක මයා.
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

The way out is to take them as Excess Votes.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

We are prepared to meet on the 30th and dispose of these items.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

I think tomorrow is the best day. Some of the Ministers will not be available on the 30th because they are going on a circuit to Chilaw.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

All the Ministers are not going.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Three or four of them are going.

මෛත්‍රීපාල සේනානායක මයා.
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

To take them as Excess Votes is the only way out.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Some of the Ministers are concerned over these because they do not want to take a risk.

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම (2)

*சபை அமர்வு (2)*

SITTING OF THE HOUSE (2)

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I move,

"That this House at its rising this day do adjourn until 10 A.M. on Monday, 29th September 1969."

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

How can we inform our Members? We have already told them that the House would adjourn at 8 o'clock for good.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

You can give us a list and we will inform them.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## කල් තැබීම

*ஒத்திவைப்பு*

ADJOURNMENT

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I move,

"That the House do now adjourn."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.15 ට, අද දින සභා සම්මතිය අනුව, 1969 සැප්තැම්බර් මස 29 වන සඳුදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

அதன்படி பி. ப. 8.15க்கு சபை அதனது இன்றைய தீர்மானத்துக் கிணங்க 1969 செப்ரெம்பர் 29, திங்கட்கிழமை மு. ப. 10. மணிவரை ஒத்திவைக்கப்பெற்றது.

*Adjourned accordingly at 8.15 P.M. until 10 A.M. on Monday, 29th September 1969, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

## WRITTEN ANSWERS TO QUESTIONS

### දකුණු ඉන්දියාවේ කෝවිල්වලට පරිත්‍යාග කර ඇති යාපනේ ඉඩම්

### தென்னிந்தியக் கோயில்களுக்கு நன்கொடை வழங்கப்பட்ட யாழ்ப்பாணக் காணி

### LAND IN JAFFNA DONATED TO TEMPLES IN SOUTH INDIA

**203/69**

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.** (ගම්පහ)
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ)*
(Mr. S. D. Bandaranayake—Gampaha)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) යාපනයේ ඉඩම් වලින් කවර ප්‍රමාණයක් දකුණු ඉන්දියාවේ කෝවිල්වලට පරිත්‍යාග කරනු ලැබ තිබේද? (ආ) මෙම ඉඩම්වල ආදායම් දකුණු ඉන්දියාවට යැවීමට අවසර දී තිබේද? නො එසේ නම් මෙම ආදායම් වලට කුමක් සිදුවේද? (ඉ) එතුමා මෙම ඉඩම් රජයට අත්පත් කර ගෙන, උසස් යයි කියැවෙන කුලවලට අයත් පුද්ගල යින්ගේ බලහත්කාරකම් නිසා ඉඩම් ලබා ගැනීමට නොහැකිව සිටින පහත් යයි කියැවෙන පංක්තිවල ජනතාවට ඒවා බෙදා දෙන්නේද? (ඊ) නො එසේ නම් ඒ මන්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) யாழ்ப்பாணத்தில் எவ்வளவு காணிகள் தென்னிந்தியக் கோவில் களுக்கென நன்கொடையாக வழங்கப்பட்டுள்ளன? (ஆ) இக்காணிகளின் வருமானங்கள் தென்னிந்தியாவிற்கனுப்ப அனுமதிக்கப்படுகின்றனவா, இல்லையெனில் இவ்வருமானங்கள் என்னுகின்றன? (இ) இந்தக் காணிகளைப் பெற்று, உயர்சாதியினரெனப்படுபவர்களால் இன்று காணிகள் பெற்றுக் கொள்ள முடியாது பலாத்காரமாகத் தடுக்கப்படும் தாழ்ந்த வகுப்பினரெனக் கூறப்படுபவர்களுக்கு அவற்றை அவர் வழங்குவாரா? (ஈ) இல்லையெனில், எனில்லை?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) How much of land in Jaffna has been donated to temples in South India? (*b*) Are incomes from these lands permitted to be remitted to South India and if not, what happens to these incomes? (*c*) Will he acquire these lands and give them to the so-called depressed classes who are today forcibly prevented from acquiring land by the so-called high castes? (*d*) If not, why not?

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**
*(கௌரவ சி. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*
(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

(අ) දකුණු ඉන්දියාවේ කෝවිල්වලට යාපනයේ රජයේ ඉඩම් කිසිවක් පරිත්‍යාග කර නොමැත. පුද්ගලික ඉඩම් පරිපාලනය මගේ අමාත්‍යාංශයට පැවරී ඇති කටයුත්තක් නොවේ. (ආ) (ඉ) සහ (ඊ) පැන නොනගී.

*(அ) தென்னிந்தியாக்கோவில்களுக்கு யாழ்ப்பாணத்தில் முடிக்குரிய காணிகள் எதுவும் நன்கொடையாக வழங்கப்படவில்லை. தனியார் காணிகள் பரிபாலனம் எனது அமைச்சுக்கு உட்படுத்தப்பட்ட செயலில்லை. (ஆ) எழாது. (இ) எழாது. (ஈ) எழாது.*

(*a*) No Crown lands in Jaffna have been donated to temples in South India. Administration of private lands does not come within the purview of my Ministry. (*b*) to (*d*) Do not, arise.

### එච්. බී. හේරත් මහතා

### திரு. எம். பி. ஹேரத்

### MR. H. B. HERATH

**209/69**

**ඩී. බී. රණතුංග මයා.** (කොත්මලේ)
*(திரு. டீ. பி. ரணதுங்க—கொத்மலே)*
(Mr. D. B. Ranatunga—Kotmale)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අංක ජී. ජී. /6 /20/2 හා 69.4.12 වෙනි දින දරණ ලිපියෙන් කොත්මලේ මහජන මන්ත්‍රී වෙත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දන්වා ඇති පරිදි සි. යෝ. ක. ගො. ද.නි. ස.අ. සමිතියට විරුද්ධව එච්. බී. හේරත් මහතා විසින් කරන ලද පැමිණිල්ල ගැන තවම ක්‍රියා කර නොමැති බව එතුමා දන්නේද? (ආ) එසේ නම්, මේ ගැන ක්‍රියා කිරීම අත්හිටුවා ඇත්තේ කුමන හේතුවක් නිසාද? (ඉ) මෙම සේවකයාට නියමිත වැටුප් හා අනිකුත් දීමනා ලබා දීමට එතුමා කටයුතු කිරීමට අදහස් කරන්නේද? (ඊ) එසේ නම්, මේ මුදල් සේවකයාට ලබා දීමට තව කොතරම් කාලයක් ගතවේද?

*விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) கொத்மலை பாராளுமன்ற அங்கத்தவருக்கு விவசாய, உணவு அமைச்சின் செயலாளர் பீ/பீ/6/20/2 ஆம் இலக்கத்தின் கீழ் 12.4.69 ஆந் தேதியிட்டு அனுப்பிய கடிதத்தின் மூலம் தெரிவித்துள்ளபடி, வை. கே. ஏ. பீ. எஸ். சங்கத்திற்கெதிராக திரு. எச். பீ. ஹேரத் எழுப்பிய முறைபீடு சம்பந்தமாக நடவடிக்கை எடுக்கப்படவில்லை யென்பதை அவர் அறிவாரா? (ஆ) ஆமெனில், இது சம்பந்தமாக நடவடிக்கை எடுப்பது நிறுத்தப்பட்டிருப்பதேன்? (இ) இவ்வூழியருக்குச் சேர வேண்டிய சம்பளத்தையும், மற்றும் படிகளையும் பெற்றுக் கொடுப்பதற்கு அவர் ஏற்பாடு செய்யக் கருதியுள்ளாரா? (ஈ) ஆமெனில், இவ்வூழியருக்கு இப்பணத்தைப் பெற்றுக் கொடுக்க எவ்வளவு காலம் செல்லும்?*

asked the Minister of Agriculture and Food: (*a*) Is he aware that as intimated to the Member of Parliament for Kotmale as per letter No. 44/6/20/2 dated 12.4.69 by the Permanent Secretary to the Ministry of Agriculture and Food, no action has yet been taken in regard to the complaint made by Mr. H. B. Herath against Y. K. A. P. S. Society Ltd. (*b*) If so, for what reason has such action been stayed? (*c*) Does he propose to take action to have the salary and other allowances of this employee paid to him? (*d*) If so, how long will it take to pay this employee his dues?

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**

*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*

(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

(අ) මේ ගැන ක්‍රියා කර තිබේ. (ආ) පැන නොනගී. (ඉ) සේවක වැටුප් ගෙවීම සමිතිය සතු කරුණකි. මේ ගැන සමිතිය තීරණයක් ගෙන ඇත. (ඊ) ගෙවීමට තිබෙන්නේ ඇප මුදල පමණකි. සමිතිය විසින් ඔහුට නිකුත් කළ රිසිට් පත් ඉදිරිපත් කළ වහාම එම මුදල ගෙවනවා ඇත.

*(அ) இதுபற்றி நடவடிக்கை எடுக்கப்பட்டிருக்கிறது. (ஆ) கேள்விக்கு இடமில்லை. (இ) ஊழியருக்கு வேதனம் வழங்குவது சங்கத்தின் சொந்த விஷயம். சங்கம் இதுபற்றி ஒரு தீர்மானம் எடுத்துள்ளது. (ஈ) பிணைப் பணம் மட்டும்தான் கட்டப்படவேண்டும். சங்கத்தால் கொடுக்கப்பட்ட பற்றுச்சீட்டு சமர்ப்பிக்கப்படும் பொழுது பணம் கொடுக்கப்படும்.*

(*a*) Action has been taken regarding this. (*b*) Does not arise. (*c*) Payment of employees' wages is a matter for the society. The society has taken a decision on this. (*d*) Only the security money has to be paid. This money will be paid when the receipt given by the society is presented.

## නන්නපුරාව වි. සේ. ස. සමිතිය : සභාපති ළඟ තිබිය යුතු මුදල

நன்னபுறுவ ப. நோ. கூ. ச. தலைவரின் இருப்புக் காசு

NANNAPURAWA M.P.C.S. : CASH IN HAND OF PRESIDENT

257/69

**ආර්. එම්. ධර්මදාස බණ්ඩා මයා.** (බිබිලෙ)

*(திரு. ஆர். எம். தர்மதாச பண்டா—பிபிலை)*

(Mr. R. M. Dharmadasa Banda—Bibile)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මොනරාගල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ සීමාසහිත නන්නපුරාව විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. ධර්මදාස මයා.]

ධුරය ඩබ්ලිව්. ඒ. පී. ජයතිලක නමැති අය විසින් දරා ඇති කාලය එතුමා සඳහන් කරනවාද? (ආ) මෙම කාලය තුළදී 1959.4.7 වෙනි දින අත ඉතිරි වශයෙන් රු. 3,611.33 ක් මෙම සභාපතිවරයා ළඟ තිබිය යුතු නමුත් එදින සමුපකාර දෙපාර්තමේන්තු නිලධාරීන්ට මෙම මුදල් ඉදිරිපත් කරන ලද්දේද? (ඉ) එසේ නම් ඉදිරිපත් කරන ලද මුදල කොපමණද? නො එසේ නම්, ඒ මන්ද? (ඊ) මෙම මුදල ඉදිරිපත් නොකිරීම පිළිබඳව දෙපාර්තමේන්තුව කුමන පියවරක් මේ තාක් ගෙන තිබේද? එහි ප්‍රතිඵල මොනවාද? (උ) නොඑසේ නම්, ඒ මන්ද? (ඌ) මේ පිළිබඳව අවශ්‍ය කටයුතු කරන්නේද? එසේ නම්, ඒ කවදාද? (එ) නොඑසේ නම් ඒ මන්ද?

*விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) மொனருகலை மாவட்டத்திலுள்ள வெல்லசப் பெரும்பாக இறைவரி உத்தியோகத்தர் பிரிவிலுள்ள நன்னபுருவ பலநோக்குக் கூட்டுறவுச் சங்கம் லிட். இல் திரு. டபிள்யூ. ஏ. பி. ஜயதிலக தலைவராக இருந்த தவணையைக் குறிப்பிடுவாரா? (ஆ) இந்தக் கால எல்லைக்குள் வரும் 7.4.1959 அன்று தலைவரின் கைவசமிருக்கவேண்டிய இருப்புத்தொகை ரூ. 3,611.33 ஆக இருந்தபோதிலும், அத்தினத்தன்று இத்தொகை கூட்டுறவுப் பகுதி உத்தியோகத்தரின் முன்னிலையில் காட்டப்பட்டதா? (இ) ஆமெனில், அங்கு காட்டப்பட்ட தொகை என்ன? இல்லையெனில், ஏன்? (ஈ) இத்தொகையைக் காட்டத்தவறியமைக்காக இதுவரையில் என்ன நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது? இந்நடவடிக்கையின் பெறுபேறுகள் யாவை? (உ) இல்லையெனில், ஏன்? (ஊ) இது சம்பந்தமாக உரிய நடவடிக்கை எடுக்கப்படுமா? ஆமெனில், எப்பொழுது? (எ) இல்லையெனில், ஏன்?*

asked the Minister of Agriculture and Food: (*a*) Will he state the period during which Mr. W. A. P. Jayatilake was the President of the Nannapurawa Multi-purpose Co-operative Society Ltd., in the D.R.O's Division of Wellassa in the Moneragala District? (*b*) Although the balance in hand that should have been with the President on 7.4.1959, a date within the above period, was Rs. 3,611.33, was this amount produced before the officers of the Co-operative Department on this day? (*c*) If so, what was the amount produced? If not why? (*d*) What action has been taken so far regarding the failure to produce this sum of money? What are the results of such action? (*e*) If not, why? (*f*) Will necessary action be taken in this regard? If so, when? (*g*) If not, why?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

(අ) ඔව්. 1958. 4. 7 වැනි දින සිට 1961.11.22 දක්වා. (ආ) නැත. (ඉ) 1959.4.7 දිනට ගණන් පරීක්ෂක තැන පිළියෙල කර තිබූ අයවැය ගිණුමෙහි අතේ ඉතිරි මුදල වශයෙන් සඳහන් කරන ලද රු. 3,611.33 ක මුදල් ප්‍රමාණයක් ඉතිරි වීමට නොහැකි බවද මුදල් පොතේ සටහන් වී ඇති ගණන් නැවත වරක් පරීක්ෂා කළ යුතු බවද පරීක්ෂක තැන විසින් සකස් කළ මුදල් සහතිකයේ සභාපති මහතා විසින් ලියා ඇත. (ඊ) සමිතිය විසින් සභාපති තැනට විරුද්ධව තීරක තීන්දුවක් ඉල්ලා ඇත. එම විභාගය තවම අවසාන කර තීන්දුවක් දී නැත. (උ) පැන නොනගී. (ඌ) ඔව්. දැනටමත් ක්‍රියා කර ගෙන යනු ලැබේ. (එ) පැන නොනගී.

*(அ) ஆம். 1958.4.7 தொடக்கம் 1961.11.22 வரை. (ஆ) இல்லை. (இ) 1959.4.7 வரை தயாரிக்கப்பட்ட பற்றுக் கொடுப்பனவுக் கணக்கு ரூபா 3,611.33 மிகுதி இருப்புப் பணமாகக் காட்டியது. பரிசோதகரால் தயாரிக்கப்பட்ட பணச்சான்றிதழில் கையிருப்புப் பணமாகக் காட்டப்படும் தொகை உண்மையில் எஞ்சியுள்ள தொகையல்ல, என்ற கருத்துப்படத் தலைவர் ஒரு குறிப்பு எழுதியிருக்கிறார். ஆகவே காசுப் புத்தகத்தில் இருக்கும் கொடுக்கல் வாங்கல்களை மறு பரிசீலனை செய்தல் வேண்டும். (ஈ) சங்கம் தலைவருக்கெதிராக நடுத்தீர்வைக்கு விண்ணப்பித்துள்ளது. விசாரணை முடியாத காரணத்தால் இன்னும் ஒரு தீர்ப்பு முடிவு கொடுபடவில்லை. (உ) கேள்விக்கு இடமில்லை. (ஊ) ஆம். நடவடிக்கை ஏற்கனவே எடுக்கப்பட்டிருக்கிறது. (எ) கேள்விக்கு இடமில்லை.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(*a*) Yes. From 7.4.1958 to 22.11.1961. (*b*) No. (*c*) The receipts and payments account prepared up to 7.4.1959 showed a cash balance of Rs. 3,611.33. The president has made an endorsement on the cash certificate prepared by the inspector to the effect that the cash balance referred to is not the balance and therefore the transactions in the cash book will have to be re-examined. (*d*) The society has applied for an award against the president. No decision has been given yet as the inquiry is not yet completed. (*e*) Does not arise. (*f*) Yes. Action is already taken. (*g*) Does not arise.

**නන්නපුරාව වි. සේ. ස. සමිතිය : සභාපතිගෙන් අය විය යුතු මුදල**

*நன்னபுருவ ப. நோ. கூ. ச. : தலைவருக்குச் சேரவேண்டிய பணம்*

**NANNAPURAWA M.P.C.S. : MONEYS DUE FROM PRESIDENT**

**258/69**

**ධර්මදාස බණ්ඩා මයා.**

*(திரு. தர்மதாச பண்டா)*

(Mr. Dharmadasa Banda)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) සීමාසහිත නන්නපුරාව විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති ධුරය ඩබ්ලිව්. ඒ. පී. ජයතිලක නැමැති අය දරමින් සිටියදී 1961.4.1 සිට 1962. 3. 31 දක්වා ගණන් පරීක්ෂණයක් කරන ලද්දේද? (ආ) මෙම ගණන් පරීක්ෂක වාර්තාව අනුව සභාපති වන ඩබ්ලිව්. ඒ. පී. ජයතිලක මහතාගෙන් මුදල් අඩුවක් හෝ වංචාවක් ලෙස රු. 16,436.96 ක මුදලක් අයවිය යුතුව ඇති බව වාර්තාවේ සඳහන් වී තිබේද ? (ඉ) මෙම මුදල් මොහුගෙන් අය කර ගැනීමට දෙපාර්තමේන්තුව මෙතෙක් ක්‍රියාකර තිබේද ? (ඊ) එසේ නම්, ඒ පිළිබඳව විස්තර එතුමා ඉදිරිපත් කරන්නේද ? නො එසේ නම්, ඒ මන්ද ? (උ) මෙම මුදල අයකර ගැනීමට කටයුතු කරන්නේද ? එසේ නම්, ඒ කවදාද ? නොඑසේ නම්, ඒ මන්ද ? (ඌ) මෙම ප්‍රමාදය පිළිබඳව එතුමා සෑහීමකට පත්වන්නේද ?

*விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா : (அ) 1.4.1961 இற்கும் 31.3.1962 இற்கு மிடையில் திரு. டபிள்யூ. ஏ. பி. ஜயதிலக நன்னபுருவ பலநோக்குக் கூட்டுறவுச் சங்கம் லிட். இன் தலைவராக இருந்த காலத்தில் ஒரு தலத்திலான கணக்குப் பரிசோதனை செய்யப் பட்டதா ? (ஆ) தலைவர் திரு. டபிள்யூ. ஏ. பி. ஜயதிலகவிடமிருந்து கையிருப்புக் குறைவு அல்லது மோசடி காரணமாக ரூ. 16,436.96 அறவிட வேண்டியிருந்ததாக கணக்குப் பரி சோதனை அறிக்கை கூறுகிறதா ? (இ) இத் தொகையை அவரிடமிருந்து அறவிட திணைக் களம் இதுவரையில் நடவடிக்கை எடுத்துள் ளதா ? (ஈ) ஆமெனில், அப்படியான நட வடிக்கைகளின் விபரங்களைத் தருவாரா ? இல்லையெனில், ஏன் ? (உ) இத்தொகையை அறவிட அவர் நடவடிக்கை எடுப்பாரா ? ஆமெனில், எப்பொழுது ? இல்லையெனில், ஏன் ? (ஊ) இத்தாமதம் நியாயமானது என்று அவர் திருப்திப்பட்டுள்ளாரா ?*

asked the Minister of Agriculture and Food : (*a*) Was an audit inspection carried out during the period 1.4.1961 to 31.3.1962 when Mr. W. A. P. Jayatilake was the President of the Nannapurawa Multi-purpose Co-operative Society Ltd. ? (*b*) Does the audit report state that a sum of Rs. 16,436.96 is due to be recovered from the President, Mr. W. A. P. Jayatilake on account of a cash shortage or fraud ? (*c*) Has the Department taken action so far to recover this sum of money from him ? (*d*) If so, will he give details of such action ? If not why ? (*e*) Will he take steps to recover this amount ? If so when ? If not, why ? (*f*) Is he satisfied that this delay is justifiable ?

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

(අ) ඔව්. (ආ) ගණන් පරීක්ෂණ වාර්තාව අනුව මොහුගෙන් රු. 16,530.96 ක් අය වීමට තිබේ. (ඉ) ඔව්. (ඊ) සමිතිය විසින් තීරක තීන්දුවක් ඉල්ලා ඇත. (උ) ඔව්. (ඊ) ප්‍රශ්නයට දී තිබෙන පිළිතුර බලන්න. (ඌ) ඔව්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

(அ) ஆம். (ஆ) என்பார்வை அறிக்கையின் படி ரூபா 16.530.96 சதம் இவரிடமிருந்து வருமதியாகவுள்ளது. (இ) ஆம். (ஈ) சங்கம் நடுத்தீர்வைக்கு விண்ணப்பித்துள்ளது. (உ) ஆம். பதில் (ஈ) இல் காண்க. (ஊ) ஆம்.

(a) Yes. (b) According to the audit report Rs. 16,530.96 is due from him. (c) Yes. (d) The society has applied for an award. (e) Yes. Vide reply to question (d) above. (f) Yes.

## ලුනුගල වි. සේ. ස. සමිතිය : සභාපති

## லுனுகல ப. நோ. கூ. ச. தலைவர்

## LUNUGALA M.P.C.S. : PRESIDENT

**260/69**

**ධර්මදාස බණ්ඩා මයා.** —

(திரு. தர்மதாச பண்டா)

(Mr. Dharmadasa Banda)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) බදුල්ල දිස්ත්‍රික්කයේ සීමාසහිත ලුනුගල විවිධ සේවා සමුපකාර සමිතියේ දැනට සභාපති වරයා කවුද? (ආ) මෙම සභාපතිවරයාම 1959 සිට 1963 දක්වා සීමාසහිත නන්නපුරාව විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති වශයෙන් කටයුතු කළේද? (ඉ) මෙම සභාපතිවරයා සීමාසහිත නන්නපුරාව විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති ධුරය දැරූ අවධියේ රු. 16,436.96 ක මුදල් අඩුවක් හෝ වංචාවක් පිළිබඳව 1961.4.1-62.3.31 වන දින දක්වා ගණන් පරීක්ෂණ වාර්තා වෙන් එළිදරව් වී ඇති බවත් එම මුදලට සම්පූර්ණ වගකිවයුත්තා මෙම පුද්ගලයා බවත් එතුමා දන්නවාද? (ඊ) මෙම පුද්ගලයාම දැනට තවත් සමිතියක සභාපති ධුරය දැරීම සාධාරණ හා අතුරු ව්‍යවස්ථානුකූල බව සමුපකාර කොමසාරිස් තුමා අනුමත කර තිබේද? එසේ නම්, ඒ කවදාද? (උ) මෙය ව්‍යවස්ථාවන්ට සහ ආඥාපනතට පටහැනි බව එතුමා දන්නේද? නො එසේ නම්, ඒ මන්ද? (ඌ) මෙම අය ඉහත සඳහන් සමිතියේ සභාපති ධුරයෙන් නෙරපීමට කටයුතු කිරීමට හේතු තිබියදීත් එසේ නොකරනු යේ මන්ද? (එ) මෙම තැනැත්තා නෙරපීමට කටයුතු කරන්නේද? එසේ නම්, ඒ කවදාද? නොඑසේ නම්, ඒ මන්ද? (ඒ) මේ ක්‍රියාවේදී දෙපාර්ත මේන්තුව ගත් පියවර පිළිබඳව එතුමා සෑහීමකට පත්වන්නේද?

விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) பதுளை மாவட்டத்திலுள்ள லுனுகல பல நோக்குக் கூட்டுறவுச் சங்கம் லிட். இல் இப் பொழுது தலைவர் பதவியை வகிப்பவர் யார்? (ஆ) இவர் 1959 இலிருந்து 1963 வரையான காலத்தில் நன்னபுருவ பலநோக்குக் கூட்டுற வுச் சங்கம் லிட். இன் தலைவர் பதவியை வகித்தவரா? (இ) இவர் தலைவர் பதவியை வகித்த காலத்தில் அந்தச் சங்கத்தின் நிதிக ளில் ரூ. 16,436.96 குறைபாடாக இருந்ததாக வும் அல்லது மோசடி செய்யப்பட்டதாகவும், இவரே அதற்குப் பொறுப்பாளியென்றும் நன்னபுருவ பலநோக்குக் கூட்டுறவுச் சங்கத் தின் 1.4.61 முதல் 31.3.62 வரைக்கான காலத் திற்குரிய கணக்குப் பரிசோதனை அறிக்கை எடுத்துக் காட்டுகிறதென்பதை அவர் அறி வாரா? (ஈ) மற்றொரு சங்கத்தில் தலைவர் பத வியை வகிக்கும் இவர் இப்பதவியை வகிப்பது நியாயமானதும், உரிய விதிகளுக்கமைவது மாகுமென்று கூட்டுறவு அபிவிருத்தி ஆணை யாளர் தமது அங்கீகாரத்தை வழங்கியிருக்கி றாரா? ஆமெனில், இப்படியான அங்கீகாரம் வழங்கப்பட்ட தேதி யென்ன? (உ) இவர் தற்போதைய பதவியை வகித்தல் சம்பந்தப் பட்ட விதிகளுக்கும் சட்டத்திற்கும் எதிரா னது என்பதை அவர் அறிவாரா? இல்லையெ னில், ஏன்? (ஊ) அவரைத் தலைவர் பதவியி லிருந்து அகற்றுவதற்கு உரிய காரணங் களுள்ள போதிலும் அவர் ஏன் அகற்றப்பட வில்லை? (எ) அவரை இந்தப் பதவியிலிருந்து அகற்ற நடவடிக்கை எடுக்கப்படுமா? ஆமெனில், எப்போது? இல்லையெனில் ஏன்? இவ்விஷயஞ் சம்பந்தமாக திணைக்களத்தின் நடத்தை பற்றி அவர் திருப்தி கொண்டுள் ளாரா?

asked the Minister of Agriculture and Food: (a) Who holds the post of president at present in the Lunugala Multi-purpose Co-operative Society Limited in the Badulla District? (b) Did this individual hold the post of President in the Nannapurawa Multipurpose Co-operative Society Limited during the period

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලිඛිත පිළිතුරු

1959 to 1963 ? (*c*) Is he aware that the audit report of the Nannapurawa Multi-purpose Co-operative Society for the period 1.4.61 to 31.3.62 reveals that there has been a shortage or fraud amounting to Rs. 16,436.96 in the funds of that society during the period when the aforesaid individual held the post of President and that it is this individual who was wholly responsible for the shortage or fraud ? (*d*) Has the Commissioner of Co-operative Development given his approval to this same individual holding the post of President in another Society, as being both just and in conformity with the relevant regulations ? If so, on what date was such approval given ? (*e*) Is he aware that it is against the relevant regulations and the ordinance for this individual to hold his present post ? If not, why ? (*f*) Why has he not been removed from the post of President, although there are grounds for his removal ? (*g*) Will action be taken to remove him from this post ? If so, when ? If not, why ? (*h*) Is he satisfied with the conduct of the Department in this matter ?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

(අ) ඩබ්ලිව්. ඒ. පී. ජයතිලක මහතා. (ආ) ඔව්. 58.4.7 දින සිට 61.11.22 දින දක්වා. (ඉ) 60.4.1 වැනි දින සිට 62.3.31 වැනි දින දක්වා කාලය සඳහා නන්නපුරාව වි.සේ.ස. සමිතියේ ගණන් පරීක්ෂණ වාර්තාවෙහි රු. 16,530.46ක මුදලක් ඩබ්ලිව්. ඒ. පී. ජයතිලක මහතාගෙන් අයවිය යුතු බව සඳහන්ව ඇත. කෙසේ වෙතත්, එම මුදලට ඔහු වගකිවයුතු නොවන බව ජයතිලක මහතා ප්‍රකාශ කර ඇති හෙයින් මෙම ආරාවුල පිළිබඳව සමුපකාර සමිති ආඥාපනතේ 53 වැනි ඡේදය යටතේ තීරක තීන්දුවක් ඉල්ලා ඇත. (ඊ) නැත. කෙසේ වෙතත්, බිබිලේ සමුපකාර සංවර්ධන උප කොමසාරිස් විසින් එවා ඇති ලිපියකට පිළිතුරු වශයෙන් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් අදාළ අතුරු ව්‍යවස්ථාව පැහැදිලි කරමින් 66.12.14 වැනි දින යවන ලද ලිපියෙන්, සාමාජිකයෙකුට කාරක සභිකයෙකු ලෙස පත්වීමේ හෝ තනතුරක් ඉසිලීමේ හෝ අයිතිවාසිකම් අහිමි වන්නේ ඔහු විසින් සමිතියකට කිසියම් මුදලක් ගෙවිය යුතුව ඇති බවට තීරකයෙකු විසින් නියම කරනු ලැබුවහොත් පමණක්ය යන බව දන්වා ඇත. (උ) නැත. නන්නපුරාව සමිතියට කිසිම මුදලක් තමාගෙන් අයවීමට නැති බව ජයතිලක මහතා ප්‍රකාශකර ඇති නිසාත්, මෙම ආරාවුල දැනට තීරක වරයකු ඉදිරියේ විභාග වන නිසාත් ජයතිලක මහතාට ලුනුගල සමිතියේ සභාපති ලෙස කටයුතු කරගෙන යාමට හැකිය. (ඌ) පැන නොනගී. (එ) පැන නොනගී. (ඒ) ඔව්.

*(அ) திரு. டபிள்யூ. ஏ. பி. ஜெயதிலகா. (ஆ) ஆம். 1958.4.7 ஆந் தேதி முதல் 1961.11.22 ந் தேதி வரை. (இ) நன்னபுருவ ப. நோ. கூ. சங்கத்தின் 60.4.1 முதல், 62.3.31 வரையிலான கணக்குப் பரிசோதனை அறிக்கையின் பிரகாரம் ரூபா 16,530.16 திரு. ஜெயதிலகாவிடம் இருந்து சங்கத்திற்கு வருமதியாகக் காட்டப்பட்டுள்ளது. இருந்தும் திரு. ஜெயதிலகா இத்தொகையைத் தான் செலுத்த வேண்டிய பொறுப்பாளி என்பதை எற்றுக் கொள்ளாதபடியினால் மேற்படி பிணக்கு கூட்டுறவு சங்கக் கட்டளைச் சட்டம் 53 ஆம் பிரிவின் கீழ் நடுத் தீர்ப்புக்கு விடப்பட்டுள்ளது. (ஈ) இல்லை. இருந்தும் கூட்டுறவு அபிவிருத்தி ஆணையாளர், பிபிலை கூட்டுறவு அபிவிருத்தி உப ஆணையாளரிடம் இருந்து கிடைத்த கடிதத்திற்கு 1966.12.14 இல் பதிவிறுக்கையில் பொருத்தமான உப விதிபற்றி விளக்கம் கொடுத்து ஒரு அங்கத்தவர் நிர்வாகக் குழுவில் சேர்வதற்கோ அல்லது அதில் அங்கம் வகிப்பதற்கோ நடுத்தீர்வையாளர் மேற்படி தொகையை சங்கத்திற்கு செலுத்த வேண்டும் என நிச்சயிக்குமிடத்தில்தான் அருகதையற்றவர் என்பதை அறிவித்துள்ளார். (உ) இல்லை. திரு. ஜெயதிலகா நன்னபுருவ ப. நோ. கூட்டுறவுச் சங்கத்திற்கு ஒருவித பணமும் கொடுக்க வேண்டியதில்லை என்று விளக்கினாலும் இத்தகராறு நடுத்தீர்ப்புக்கு விடப்பட்டு இருப்பதினாலும் லுனுகலை சங்கத்தின் தலைவராக அவர் தொடர்ந்து இருப்பதற்கு அருகதை உடையவராவர். (ஊ) எழவில்லை. (எ) எழவில்லை. (ஏ) ஆம்.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

(*a*) Mr. W. A. P. Jayatilake. (*b*) Yes. From 7.4.58 to 22.11.61. (*c*) The audit report of the Nannapurawa M.P.C.S. for the period 1.4.60 to 31.3.62 records that a sum of Rs. 16,530.46 is due to the society from Mr. W. A. P. Jayatillaka. However, as Mr. Jayatillake has disclaimed liability for this amount, this dispute has been referred for arbitration under Section 53 of the Co-operative Societies Ordinance. (*d*) No. However, the Commissioner of Co-operative Development in reply to a letter addressed to him by the Assistant Commissioner at Bibile clarifying the relevant by-law had written to him on 14.12.66 that a member forfeits his right to hold office or enter the committee of a society only if an arbitrator holds him liable to pay some amount to a society. (*e*) No. Mr. Jayatillake is entitled to continue as President of the Lunugala Society as he had disputed that any money is due from him to the Nannapurawa Society and that matter is still under arbitration. (*f*) Does not arise. (*g*) Does not arise. (*h*) Yes.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපැලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியையடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00), 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions: 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org